FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER

FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

ශ්‍රී.බු.ව. 2565- ක්‍රි.ව. 2021
අගෝස්තු (නිකිණි)

මාසික බෞද්ධ සාර සංග්‍රහය ~ අන්තර්ජාල කලාපය

33



රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

RSL TELEVISION

රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
දේශයේ රන් හඬ

RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk

රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# නිකිණි පෝය වර්ණනාව

ගෞතම සම්බුද්ධ ශාසනයේ ඉතා වැදගත් සිදුවීම් රාශියක් සනිටුහන් වී ඇති පොහොයක් ලෙස නිකිණි පොහොය හඳුන්වාදීමට පුළුවන. සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවීමෙන් පසු මහළුකළ පැවිදි වූ සිටි සුභද්‍ර නම් භික්ෂුවක් සංඝයා වහන්සේලා වෙත පැමිණ සිදුකරන ලද ප්‍රකාශය මෙසේය. (අලං ආවුසො, මා සොචිත්ත, මා පරිදෙවිත්ත සුමුත්තාමයං තෙන මහා සමණෙන) බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් හඬා වැළපුනු ප්‍රතජ්ජන භික්ෂූන් වෙතට පැමිණ සිදු කරන ලද මෙම පව්ටු ප්‍රකාශයෙන් භික්ෂූන් අතර නොසන්සුන්තාවයක් ඇති විය.

මේ නිසා ශාසන භාරධාරීව සිටි මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ධර්‍ම, විනය, සංඝායනාවක් සිදු කිරීම මැනවයි සිතා එය රාජ්‍ය පාලකයා වූ අජාසත් රජුට දන්වා සිටියේය.රජුගේ අනුග්‍රහය ලබාගෙන රහතන් වහන්සේලා පන්සියයක් රැස්කොට පළමු ධර්‍ම සංඝායනාව පැවැත් වූයේ නිකිණි පොහෝ දිනකය. ධර්‍ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන් වහන්සේ  රහත් බව ලබාගත්තේ ද මෙම දිනයේ දීය. පෙරවස් සමාදන්වීමට අවස්ථාව නොලැබූ උපසපන් භික්ෂූන් වහන්සේලාට පසුවස් සමාදන්වීමට අවස්ථාව උදාවූයේද මෙම පොහෝ දිනයයේදීය.

ඓතිහාසික සෙංකඩගලපුරයේ දළඳා මහා පෙරහැර ආරම්භ වන්නේද නිකිණි පෝය මූලික කරගෙනය. ලංකාවේ රජමහා විහාරස්ථාන කේන්ද්‍ර කරගෙන විවිධ පිංකම් මෙම පොහොය මූලික කරගෙන සිදුවීමද ඉතා වැදගත්ය.(වර්‍තමානයේ පවතින රෝගබිය නිසා සිදු නොවේ.) ආමිස මෙන්ම ප්‍රතිපත්ති පූජාවන් නිවසේදීම සිදුකිරීමද වර්‍තමානයේ දක්නට ලැබෙන විශේෂත්වයකි.

**ඇම්.ඩී.විජයවර්ධන**

---

**පුදබිමක අසිරිය**

# රාජගිරි ලෙන් විහාරය

අනුරාධපුර රාජධානියට අයත් ''රාජගිරි'' ලෙන් විහාරය දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන පුදබිමකි. මෙම ලෙන් විහාරය පිහිටා ඇත්තේ මිහින්තලා පව්ව සමීපයෙහිය. මිහින්තලේ ''කළුදිය'' පොකුණ ආසන්නයේ පිහිටි ගල්පර්‍වතයකින් ගැවසීගත් මෙම ''රාජගිරි'' ලෙන් විහාරය ''භාරහාර'' ඔප්පු කිරීම සඳහා යොදාගෙන ඇති බව ජනප්‍රවාදවල සඳහන් වෙයි.අනුරාධපුර රාජධානියේ රජකළ රජවරු මෙම ස්ථානයට පැමිණ භාරහාර ඔප්පු කිරීමට මෙම පුදබිම යොදාගත් නිසා ''රාජගිරි'' ලෙන යන නාමය යෙදී ඇති බව පුරා විද්‍යාඥයින්ගේ පිළිගැනීමයි. අනුරාධපුර රාජධානියේ රජකළ හතරවෙනි මිහිදු රජුගේ මිහින්තලා පුවරු ලිපියේ සඳහන්වන ''ලිහිණිය පව්ව'' මෙම රාජගිරි ලෙන බව පුරාවිද්‍යා ගවේෂකයන්ගේ මතයයි. අතීතයේ මෙම පුදබිම රමණීය විහාරස්ථානයක් ලෙසින් පැවතුණි. මෙහි අරණ්‍යවාසි භික්ෂූන් වහන්සේලා විදසුන් වැඩීම සඳහා භාවිතයට ගෙන තිබේ.මෙම ලෙන්වල කොටා ඇති ආදි බ්‍රාහ්මී අක්ෂර සහිත ලිපිවලින් ඒ බව සනාථ වෙයි. මෙම ලෙන්ලිපි පරීක්ෂාකළ සෙනරත් පරණවිතානශූරීන්  පවසන්නේ මහායාන ''ධර්‍මරුචි'' භික්ෂූන් වහන්සේලාගේ මූලස්ථානයක් වශයෙන් පැවැති බවයි. මෙම ස්ථානයට අභයගිරි විහාර පරම්පරාවට අයිති වන බවත්, පුරාවිද්‍යා ගවේෂකයින්ගේ මතයයි.



මෙම පුදබිමට ඇතුල්වීමේදී මුලින්ම හමුවන්නේ අලංකාර පියගැට පෙළකි. ඒ අසළ පොකුණක් ද, දාගැබක් ද පිහිටා තිබේ.මෙම ලෙන් විහාරය දිගින් අඩි සියයක් පමණවේ. මෙම ලෙනට පියස්සක් සවිකර තිබූ බවට සාධක හමුවී තිබේ. මෙම ස්ථානයට පැමිණ භාරහාර වී ඒවා සඵලවීමෙන් සතුටුව සිදුකරන ලද ප්‍රදානයන් ගැන විස්තර සහිත සෙල්ලිපි කිහිපයක් දක්නට ලැබේ.මෙම විහාරය වටේට ගඩොලින් බඳින ලද බිත්ති ද වාහල්කඩක් ද හමු වූ බව ඉතිහාසඥයින් පවසයි.ලෙන් විහාරය ඇතුළත ගඩොලින් බිත්ති බැඳ වෙන්කර ඇති කොටසේ බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කර තිබූ බව පෙන්නුම් කරන ආසනයක සාධක හමු වි තිබේ.මෙම බුද්ධ ප්‍රතිමාවට (සැතපෙන) අමතරව කුඩා ප්‍රතිමාවන්ද තැන්පත් කර තිබූ බවත්, ඒවා මේ වනවිට විනාශ වී ඇති බවත්, ගවේශකයන් පවසති. මෙම පර්‍වත මුදුනෙහි කුඩා ප්‍රමාණයේ ස්ථූපයක් සාද තිබූ බවට නටඹුන් හමු වී තිබේ. වර්‍තමානයේ මෙම ස්ථානය නටඹුන් වලින් යුක්ත ස්ථානයකි. ජනතාවගේ අවධානයට යොමු නොවූ තැනක් වුවද මෙහි ඇති ඓතිහාසික වටිනාකම අතින් අනෙකුත් ස්ථාන හා සමාන වේ. මෙවැනි වැදගත් පූජනීය ස්ථාන දැක වැද පුදාගැනීමත්, ඒවා මතු පරපුර සඳහා ආරක්ෂා කිරීමත් බෞද්ධ ජනතාවගේ පරම යුතුකම වන්නේය.

**විජය තලවත්තේගෙදර**

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER



# හෙළදිව දෙවොල් පෙරහැර

ඇසළ මාසය ගැනත් ඇසළ පෙරහැර ගැනත් කරුණු පිරික්සීමේදී විද්වතුන් විවිධ ආකාරයේ මති මතාන්තර ඉදිරිපත්කර ඇත. පෙරහැර යන්නෙහි අර්ථය පරිහාරය නැතහොත් සත්කාරය හෝ පිරිවර යන්නයි. විශේෂයෙන් කරනු ලබන පූජාවටද පෙරහැර යන නාමය ව්‍යවහාර වේ.

මේ අනුව දළදා වහන්සේ උදෙසා හෝ ඒ ඒ දේවාල වල දෙවිවරුන් උදෙසා ඇසළ මාසයේදි විශේෂයෙන් කරනු ලබන සත්කාරය සහ පුද පූජා ආදිය පෙරහැර යන්නෙන් අර්ථවත්වන බව පෙන්වා දිය හැක. ශ්‍රී ලංකාවේ පෙරහැර ප්‍රාග් ඓතිහාසික යුගයට නැකම් කියන අතර වසර 30000ක් හෝ 40000ක කාලවකවානුවකට අයත් වන චිරාගත වත්පිළිවෙත් අනුගමනය කළ පුද පූජා ක්‍රමයක් විය හැකියයි අනුමාන කෙරේ.

මුලදී ඉතාමත් සරළ ආකාරයෙන් ආරම්භ වී වසර සියදහස් ගණනක් නොයෙකුත් වෙනස්කම් වලට භාජනය වි අද අප දකින ආකාරයට ඇසළ පෙරහැර සංවර්ධනය වී ඇතිබව සිතාගත හැක.

ඇසළ මාසය දෙවියන් උදෙසා විශේෂයෙන් ම දේවාලයන්හි පවත්වනු ලබන උත්සවයන් වර්තමානයේදීද ඇසළ උත්සව නාමයෙන් හඳුන්වා දී ඇත. අතීතයේදී ආෂාඨ උත්සව ලෙස නම් කෙරුණි. එය ආසල්හ යැයි පාලි භාෂාවෙන් හැඳින්වෙන අතර ශ්‍රී ලංකාවේ පැරණිම බ්‍රාහ්මී ලිපිවල එය අසඩ ලෙස යෙදී ඇත.

නැකැත් අනුගමනය කරමින් පවත්වනු ලබන මෙම උත්සවය පූර්ව ආෂාඨ (පුවසළ) සහ උත්තර ආෂාඨ (උතුරුසළ) යැයි නක්ෂත්‍රකරුවෝ දක්වති. මෙම නැකැත් දෙකකින් එකකට චන්ද්‍රයාගේ පැමිණීමත් සමඟ පුර පසළොස්වක පොහොය යෙදෙන මාසය ඇසළ මාසය ලෙස නම් කිරීම සම්ප්‍රදාය විය.

ශ්‍රී ලංකාවට බුදුදහම පැමිණීමට පෙර පොසොන් මාසයේදි දියකෙළි (ජලක්‍රීඩා) උත්සවයක් හා දඩකෙළි (සතුන් දඩයම් කිරිම) උත්සවයක් පැවැත්වුණු බව මහාවංශයේ සඳහන් වේ. මේ උත්සවයට රජු හා සියලුම ප්‍රභූන් සහභාගී වී ඇත. මෙම දියකෙළි උත්සවය වැස්ස වලාහක දෙවිඳුන් සඳහා ද (පොදොනා හෙවත් පර්ජන්‍ය) දඩකෙළිය, ව්‍යාධ දෙවතාවා සඳහාද පවත්වනු ලැබූවක් විය.

ඉහත සඳහන් කළ ආකාරයට ව්‍යාධ දෙවි දඩයමට අධිපති දෙවිඳු ලෙස ප්‍රකට වී සිටි අතර පොදොනා හෙවත් පර්ජන්‍ය දෙවි කෘෂිකර්මයට ජීවනෝපාය කරගත් සමාජයක වර්ෂාව ලබාදෙන දෙවිඳු වශයෙන් සළකන ලදී. එම දෙවිඳුන්ට උපහාර පිණිස ඇසළ පෙරහැර පවත්වා ඇත.

(The People held the water festival when the tanks were full as a thanks giving to Parjanya for the rains they have had) (Journal of the Ceylon Branch of the Royal Asiatic Society - P97)

ඇසළ මාසයේ දේවාලවල පවත්වන උත්සව අවසානයේදී දියකැපීම නමින් චාරිත්‍රයක් ඉටු කෙරේ. එය වර්ෂාව ලබාගැනීම සඳහා කරන ලද පූජා කර්මයක් විය.

(The water - cutting at the end of the perahara. is the most important event in the series)

ඉන්දු දෙවිදුන් වළාකුළුවලට සිය වජ්‍රා යුධයෙන් පහරදී වැස්ස ලබාදුන් ආකාරය පැරණි වේද ග්‍රන්ථවල සඳහන් වේ. එනිසා ඇසළ උත්සවය ගොවිතැන සඳහා උපකාර කළ දෙවිඳුන්ට පුද පූජා පැවැත්වීමට යොදාගන්නා ලද්දක් බව පෙනේ.

ලංකාවේ වෙසක් පොසොන්, ඇසළ, නිකිණි, යන මාස වර්ෂාව අඩු වියළි කාලගුණයක් පවතින අතර දීර්ඝ නියඟයක්ද බොහෝ විට දක්නට ලැබේ. ඒ නිසා මෙම නියං සමයේ දී ගොවිතැනේ සශ්‍රීකත්වය උදෙසා බෙහෙවින් අවශ්‍ය වර්ෂාව ලබාගැනීම සඳහා ඇසළ උත්සවය සංවිධානය කළ බවට තොරතුරු ලැබේ.

විශේෂයෙන් අනුරාධපුර හා අවට ප්‍රදේශවල ජනයා තිසා වැවෙන් ජලය රැගෙන ගොස් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට වත්කොට එම බෝධීන් වහන්සේට අධිගෘහිත කළු දේවතා බණ්ඩාර දෙවිඳු සතුටු කොට වර්ෂාව ඉල්ලා සිටීමේ චාරිත්‍රයක් පැවතුණි.

(Even to this day people of Anuradhapura and the surrounding districts believe that the sacred Bodhi tree can bring down rain and when the dry season is prolonged and rains are delaged water is taken from the Tissa- vava in procession and poured at the roots of the Bodhi and sprinkled at it, and by this they expect the rains to come down) (Journal of the Ceylon Branch of the ROYAL ASIATIC SOCIETY - P 105)

ඇතැම් අවස්ථාවල ධර්මිෂ්ට රජවරු පෙහෙවස් කොට වර්ෂාව ලබාදුන් බව සිරිසඟබෝ රජුගේ ජීවිත කතාවෙන් පෙනී යයි. දළඳා පෙරහැරක් පළමුවෙන් ම පවත් වන ලද්දේ අනුරාධපුරයේ දී බව චීන ජාතික පාහියන් භික්ෂුවගේ දේශාටක වාර්තාවේ දක්වා ඇත.

එසේම පළමුවන ගජබාහු රජුගේ කාලයේදී සොළී රට ජයගැනීම සිහිපත් කරමින් මේ උත්සවයට යුධ ජයග්‍රහණ සිහි කිරීමේ මුහුණුවරක්ද එකතුවී ඇත.

මේ සියලු අංග එකතු වී පසු කාලයේදී දළදා පෙරහැර සකස් වී ඇති බැව් පෙනේ. සෙන්කඩගල හෙවත් මහනුවරට ශ්‍රී දළදා වහන්සේ වැඩමවන ලද්දේ දෙල්ගමු විහාරයේ සිටය. ක්‍රි.ව 1592 දී උඩරට රාජ්‍යත්වයට පත්වූ පළවන විමලධර්ම සූරිය රජු විසින් සිතාවක දියවඩන නිළමේ වූ හිරිපිටියේ ඒකනායක රාල, දෙවනගල රතනාලංකාර හිමි, හා ගලඋඩ හිමි යන අයගේ උදව් උපකාර ඇතිව දෙල්ගමු විහාරයේ සිට ඌව පාරෙන් දළදා හිමි මහනුවරට වැඩම වන ලදී.

දළදා පූවත් නම් ග්‍රන්ථයේ සඳහන් ආකාරයට පළමු වන විමල ධර්මසූරිය රජු සෙංකඩගල පුරය සරසා ඇමතිවරුන් සමඟ අම්පිටියට ගොස් දළදා වහන්සේ මහත් හරසරින් පිළිගෙන මහනුවරට

කෘෂි කර්මාන්තයේ සශ්‍රීකත්වය පතා වර්ෂාව ලබා ගැනීමේ පරමාර්ථයෙන් දෙවියන් සතුටු කිරීම මෙහිදී අපේක්ෂා කළ නමුදු ලක්දිවට පැමිණි මුල්ම ආර්ය ජනයා විසින් නැකැත් කෙළිය නම් අභිචාර අංගද මෙම උත්සවයට ඇතුලත් කරන ලදී. බුදුසමය ලංකාවට පැමිණීමෙන් පසු මෙම දුරාචාර අංග ඉවත්වී ගොස් බෞද්ධ මුහුණුවරක් ගන්නා ලදී.

වැඩමවා තැන්පත් කිරීමට දළදා මැඳුරක් නොතිබුණු නිසා ටික කලක් අස්ගිරි ආදාහන මළුව ගෙඩිගේ විහාරයට වැඩමවා එහි තැන්පත් කොට පුද සත්කාර කරන ලදී. මේ සිද්ධිය සිහිකිරීම පිණිස වර්තමානයේදීද දිය කපන දා රාත්‍රියෙහි අස්ගිරිය, ගෙඩිගේ විහාරයේ දළදා හිමි තැන්පත් කර තැබිණි. අනතුරුව දළදා හිමිට වැඩ සිටීම සඳහා පළමුවන විමලධර්ම රජු විසින් ඉතා කඩිනමින් දෙමහල් දළදා මැඳුරක් ද පසුව එය තුන් මහල් මැඳුරක් ලෙසද කරවන ලදී.

මෙසේ දෙවිවරුන් උදෙසා පැවැත්වූ ඇසළ පෙරහැර වැළිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමිගේ උපදෙස් පිට කීර්ති ශ්‍රී රාංසිංහ (1742 - 1782) රජු විසින් දළදා පෙරහැරක් බවට පත්කිරීමට කටයුතු කරන ලදී. එවක් පටන් දළදා පෙරහැර ප්‍රධාන පෙරහැර වූ අතර නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි, යන දේවාල වල පෙරහැර හතර ද දළදා පෙරහැරට එකතු විය.

මුල් යුගයේදී පෙරහැරට පසුපසින් රජතුමා අසකු පිට නැගී ගමන් කිරීමේ චාරිත්‍රයක් පැවැත්විණි. ඊට පිටුපසින් උඩරට ප්‍රධානීන් තම භාර්යාවන් සමඟ වස්ත්‍රාභරණ වලින් සැරසී පෙරහැරේ ගමන් කළ අතර භික්ෂුන් වහන්සේලා ද මල්වට්ටි රැගෙන පෙරහැරේ ගමන් ගත් බව සඳහන් වේ.

**විශ්‍රාමික සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ ඩී.එම්.එච්. කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පලකෙරේ.**

බහුං වේ සරණං යන්ති
පබ්බතානි වනානි ච
ආරාම රුක්ඛ චේත්‍යානි
මනුස්සා භය තජ්ජිතා

බෞද්ධයාගේ අත්පොත වන උතුම් ධම්මපදයේ බුද්ධ වග්ගයේ සඳහන් වන ඉහත ගාථාව මගින් පැහැදිළි වනුයේ බියෙන් තැතිගත් මිනිස්සු පර්වත, කැලෑ, ආරාම, ගස්, චෛත්‍ය යන මේ දේ බොහෝ සෙයින් සරණ යති යන්නයි.

මේ නයින් බලන කළ සමස්ථ ජීවී සමාජයේ පොදු අවශ්‍යතාවය මත එදා සිට මේ දක්වා විවිධ පුද පූජා ආගමික විශ්වාස ඇදහිලි ජනතාවට සමීප වී ඇත. එය මුළු මහත් විශ්වයටම සාධාරණ වූ කාරණයකි. එනම් මිනිසාගේ සැක බිය දුරු කිරීම සඳහා ලොව පහළ වී තිබුණු විවිධ ස්වාභාවික වස්තූන් දේවත්වයෙන් සළකා පුද පූජා පැවැත්වූ බවයි. එමගින් විවිධ ආගමික විශ්වාස ඇදහිලි සමාජයට සම්ප්‍රාප්ත වී ඇත.

යුගයයි. මෙකළ ලොව මැවූ දෙවියෙක් පිළිබඳ විශ්වාස නොකරයි. කිසිවක් කිසිවෙකුගේ කැමැත්ත මත සිදු නොවේ. හේතුඵල දහම අනුව සියල්ල සිදුවේ.
යෙ බ්‍රාහ්මණා බාහිත පාප ධම්මා පව් බැහැර කළ හෙයින් බ්‍රාහ්මණ නම් වේ.
ඛෙත්තානං අධිපතිති ඛත්තියො - කෙත්වතු වලට අධිපති වූ හෙයින් ක්ෂත්‍රිය නම්වේ.
අත්තාහි අත්තනො නාතො
කොහිනාතො පරොසියා

තමාට තමා හැර වෙන පිහිටක් සරණක් නැත. යනුවෙන් බුදුරදුන් ලොවට සත්‍ය දේශනා කරන්නට ය.

ඒකදේව වාදි යුගයේ සිට පැවත එන බ්‍රාහ්මණ චින්තන හා ශ්‍රමණ චින්තනය තුළ භාරතීය සමාජයේ විවිධ පුදපූජා රාශියක් පහළ වන්නට විය. ඒවා පොදුවේ යාගහෝම (යාඥා) නමින් හඳුන්වයි. එය ප්‍රධාන කොටස් දෙකකි.
1. හිංසක යාඥා
2. අහිංසක යාඥා

බමුණු හා ශ්‍රමණ සංස්කෘතිය තුළ හිංසක යාඥා ප්‍රධාන වශයෙන් පැවති අතර අහිංසක යාඥා බුදුදහමේ පදනම් කරගෙන ක්‍රියාත්මක විය.

බහුලව සිදුවී ඇත.

බුදුරදුන් අංගුත්තර නිකායේ දුක නිපාතයේද ද්වේ මේ භික්ඛවේ යාගා කතමේ ද්වේ ආමිස යාගෝච ධම්මයාගො යනුවෙන් දේශනා කොට ඇත.

එනම් මහණෙනි, යාග ක්‍රම දෙකකි.
ආමිෂ යාගය
ධර්ම යාගය

භාරතයේ එකළ ජනප්‍රියව තිබූ පෙර සඳහන් කළ යාග වෙනුවට බුදුරදුන් හඳුන්වා දුන්නේ දානයයි. එනම් අවිහිංසා සහගතව තමා සතු වස්තුව පරිත්‍යාගයයි. එය ආමිෂ දානයයි. දෙවැන්න ධර්ම යාගයයි. පිරිත් දේශනා කිරීම් ආදී ධර්මය බෙදා හැරීම එම ධර්ම යාගය වේ. මෙය බෞද්ධ ප්‍රතිපදාවයි. එමෙන්ම පෙර දක්වූ උපනයනය හා ආශ්‍රව ධර්ම යන පූජා ද අනර්මකාරී ජීවිත හිංසා සහගත ක්‍රියාදාමයන්ය. ඒ ඒ අවධීන් අනුව එක් දෙයක් පමණක් සීමා කිරීම අසාධාරණයකි. දරුවන්ගේ බිරිඳගේ උපකාරය අවශ්‍යම යුගය මහලු අවදියයි. ආශ්‍රම ධර්ම වලදී එකළ මහා වනාන්තරයේ තනිකර දමයි. මෙය බුදුදහමට එකඟ නැත.

ශ්‍රමණ සම්ප්‍රධාය තුළ ඉතා ජනප්‍රියව පැවති උග්‍ර තපස චර්යාවන් අතර,

# ආගමික පුදපූජා විධි හා බෞද්ධ ප්‍රතිපදාව

මෙහිදි ආගමික පුද පූජා අනු මාතෘකා දෙකක් ඔස්සේ තොරතුරු අනාවරණය කරයි.
1. සමකාලීන ආගමික පුදපූජා
2. නූතන ආගමික පුදපූජා

භාරතීය සමාජයේ බුදුරදුන් පහළ වීම දක්වා කාලය යුග තුනකි. එනම්,
1. බහුදේව වාදය
2. ඒක දේව වාදය
3. අදේව වාදය

බහුදේව වාදී යුගයේදී මූලිකව ත්‍රි මූර්තිය පිළිගනු ලැබීය . බ්‍රහ්ම, විෂ්ණු, ශිව යනු එම ත්‍රිමූර්තියයි. මෙකල බොහෝ දෙවිවරු විශ්වාස කළ යුගයකි. ආකාශස්ථ, භූම්‍යස්, යනුවෙන් එය දෙයාකාරය.
චන්ද්‍ර
සූර්ය
වායු
මේඝ
මරුත්
පර්ජන්‍ය
රුද්‍රා
විෂ්ණු ආදී දෙවිවරු ආකාශස්, වශයෙන්ද,
අග්නි
සෝම
සරස්වති
පෘථිවි භූම්‍යස්ථ දෙවිවරු හැටියට ද සළකා ඇත.

අනතුරුව කාලයාගේ ඇවෑමෙන් ඇති වූ ඥාන පරිපාකයන් සමඟ විශ්වයත් සත්වයාත් පිළිබඳ සංකල්පය දියුණු විය. ඒ අනුව සර්ව බලධාරි දෙවියන් පිළිබඳ හැඟීමක් පහළ විය. තවද ස්වාභාවික වස්තූන් වලට ද නායකයෙකු ඇතැයි ඔවුහු විශ්වාස කළහ. සියලු ස්වාභාවික වස්තූන් අවස්ථාවෝචිතව විටින් විට මිනිසාට යහපත මෙන්ම අයහපත ද උදා කරමින් ක්‍රියාත්මක වන්නේ යම්කිසි නායකයෙකුගේ කැමැත්ත පරිදි බව එකළ ජනතාව විශ්වාස කරන්නට වූහ. ඒ අනුව ලොව සියල්ල එකම දෙවියා වන මහා බ්‍රහ්මයා විසින් මවා ඇති බව වැඩි දුරටත් පිළිගන්නට වූහ.

මේ අනුව මහා බ්‍රහ්මයාගේ කැමැත්ත අනුව බ්‍රහ්මණ ධර්මය එකළ සමාජයට දායාද විය. එහි ඉගැන්වෙන,
උපනයන චාරිත්‍රය (ද්විජ)
ආශ්‍රව ධර්මය

ආගමික පූජා විධි දෙකකි. පුනනුල ගෙල පළඳමින් බ්‍රාහ්මණ දරුවා ළමා වයසේදීම බමුණු සමාජයට සම්බන්ධ කරගනී. ජීවිතයේ අවස්ථා 4ක් අනිවාර්ය කටයුතු සඳහා යොමු කරවමින් ආශ්‍රව ධර්ම හඳුන්වා දී ඇත.
බ්‍රහ්මචාරි - කුමාර අවධිය
ගෘහස්ථ - තරුණ අවධිය
වානප්‍රස්ථ - තලතුනා අවධිය
සන්‍යාසි - මහලු අවධිය
තෙවනුව අදේව යුගය පහළ වේ. එනම් බෞද්ධ

ඒ අතර බමුණු දහමට අනුව,
පීතෘ යාගය
පුංසවන යාගය

ජනප්‍රිය පුදපූජා ක්‍රම 2කි. පියා මිය ගියාට පසු පිරිමි දරුවෙකු විසින් කළ යුතු පුද පූජා යාගහෝම පිතෘ යාගය හෙවත් පිතෘ දානයයි. එය කළ හැක්කේ පිරිමි දරුවෙකුට පමණක්ම යැයි ඉගැන්වූහ. එනිසාම එකළ සමාජය පිරිමි දරුවෝම පැතූහ. දරු කළලයක් මව් කුසට පැමිණි පසු මාස තුනක් ගත වන විට පිරිමි දරුවෙකුම පතා දෙවියන්ට යාගහෝම කිරීම පුංසවන යාගය වශයෙන් හඳුන්වා ඇත.

මීට අමතරව එකළ පැවති පංච විධ යාගයන් පිළිබඳ බුදුරදුන් සංයුක්ත නිකායේදී දක්වා තිබේ.
අස්සමේධං පුරිසමේධං
සමමාපායං වාජපෙය්‍යං නිරග්ගලං
මහායඥා මහාමේභා
නතේ හොන්ති මහප්ඵලා

1. අශ්වමේධ
2. පුරුෂමේධ
3. සම්මාපාය
4. වාජපෙය්‍ය
5. නිරග්ගල

යන මේ යාගයන් කිසිඳු මහත්ඵලයක් නොවන බැව් බුදුරදුන් දේශනා කළහ.

අශ්වයින් සිය ගණන් රැස්කොටට ඔවුන් මරා එම ලේ ගින්නට වත්කොට රටට සමෘද්ධිය පැතිම අශ්වමේධ යාගයෙන් සිදු කෙරේ. බුදදහම මේ වෙනුවට සස්මේධ උගන්වයි. එනම් ධාන්‍ය වගාවයි. පුරුෂමේධ යනු විවිධ තරාතිරමේ පුරුෂයන් මරා එම ලෙයින් කරන යාගයකි. බුදදහම ඒ සඳහා පුරුෂ බලය යොදා රට සමෘද්ධිමත් කිරීම හඳුන්වා දී ඇත. සවිබලැති පුරුෂයකු විසින් විදින ලද හීය වැටුණු තැන් කළ යාගය සම්මාපාය නම් වේ. දිළිදු මිනිසුන්ට කිසිදු ලියවල්ලක් හෝ පොළියක් නොමැතිව දහස් ගණන් මුදල් දී ඔවුන් රටේ සමෘද්ධියේ කොටස්කරුවන් කරගැනීම ඊට ප්‍රතිවිරුද්ධ ක්‍රියාදාමයයි.

වාජපෙය්‍ය යනු ගිතෙල් විවිධ ධාන්‍ය වර්ග හා සතුන් ගින්නට බිලිකොට කරන හිංසක යාගයකි. බුදුරදුන් ඒ සඳහා හදුන්වා දුන්නේ පිය වචනයෙන් කටයුතු කොට සහජීවනය ගොඩනැගීමයි. මිනිසුන් සතුන් හා ධාන්‍ය වර්ග ගින්නට බිලිකොට පරිවාර යාග 09න් යුත් මහා යාගය නිරග්ගලය මෙහි අහිංසක දිශානතිය බුදුදහමට අනුව සොර සතුරු බිය පහව ගොස් රැකියා සඳහා නිවසින් බැහැර වීමයි.

බ්‍රාහ්මණ ඉගැන්වම් අනුව එදා කාන්තාව අන්ත අසරණ කොට සමාජය තුළ සිරගත කොට සිටි බව ජනප්‍රිය කරුණකි. එහි එක් අවස්ථාවකි. සති පූජාව එනම් තම ස්වාමියා මියගිය පසු දේහය දවන ගිණි ගොඩට පැන තම ජීවිතය පූජා කිරීමයි. උදක පාරිශුද්ධිය ද එකළ පැවති පූජා චාරිත්‍රයකි. එනම් පව සෝදා හැරිමයි. උදෑසනම ගඟට බැස තම පව් සෝදා හැරිය හැකි බව එම බමුණු මතයයි. ඉන්දියාවේ ගංගා නම් ගඟ ආශ්‍රිතව මෙය

අජ ව්‍රත
ගෝ ව්‍රත
සුනඛ ව්‍රත
කුක්කුට ව්‍රත ආදිය මෙන්ම කාය මූලික ශයෝග ක්‍රම ක්‍රියාත්මක විය. ජටිල, ආජීවක, පරිබ්‍රාජක, අචේලක, නිගන්ඨ ආදී ශ්‍රමණ සම්ප්‍රධායන් මෙවැනි යෝගක්‍රම අනුගමනය කොට ඇත.
අත්ථකිලමථානුයෝගය
කාමසුඛල්ලිකානුයෝගය

ආදි කාය මූලික යෝගි ක්‍රම සහේතුකව ප්‍රතික්ෂේප කරන බුදුරදුන් මනෝ මූලික භාවනා ක්‍රම හා මද්‍යම ප්‍රතිපදාව ඇසුරෙන් විමුක්තිය උදාකරගත යුතු බව අවධාරණය කොට ඇත. එමෙන්ම පුද්ගලයාගේ පව් (කෙළෙස්) උදක පාරිශුද්ධියෙන් (කාය පාරිශුද්ධියෙන්) නොව මනෝ පාරිශුද්ධියෙන් ඉවත් කළ යුතු බව සංයුක්ත නිකායේ බ්‍රාහ්මණ සංයුක්තයේද මැනවින් දේශිතය.

නූතන ආගමික පුදපූජා මෙහිදී අනු ශීර්ෂ 03න් සාකච්ඡා කිරීම එනම්,
හින්දු ආගමික පුද පූජා
ක්‍රිස්තියානි ආගමික පුද පූජා
ඉස්ලාම් ආගමික පුද පූජා වශයෙනි.

හින්දු ආගමික පුද පූජා කිහිපයක් වසර පුරා දක්නට ලැබේ. ඒ අතර,
තෛපොංගල් උත්සවය
මහාශිවරාත්‍රි උත්සවය
දීපාවලී උත්සවය

සාර්ථක අස්වැන්නක් සඳහා සූර්යයාගේ බලපෑම ඉතා වැදගත්ය. තම කෘෂි කටයුතු සඳහා උපකාරි වූ සූර්යයාට කළගුණ සැළකීමේ අරමුණින් වාර්ෂිකව පවත්වන උත්සවය තෛයිපොංගල් උත්සවයයි. පොංගල් උත්සවය දින තුනක් තිස්සේ පැවැත්වේ.
1. පෝගි උත්සවය
2. කාණුම් පොංගල්
3. මාට්ටුප්පොංගල්

හින්දූන් ගවයා දේවත්වයෙන් පුදනු ලැබේ. තම ගොවිතැනට බෙහෙවින් උපකාරි වන ගවයාට තුති පුදන දිනය මාට්ටුපොංගල් දිනයයි.

ශිව දෙවියන් උමා මෑණියන් සමග එකතු වී සතුටින් සිටි දිනය මහාශිව රාත්‍රි දිනයයි. ශිව දෙවියන් සතු වටිනා නාග මාණික්‍ය එදින නාග කන්‍යාව විසින් ආරක්ෂා කෙරේ. ඒ වෙනුවෙන් හින්දු ජනතාව සවස හයේ සිට උදෑසන හය දක්වා කෝවිලේ නිදිමරාගෙන පුද පූජා පවත්වා ආශිර්වාද ලබා ගනිති.

හින්දූන් සමරන අනෙක් උත්සවය දීපාවලි උත්සවයයි. මෙය විෂ්ණු දෙවියන් අරමුණු කරගෙන පැවැත්වේ. අසුරයා මිනිසුන්ට හිරිහැර කළ අවස්ථාවේ ඔවුන් ඉන් මුදවා ගත්තේ විෂ්ණු දෙවියන්ය. ජනතාවට

13 පිටුවට....

පූජ්‍ය ශාස්ත්‍රපති බුදුගල සෝමරතන හිමි

# මිනිස් හට සොඳුරු ගුණ හා නුගුණ ඇත නිදොස් කෙනෙකු මේදියත උපදින්නේ නැත



නිකිණි සඳ නිල් අඹරට නැගී සුදු සඳ රැස් විහිදුවන්නේ මද පවන් දිගේ අප දෙසවන් වෙත යා කරමිනි. දුක, දුකට හේතුව ඉන් මිදෙන මඟ, එය නැති කිරීම යන චතු සත් දම් දෙම් බොඳු හදවත් තුළ අදත් නොමැකෙන මතකයකි.

ලොව හොඳ නරක මිනිසත් කමේ අගය පළමුවෙන්ම ලොවට දේශනා කළේ ලොව්තුරු බුදු පියාණන් වහන්සේය. මේ ලිපියේ මාතෘකාව ලෙස මා තෝරා ගත්තේ අලගියවන්න මුකවැටි කිවිඳුන් විසින් රචිත සුභාෂිතය" නම් ග්‍රන්ථයෙන් තෝරාගත් මාහැඟි ඉතා වැදගත් වදනකි. එහි සඳහන් අන්දමට මිනිසුන් තුළ හොඳ හා නරක යන දෙකම තිබේ. මේ පිළිබඳව අප මඳක් විමසා බැලීම වටී. හරි හැටි අවබෝධ කරගෙන තිබෙනවාද? යන්න ප්‍රශ්නයකි. නමුත් මෙය වත්මනෙහි ඉතා හොඳින් අවබෝධ කර ගත යුත්තකි. මේ ලෝ තලයෙහි උපන් සැම කෙනෙක් තුළම හොඳ හා නරක යනුවෙන් දෙකොටසක් ඇත. මා මාතෘකා කළ සුභාෂිත වදන එය උදාහරණ සහිතව පෙන්වා දෙයි. එයින් දැක්වෙන පරිදි

මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත
නිදොස් කෙනෙක් මේ දියත උපදින්නේ නැත
වෙසෙස් සිනිදු මුවරද බර සහස් පත
කොරොස් නලින් යුතුවෙයි කටු පෙළිනි යුත

(සුභාෂිතය)

යන අන්දමට මිනිසා තුළ යහපත් ගුණ සහ නුගුණ යන දෙකම තිබේ. මේ ලෝකයෙහි නිර්දෝෂී පුද්ගලයෙක් උපත ලබා නැත. එය හරියට ලස්සන නෙළුම් මලක නටුව ඉතා ගොරෝසු කටුක බවින් යුක්ත වන්නා සේය. මෙය පැරණි සංස්කෘත ග්‍රන්ථයක් වන ව්‍යාසකාරය" නම් ග්‍රන්ථය පෙන්වා දෙන්නේ මෙසේය.

දෝ ෂෝ ප්‍යස්ති ගුණෝ ප්‍යස්ති
නිර්දෝෂෝ නෛව ජායතෙ
සුකුමාලස්‍ය පද්මස්‍ය
නාලෝ භවති කර්කෂඃ

(ව්‍යාසකාරය)

මෙයින්ද දෝෂයන් හා නිර්දෝෂයන් සහිත පුද්ගලයන් ලොව සිටින බවත්, එය සුකුමාර වූ පද්මයක් සුකුමාල එහි නටුව කර්කෂ බවින් යුක්ත වන බව පෙන්වා දෙයි.

වත්මන් සමාජය තුළ අප ජීවත් වන විට අපට විවිධ තරාතිරම්වල පුද්ගලයන් ඇසුරට හා ඔවුන් හා කටයුතු කිරීමට සිදු වෙයි. නමුත් ඔවුන් හා ජීවත් වීමේ දී හා වැඩ කටයුතු කිරීමේ දී අප අතර ගැටුම් ඇති වන්නේ බොහෝ දෙනෙක් මෙය තේරුම් නොගැනීම නිසාය. වෙසෙසින්ම අප නිවෙස් තුළ පවා මෙය නොදන්නා නිසාවෙන් බොහෝ ගැටළු ඇති වීමට බෙහෙවින් ඉඩ තිබේ. මහනෙල් මල පිපෙන විලේ දුගඳ හමන කුඩා මසුන් ජීවත් වෙයි. නමුත් ඒ කුඩා මසුන්ටත් සුගන්ධවත් මහනෙල් මලටත් එකම කාරණය වූයේ ජලයයි. එම ජලයේම පිපෙන මහනෙල් මල සුවඳවත් වූවද එහිද ඇති නටුව ඉතා ගොරෝසු බවින් යුක්තය. කෙසේ වුවත් එහි නටුවට වඩා වැඩි දෙනෙක් ප්‍රිය කරන්නේ මල වෙතය. ඒ එහි ඇති සුගන්ධවත් බව, සොඳුරු බව, අලංකාර බව පමණක් බොහෝ දෙනෙක් දකින නිසා මය.

මේ අන්දමින් සොබා දහම අපට කියා දෙන්නේ ඉතා උතුම් පාඩමකි. අද අප ඇසුරු කරන හා අපහා සමඟ ජීවත් වන බොහෝ දෙනෙක් පුද්ගලයෙකු වෙතින් යම් වරදක් වූ විට එය ඉස්මතු කරමින් එම පුද්ගලයා සමාජයේ ඉතා අපහාසයට උපහාසයට ලක් කරයි. නමුත් ඒ පුද්ගලයා තුළ නිවැරදි උතුම් ගුණ ධර්මයන් එකක් හෝ තිබිය හැකිය. අප ලැබූ මිනිසත් බව මිනිසත් බවින් පුරවාලන්නට නම් සැම පුද්ගලයෙක් දෙසම වැරදි දූෂ්ඨියකින් නොබැලිය යුතුය. අප කෙරෙහි අහිනවත් පුද්ගලයෙකු සතුව වූවද ඉතා හොඳ යහපත් ගතිගුණයක් හෝ තිබිය හැකිය. පුද්ගලයෙකුගේ එක් වරදක් දෙස බලමින් ඔහු අවඥාවට ලක් කරනු වෙනුවට ඔහු තුළ ඇති එකඳු හෝ යහපත් ලක්ෂණයක් දැක එය අගය කිරීමට පෙළඹෙන්නේ නම් එබඳු පව්ටු පුද්ගලයන් වුවද යහපත් මඟට ගත හැකිය. මෙය අප බුදුන් වහන්සේ ඉතා හොඳින් ලොවට පෙන්වා දුන් සේක. ඒ අංගුලිමාල දමනයෙනි. ඔහු කළ පව්ටු වැඩ වලට වඩා බුදුන් වහන්සේ අගය කළේ ඔහු එක් දිනක් හෝ කළ යහපත් දෙය ගැනය. එවිට බොහෝ කළ අකුසල් යටපත් කරගැනීමටත් කරන කුසල වර්ධනය කරගැනීමටත් බුදු සසුනේ උතුම් තෙරුන් වහන්සේ කෙනෙකු වීමටත් අඟුල්මල් නම් පුද්ගලයාට හැකි විය. වළාකුලකින් මිදුන පුන් සඳක් මෙන් පව්ටු දෙය සෝදා හැර තම ප්‍රඥාවේ ආලෝකය ලොවට විහිදුවන්නට අප සැම කෙනෙකුටම හැකියාවක් ලැබෙයි.

මෙය තේරුම් ගැනිමට අද කාලය එළඹ තිබුණත් බොහෝ දෙනා පුරුදු වී සිටින්නේ කෙනෙකුගේ සුළු වරදක් හෝ දුටුවහොත් එයම මතුකර දක්වන්නටය. මේ තත්වය නිසා සමාජයේ කුඩාම ඒකකය වන පවුල් සංස්ථාව තුළද බොහෝ ගැටළු වලට මූලික හේතුව බවට මෙය පත්ව තිබේ. අඹු සැමි දූදරුවන් අතර එකිනෙකා අතර පවා සහයෝගය බිඳී යාමට මෙය හේතුවක් වී තිබේ. දෙමාපියන් වූව ද දරුවන්ගේ කුඩා වරදක් දුටු විට එඉම ස්මතු කරමින් එම දරුවා පීඩනයට ලක් කරයි. එයට වඩා වටින්නේ එම දරුවාගේ හොඳ ලක්ක්ෂණයක් අගය කිරීමයි. එය පෙන්වා දුන් විට ඔහු යහපත් මඟකට යොමු වීම නොඅනුමානය. ගුණ ඤාන බෙලෙන් යුතු පිරිසක් බිහි කිරීමට මේ වටිනා උපදේශය පිළිපැදීමෙන් හැකිවනු ඇත. එසේම අප සැම කෙනෙක්ම සිතට ගත යුත්තක් නම් තමන්ගේ වරද වරදක් ලෙස තමන් පිළිගැනීමත් නිවැරුද්ද නිවැරුද්ද ලෙසත් පිළිගැනීමත් යහපත සාදා ගැනීමයි. එමෙන්ම තම මිතුරාට හිතවතුන්ට ඉතා යහපත් කළණ මිතුරෙකු වීමට නම් ඔහුගේ වරද වරදක් ලෙස පෙන්වා දී යහපත් දෙය ඔහුට පෙන්වා අගය කිරීමෙන් ඉතා අයහපත් මඟට පිළිපන්නවුන් පවා යහමඟට ගත හැකිය. බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය වන ධම්ම පදයද මෙයට දී ඇති ඔවදනක් මට සිහිපත් වෙයි. එනම්,

" අද අප ඇසුරු කරන හා අපහා සමඟ ජීවත් වන බොහෝ දෙනෙක් පුද්ගලයෙකු වෙතින් යම් වරදක් වූ විට එය ඉස්මතු කරමින් එම පුද්ගලයා සමාජයේ ඉතා අපහාසයට උපහාසයට ලක් කරයි. "

නිධීනංව පවත්තාරං
යං පස්සේ වජ්ජ දස්සිනං
නිග්ගස්හවාදිං මේධාවිං
තාදිසං පණ්ඩිතං භජේ
තාදිසං භජමානස්ස
සෙය්‍යෝ හෝතින පාපියෝ"

(ධම්ම පදය පණ්ඩිත වර්ගය)

යනුවෙනි. මෙයින් කියවෙන්නේ තමාගේ වරදක් පෙන්වීම නිධානයක් ඇති තැනක් පෙන්වා දෙන යහපත් පණ්ඩිතයන් ඇසුරු කළ යුතු බවයි. එම වරද පෙන්වා දී එම පුද්ගලයා තුළ ඇති යහපත් දෙය අගය කරන්නේ නම් මේ සමාජය ඉතා යහපත් වන බවට කිසිම සැකයක් නැත. එම නිසා මේ ලොව සැම කෙනෙකු තුළම වරද හා නිවැරැද්ද යන දෙකම තිබෙන බව අවබෝධ කරගෙන තම තමන්ගේ ඤාන පමණින් එකිනෙකා තේරුම් ගෙන සමාජය යහපත් කිරීමට සැම කෙනෙකුම ඉටා ගන්නේ නම් ඉතා වටිනා බව සඳහන් කළ යුතුය. යහපත අගය කර අයහපත බැහැර කිරීමෙන් යහපත් සමාජයක් කරා යන ගමන සාර්ථක කරගැනීමට අපට හැකියාව ලැබෙනු ඇත.

දිල්රුක්ෂි අබේකෝන්

# වැවයි - දාගැබැයි ගමයි - පන්සලයි



$$N_2+O_2 \xrightarrow{\text{අකුණු}} NO+NO_2 \xrightarrow{H_2O} HNO_3 \xrightarrow{H_2O} H^+ + {}^-NO_3$$

පුරාතන රාජ පාලන කාලය තුළ ශ්‍රී ලංකාව ආහාර වලින් ස්වයංපෝෂිතව පැවති බව ඉදිකර තිබෙන වාරි කර්මාන්ත වලින් සහ විහාර නිර්මාණ තුළින් පැහැදිලි වෙයි. පොළොන්නරුව යුගයෙහි අතිරික්ත ආහාර නිෂ්පාදන පිට රටවලට පවා යැවූ බව ඉතිහාසය තුළ සඳහන් වෙයි. මෙලෙස ආහාර වලින් ස්වයංපෝෂිත වීම සඳහා විධිමත් විද්‍යාත්මක ක්‍රමයකට වැඩ පිළිවෙලක් සහිතව තේමා පාඨයක් ඔස්සේ යමින් මෙම ගම්මාන ගොඩනගා තිබේ. එම තේමාව වන්නේ ''වැවයි දාගැබයි-ගමයි පන්සලයි'' යන්නය. පන්සල් ගොඩනැගීමේදී ගම්මානයට යාබදව තිබෙන ගල්තලාවක් මත ගොඩනගා තිබෙයි. මෙයින් ප්‍රධාන අරමුණු දෙකක් අපේක්ෂා කරන ලදි. ඒවා නම්, ගල්තලාවක් මත ආහාර භෝග වගා කරලීමට නොහැකි නිසා සරුසාර භූමි ආරක්ෂා කරමින් තමන්ට සිව්පස සපයන දායකයන්ගේ සරුබිම ආරක්ෂා වන ලෙස මෙම දුෂ්කර ගල්මත වෙහෙර විහාර නිර්මාණය කිරීමත්,

එම ගල්තලාව යටින් වැව සහ ගල්තලාවේ ඉහළම තැනක දැගැබ් නිර්මාණය කරන ලදි.මෙමගින් වැව්දිය පෝෂණය කිරීමත්, අපේක්ෂා කරන ලදි.

දාගැබ් අකුණු සන්නායක ලෙස ක්‍රියාකර මෙම ප්‍රදේශයට අකුණු ආකර්ශනය කරගනු ලබයි. වායු ගෝලයේ 78% ක් නයිට්‍රජන් ($N_2$)වායුව අන්තර්ගත වේ. නයිට්‍රජන් වායුව අනු දෙකක් එකිනෙකට සම්බන්ධ වී ඇත්තේ ත්‍රිත්ව බන්ධනයකිනි.මෙම බන්ධනය දැඩි බන්ධනයක් වන අතර ස්වභාවික බණ්ඩනය නොවන අතර ඒ සඳහා දැඩි ශක්තිය නිසාවෙන් මෙම ත්‍රිත්ව බන්ධනය බණ්ඩනය වී ඔක්සිජන් වායුව සමග සම්බන්ධ වී මොනො නයිට්‍රික් ඔක්සයිඩ් (NO) සහ නයිට්‍රික් ඔක්සයිඩ් ($NO_2$) සෑදෙයි. එම සංයෝග වැව් දියට වැටීම නිසා ජලය ($H_2O$) සමඟ සම්බන්ධ වී නයිට්‍රික් අම්ලය සෑදේ.

තවදුරටත් ජලය තුළදී නයිට්‍රික් අම්ලය $H^+$ ධන අයන ලෙස ද $NO_3$ ඇන අයන ඇතිවේ. මෙම ඇන අයන ශාකවලට ක්ෂණිකව උරාගෙන ශාක වලට අවශ්‍ය නයිට්‍රජන් අවශ්‍යතාවය සම්පූර්ණ කරගත හැක.

> ''මෙම පුරාතන දැනුම වර්තමානයෙහි දියුණු ප්‍රජාව විසින් අනුගමනය නොකරයි. ඒ වෙනුවට වස විස සහිත පොහොර කෘෂි වගාවට භාවිත කරමින් වස විස සහිත ආහාර ගැනීම නිසාවෙන් පිළිකා ඇතුළු දරුණු රෝගවලට ගොදුරු වෙමින් මිනිසුන්ගේ පරමායුෂ කෙටි කර ගනිමින් සිටී.

මෙම ක්‍රියාවලිය තුළින් වැව් ජලයට නයිට්‍රජන් ලැබී වැව් ජලය පෝෂණය වෙයි. එම ජලය කෙත්වතු වලට හරවා යැවීමෙන් පස නයිට්‍රජන් වලින් පෝෂණය විය. ඊට අමතරව සත්ව සහ ශාක පොහොර යොදා ගත් බැවින් සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට හැකි විය.මෙම පුරාතන දැනුම වර්තමානයෙහි දියුණු ප්‍රජාව විසින් අනුගමනය නොකරයි. ඒ වෙනුවට වස විස සහිත පොහොර සහ කෘෂි රසායන වගාවට භාවිතා කරමින් වස විස සහිත ආහාර ගැනීම නිසාවෙන් පිළිකා ඇතුළු දරුණු රෝගවලට ගොදුරු වෙමින් මිනිසුන්ගේ පරමායුෂ කෙටිකර ගනිමින් සිටී.

ප්‍රජාව අතර සමගිය සහ එක්ව වැඩ කරලීමේ ගුණය පන්සල විසින් පුරුදු පුහුණු කරන ලදි. මෙලෙස විද්‍යාත්මක පදනමක් මත පුරාණ ග්‍රාම රාජ්‍ය නිර්මාණය කරගැනීම තුළින් පෝෂණීය ස්වභාවික ආහාර වර්ග අනුභව නිසාවෙන් දීර්ඝායුෂ විඳිමින් නීරෝගී ජීවිතයක් ගත කරන ලදි. මෙම ස්වයංපෝෂිත පදනම විනාශ කරලීම සඳහා අප රට ආක්‍රමණය කළ කාලිංග මාඝ වැනි ආක්‍රමණිකයන් වෙහෙර විහාර සහ වැව් විනාශ කරන ලදි. බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් අප රට යටත් කර ගැනීමෙන් අනතුරුව මෙම පදනම විනාශ වෙන ආකාරයට කටයුතු කර තිබේ. අපට දියවර සැපයූ මධ්‍ය කඳුකරය විනාශ කරමින් තේ,රබර්,කෝපි,කොකෝවා ආදිය වගාවන් කරන ලදි.

වැව් විනාශ වන ආකාරයට වැව් මැදින් මහාමාර්ග ඉදිකරන ලදි. කුරුණෑගල සිට පුත්තලම දෙසටත් අනුරධපුර දෙසටත් ගමන් කිරීමේදී මෙලෙස විනාශකර ඇති වැව් දක්නට ලැබෙයි. නිදහස ලැබීමෙන් අනතුරුව අප රට පාලනය කළ ආණ්ඩු විසින් කෘෂි සහ සත්ව පාලනය පදනම් කර ගනිමින් ගොඩනගා තිබූ ආර්ථිකය සේවා ආර්ථිකයක් බවට පත්කරමින් රටේ නිෂ්පාදන ආර්ථිකය දුර්වල කර තිබේ. 2019 ශ්‍රී ලංකා මහා බැංකුවේ පෙන්වා ඇති ආකාරයට සැළකීමේදී මේ බව පැහැදිලි වෙයි. කෘෂි කාර්මික 7.4%, කාර්මික 27.4%, සේවා 58.2% ලෙස මේ අනුව ආහාරවලින් ස්වයංපෝෂිතව පැවැති ගම්මාන සංකල්පය විනාශ වී තිබේ.

පී.නන්දන පී.වික්‍රමසිංහ
විද්‍යාවේදී(ජීව විද්‍යා), ශාස්ත්‍රපති(සමාජ විද්‍යාව),
දර්ශනපති(සමාජ විද්‍යාව),
උප සභාපති - ජාතික විද්වත් සංවිධානය,
කෑගල්ල දිස්ත්‍රික්කය

# බුදුරජාණන් වහන්සේගේ පරාර්ථ චර්යාව



බුද්ධත්වය පරාර්ථ චර්යාවේ අග්‍රඵලයයි. දිවකුරු මුනිඳුන් පාමුලදී සුමේධ තවුසාණන් අතට පත් නිවන් සුව හැර දමා සසරට පිවිසියේ පරාර්ථය සලසනු සඳහාය. මෙරට හිත සුව සළසනු පිණිසය.

කිං මෙම අඤ්ඤාත වෙසෙන
පුරිසෙන ථාම දසසිනා
සබ්බඤ්ඤුතං පාපුයිත්වා
සත්තා රෙස්සං සදෙවක

උත්සහ සම්පන්න වූ පුරුෂයෙකු වූ මා හුදකලාව අප්‍රසිද්ධ වශයෙන් දුකින් මිදෙන්නේ කෙසේද? සර්වඥතාඥානයට පැමිණ සදෙවක ලෝකයා සසර කතරින් එතෙර කරවන්නෙකි.

බුදුරජාණන් වහන්සේ බොහෝ තැන්වල හඳුන්වා තිබෙන්නේ කරුණා නිධාන වූ පරදුක්ඛ දුක්ඛිත වූ යන වචන වලිනි. ජාතක සාහිත්‍යය පුරාවට අසරණ සරණ සරණංකර යන ගෞරවාර්ථ නාමය උපයුක්ත කරගෙන ඇත.

මහා කරුණාවෙන් මෙහෙයවුණු සිතින් පෙරුම්දම් පුරන බෝධි සත්වයෝ කායජීවිත දෙකෙහි නිරපේක්ෂව අනුන් විඳින දුක් කම්කටොලු ගැන උණු වූ හදවතින් පරාර්ථ චර්යාවෙහි යෙදෙති. ආත්මාර්ථකාමී බවෙන් තොරව පරාර්ථචර්යාවේ යෙදෙන්නා බෝධි සත්වයෙකි. නියම සත් පුරුෂයෙකි. එබඳු නියම ශ්‍රේෂ්ඨ පුද්ගලයෝ ලොව දුබලය.

තමනට හිමිවන යස ඉසුරු කීර්ති ප්‍රශංසා හා ලාභ ප්‍රයෝජන අනුන්ගේ යහපත වෙනුවෙන් යෙදවිය හැක්කේ මමත්වය දුරුකළ පරහිත නිරත පුද්ගලකුටය. බුදුන් වහන්සේ නිතරම තම ශ්‍රාවකයන්ට අනුශාසනා කළේ,

පරෝපකාරාය මිදං ශරීරං
මාගේ ශරීරය අන් අයගේ යහපත පිණිස වේවා යන පරමාර්ථයෙන් කටයුතු කරන ලෙසය. තම පළමු ශ්‍රාවකයන් අමතා,

චරත භික්ඛවේ චාරිකා යං බහුජන හිතාය, බහුජන සුඛාය, අත්ථාය, හිතාය ලෝකානුකම්පාය යනුවෙන් දේශනා කර ඇත.

එනම් මහණෙනි, බොහෝ ජනයාගේ හිත සුව පිණිස සත්වයා කෙරෙහි අනුකම්පා පිණිස දෙව්මිනිසුන්ගේ යහපත පිණිස ධර්ම ප්‍රචාරයේ යෙදෙන්න. එක මඟකින් දෙදෙනෙක් නොයන්න. මුල මැද අග යන තුන් තන්හිම යහපත් වූ ධර්මයන් මිනිසුන්ට අනුශාසනා කරන්න යනුවෙනි.

මේ අනුශාසනාවෙන් උන්වහන්සේගේ පරාර්ථචර්යාව සඳහා වූ කාරුණික ආයාචනය පැහැදිලි වෙයි. තවත් තැනක,

සුනාථ, ධාරේථ, චරාථ

යනුවෙන් එනම්, අහන්න, ධාරණය කරගන්න, හැසිරෙන්න යනුවෙන් දේශනා කර ඇත. මෙම අනුශාසනා වලට අනුව ශ්‍රාවකයන්,

''සපදාන චාරිකායං පිණ්ඩාය චරමාණෝ ''

ගෙපිලිවෙලින් පිඬුසිඟා වඩිමින් පරාර්ථ චර්යාවේ යෙදෙන බව දක්නට ලැබේ. බුදුදහමේ පදනම පරාර්ථ චර්යාවයි. පරාර්ථචර්යාව නැති තැන බුද්ධාගමක් නැත. තමාට පිටස්තර වූ සමාජයට තමන්ගෙන් ඉටුවිය යුතුකම් එමෙන්ම සමාජයේ ඒ ඒ සංස්ථාවන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් සිඟාලෝවාද ආදී සූත්‍ර දේශනාවන්හි දක්නට ලැබේ. යුතුකම වූ කලී,

''රතස්සා නිව යහපතෝ ''

කරත්ත රෝදයේ කඩ ඇණය මෙන් යැයි දේශනා කර ඇත. ආත්මාර්ථකාමි නරක චේතනා සිතින් අස්වූ විට සිත පිවිතුරු වේ. විවෘත වේ. ප්‍රබුද්ධ වේ. යමෙකුට ආත්මාර්ථකාමී ගතිය අමතක කළ හැකි නම් හෙතෙම පරාර්ථකාමියෙක් වේ. පරහිත නිරත පුද්ගලයා බෝධිසත්වයෙකි. එහි තේරුම මනුෂ්‍ය සන්තානය දූෂිත කරන කෙළෙසුන්ගෙන් බොහෝ දුරට ඈත්වූ ගුණගරුක පුද්ගලයෙකු හඳුනාගන්නා නාමය බෝධිසත්ව යන්නයි. ඔහුගේ අපේක්ෂාව හැකිතාක් වැරදි වැඩවලින් ඈත්ව අනුනට හිත වැඩ සැලැස්වීමයි.

බුදුන් වහන්සේ ස්වකීය ජීවිතයෙන් ධර්ම දේශනාවෙන් මතුකොට භික්ෂු සංඝයාගෙන්ද බලාපොරොත්තු වූයේ පරාර්ථ චර්යාවයි. උන්වහන්සේ බෝසත් අවධියේදී තමන් සතු සියලු වස්තුව ශරීරාවයවයන් පමණක් නොව ජීවිතයද පරිත්‍යාග කළේ ලෞකික ජීවිතයෙන් පරාර්ථයෙහි යෙදෙන පුද්ගලයන්ට ලෝකෝත්තර ගුණ සම්පත්තියෙන්ද උචිත අවස්ථාවේ පරාර්ථ චර්යාවට යොමුවන බැවින්. නැතහොත් එයට පුරුදු වීමක් වශයෙනි. පරාර්ථ චර්යාව පිළිබඳ බෝධිසත්ව ආදර්ශය ගුරුළුගෝමීහු මෙසේ දක්වති.

ඔවුහු පර වැඩ ඇත අසිපත්‍රවනයෙහිදු වසිති. නන්දන වනයෙහි සෙයින් වෙසෙති. පරවැඩ නැත. නන්දන වනෙහිදු වසන් අසිපත්‍ර වනයෙහි සෙයින් වෙසෙත්. එයින් කීහ.

''පරහිත කරණාය බුද්ධකක්ෂාත්
සුබ මසිපනු වනෙ වසන්ති සත්තං
නපුන රමර සුන්දරී සහායං
ක්ෂණමපි නන්දන කානනෙ''

මෙලෙස බෞද්ධ දර්ශනය පරාර්ථචර්යාව මතම පදනම් වන බව පෙන්වාදිය හැකිය.

රුවන් ජයවීර

යථාභූත ඥාණ දර්ශනය යනු ඇත්ත ඇති සැටියෙන් ප්‍රඥාවෙන් දැකීමයි. යථාභූත ඥාණ දර්ශනය යථා යනු ප්‍රකෘතියයි. ප්‍රකෘතිය යනු ඇත්තයි. එකම ඇත්ත අනිත්‍යයි. භූත යනු ප්‍රකට බවයි. විද්‍යමාන වන බවයි. හටගත් බවයි. ඥාණ දර්ශනය යනු විදසුන් නුවණින් දැකීමයි. පාඥාවෙන් දැකීමයි. නිරන්තරයෙන්ම අතරක් නැතිව පටිච්ච සමුප්පන්න බව හෙවත් ඉධප්පච්චයතාව ධම්මට්ඨිතිතාවය ධම්ම නියාමතාවය අනිත්‍ය තුළ විද්‍යාමාන යි. ඇත හෝ නැත නොපැනවිය හැකි බවයි. ඇත (අත්ථි) හෝ නැත (නත්ථි) හෝ පනවන්න මට ගත් බවක් හෝ නිරුද්ධවීමක් පෙන්නුම් කළ නොහැකිය. සියලුම ශක්ති (සුද්ධධම්මතා)වල ප්‍රකෘතිය මනසට දැකිය නොහැක. ගෝචර වනුයේ නුවණැසටය. යථාභූ. ස්වභාවය ගෝචර වනුයේ ලෞකිකත්වයට නොව ලෝකෝත්තර විදසුන් නුවණටය.

ලෝකෝත්තර ස්වභාවය යනු අසංකතයි. අසංකාරයි. ලෞකික ස්වභාවය සංකලයි. සංකාරයි. සංකාර යනු හටගත්තා වූ සුද්ධ ධර්මයන්ගේ (පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාශ, විඥ්ඥාණ) සාමූහික ප්‍රවර්තනයයි. මේ ස්වභාවය ඉතා ගැඹුරුය. අතක්කාවචරයි. පණ්ඩිත වේදනීයයි. නිපුණයි. දුද්දසයි. දුරනුබෝධයි. සුවිසුද්ධයි. පරිසුද්ධයි. ඉඳුරන්ට ගෝචර නොවන ප්‍රඥාවෙන්ම දතයුතු සිතුවිලි ෂත්‍ය පදනම්ව සිදුවන බව කිව නොහැක.

සිතුවිලි යනු භෞතිකත්වයකි. භෞතිකත්වය යනු ලෞකිකත්වයකි. ලෞකිකත්වය මත හටගන්නා සිත දුෂ්ටි සම්මිශ්‍රණයකි. සම්මා දිට්ඨිය ද මිච්ඡා දිට්ඨිය ද දිට්ඨි වේ. ක්‍රියා සිත් හෙවත් ලෝකෝත්තර සිත් ලෞකිකත්වය ඉක්මවා ගිය බැවින් දුෂ්ටිගතව නැත. දිට්ටිංච අනුපගම්ම යනුවෙන් වදාළේ සම්මා දිට්ඨියත් මිත්‍යා දුෂ්ටියත් නොමැති බවයි.

යථාභූතයේ සිතුවිලි හටනොගැනීම, නිර්මාණය නොවීම නිසා සංඥා නොමැති තැන සිතීම තුළ අල්ලා ගන්න පවතින්නට තැනක් නොයෙදේ. නිමිති නැත. සිතුවිලිවල ශාපේක්ෂතාවක් නොමැත. ඇත හෝ නැත නොයෙදේ. විඥ්ඥානයේ නිරෝධයෙන් පිරිසිදු මනසේ ප්‍රකෘතියට පත්වේ. එහි සංඛාර නොමැත.

"විඥ්ඥානස්ස නිරෝධෙන
නත්ථි දුක්ඛස්ස සම්භවො"

හිත හෙවත් දුක හටනොගැනීම යනු විඥ්ඥානයාගේ නිරෝධයයි. සංකල්ප විරහිත බවයි. විදර්ශනාවද ඉකාමවා ගිය බවකි. අමනසිකාරය නම් වූ තත්‍වයකි. රූප සංඛාර විරහිතයි. ඉධප්පච්චයතාවයි. විඥ්ඥානයාගේ ප්‍රකටවීමක් නොයෙදෙන තැන මහා ප්‍රඥාවයි. රෝධයේ සමාපත්තියයි. යථාභූත ඥාණ දර්ශනයේදී එය හෝ මෙය නැතහොත් ඇත හෝ හුදකලාවක්මය. අනිමිත්තය අනිමිත්තය පමණකි. සුඤ්ඤතය සුඤ්ඤතය පමණි. යථාභූත ඥාණදර්ශනය යථාභූත ඥාණ දර්ශනයක්මය. අමනසිකාරය අමනසිකාරයම පමණි. ද්වතාවයක් නැත. නිවීම නිවීමක්ම පමණි. නිවන නිවනමයි. හුදකලාව හුදකලාවක්මයි. එහි පදනම් නැත. නිවීම හෙවත් නිවන් ලබමියි සංඥාත්මක ක්‍රියාදාමයකට අවතීර්ණවීම වරදවා ගැනීමකි. ෂත්‍ය සෙවීමට අනවශ්‍යයි. හේතුව ෂත්‍ය ෂත්‍යක්ම නිසා. ඔබට තියෙන්නේ ලෝකයෙන් හෙවත් හිතෙන් නිදහස්වීම පමණි. ප්‍රකෘතියෙන් ම සිත පිරිසිදුයි. ෂත්‍ය දකින විට සිත වසාගෙන සිටින කෙලෙස් ධර්ම දුරුවෙනවා ඇත. විඥ්ඥානය යනු ක්‍රියාදාමයකට සමාරම්භයකට අවතීර්ණ වීමකි. බුද්ධ භාෂිතය වනුයේ,

"අනිස්සිතොච විහරති
නච කිංචි ලොකෙ උපාදියති"
යනුවෙනි.

නොඇලුනෙක්ව වාසය කරන්නේ නම් උපාදානයට නොයන්නේය. මෙහි අනිස්සිතො යනු විඥ්ඥානය හටනොගැනීමේ ස්වභාවයයි. නිමිති නොගැනිමයි. නිමිති නොගැනීම නිසා විඥ්ඥානය හට නොගනී. එවිට විතක්ක විචාර නොමැත. නිර්වින්දිතයි. ආනාත්මයි. රූපය හා සාපේක්ෂ නොවන විදර්ශනාවයි. ඒක චාරිවීමයි. මුනිබවයි. මනසින් මවන දේ මායාවයි. ෂතිය ඇති තැන මායාව ඉවත්වේ. ධාතු රාශිභූත වීමේදී

# කිසිවක් නොසොයන්න...හමුවීමට කිසිවක් නැත



ධර්මතාවයකි.

මේ ධර්මතාවය ආධ්‍යාත්මික බාහිර බවද ඉක්මවා ගිය තත්වයකි. නිර්මාණාත්මක සිතුවිලි වල අක්‍රියතත්වයකි. සිතුවිලි ලෝක ධර්මයකි. සංකතයි. භෞතිකත්වය පදනම්ව මොනයම් හෝ පනවා ගැනීමක් අපේක්ෂාවක් බලාපොරොත්තුවක් වේ නම් ඒවා සීමා මායිම්ව වැටකොටු ගසා හිරකරගෙන මානසික ක්‍රියාකාරකමකට යටත් ය. එවිට යථාර්ථය ඇත්ත වැසී යනු ඇත. ස්කන්ධ විරහිත යථාර්ථය යනු සුන්‍ය හෙවත් හිස් බවකි. සංඥා නිරෝධයයි. එයට අනිමිත්ත නම ද යෙදේ. අනිමිත්ත නිමිති සංඥා නොමැති බවයි. සුඤ්ඤත සාධිය නමද යෙදේ.

සුඤ්ඤත යනු හිස් බවයි. පරම අනු උත්තර පරමානුත්තර සිතා ගැනීමටත් නොහැකි ඉතා සියුම් අනු හෙවත් සංඥා ඉක්මනා ගිය අනු ඉක්මවා ගිය ශක්තීන් ඉක්මවා ගිය පරමානුත්තර ධර්මතාවයකි. විඥ්ඥාන විරහිත ප්‍රඥා විමුක්තියයි. චේතනය නොවීමේ ධර්මතාවයයි. දස අංගයන්ගෙන් සමන්විත අර්හත් ඵල චිත්තයයි. දස අංගෙහි සමාන්නා ගතො අහරතොති වුච්චති ති. ආර්ය අෂ්ඨාංගික මාර්ගය පරිපූර්ණ වූ පසු ඇතිවන සම්මාඥාන සම්මා විමුක්ති ඥාණ දර්ශනයයි. මේ අංග දෙක හෙවත් සම්මාඥාන, සම්මා විමුක්ති දෙක පරිපූර්ණ වීමේදී නිරාවරණ ඥාණය පහල වේ. ඒ අර්හත් ඵල සිතයි.

ආර්ය පර්යේෂණයේදී ධර්මය ගවේෂණයේදී ඉතාමත් වැදගත් වන්නේ ෂතියයි. සසරින් එතෙරවිය හැක්කේ ෂතියෙනි. යානි සෝතානි ලෝකස්මිං ෂති තේසං විවාරණං තථාගත දර්ශනයයි. (කාමෝඝ, දිට්ඨි ඕඝ, භවෝඝ, අවිජ්ජා ඕඝ) සසර සැඩපහරට හසුවී භවයට යාම වළක්වාලීමට නම් ෂතිය අත්‍යවශ්‍යයි.

මොනයම් හෝ ක්‍රමයකින් සංකතවූ රූප සංඥා, ශබ්ද සංඥා, ගන්ධ සංඥා, රස සංඥා, පොට්ඨබ්බ සංඥා, ධම්ම සංඥාවන්හි යථාර්තය හෙවත් ඇත්ත ඇති සැටිය ඉඳුරන්ට ගෝචර නොවේ. භෞතික කිසිම දෙයක හටගත් කිසිම දෙයක ඒකියත්වයක්, ස්වකීයත්වයක් එකම මොහොතක එකම අයුරින් ස්ථාවර පැවැත්මක් ප්‍රකට නොවේ. නිරන්තරවම හෙවත් අතරක් නොමැතිව වෙනස් වේ. ඒ නිසා ලෝකධර්මයන් පදනම්ව හටගන්නා සිත හා නැත මත මනදෝලනය නොවේ. අස්ථි නස්ථි සංකල්ප බවෙන් මිදීමයි. එනම් අමනසිකාරයයි.

මේ සම්මා දක්ම අසා ගැනීමෙන් පොතපතින් උගත්කමින් නොපිහිටයි. ආධ්‍යාත්මික නිවීමෙන් ලබන සුව තව් කොපි කිරීමක් නොවේ. වෙස්වලා ගැනිමක්ද නොවේ. චරිත නිරූපණයක් ද නොවේ. චිත්ත පාරිශුද්ධියෙන් ලෝකෝත්තර සැප විදිමි යි අපේක්ෂා කිරිම ආත්මගත දුෂ්ටියකි. හේතුව නිවන හේතුවක ඵලයක් නොවන නිසා. හුදකලාව සංඥා මැවෙනවා. මේ රූප සංඥාවන්හි ප්‍රකෘතිය ධර්මානුකූලව නොදැනීම නිසා නිත්‍ය, සැප, ආත්ම දුෂ්ටිගත වෙනවා.

**පූජ්‍ය සිරි සීවලී හිමි**

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

**අථච පණ මම සාවකා මයා
එවං ඔවාදිය මානං එවං අනුසියමානං
අප්පෙබෙච අච්චන්ත නිට්ඨං නිබ්බානං
ආරාදෙන්ති ඒකච්ච නාරාදෙන්ති එත්ථක්‍යාහං
බ්‍රහ්මණ කරොමි මග්ගක්ඛායිහං බ්‍රාහ්මණ යථාගතෝති**

ගණක මොග්ගල්ලාන සූත්‍රයේ සඳහන් මෙම බුදුවදනේ තේරුම මම මෙලෙස අනුශාසනා කරද්දී ඇතමුන් පරම අපේක්ෂාව වන නිවන අවබෝධ කරගනිති. ඇතමුන් එය නොලබති. ඉතින් මා කුමක් කරම්ද? තථාගතයන්ගේ කාර්යය මාර්ගය කියාදීම පමණකි යන්නය.

බුදුරජාණන් වහන්සේ දෙසූ ශ්‍රී සද්ධර්මය සර්වකාලීන බව අප කවුරුත් පිළිගන්නා සත්‍යයකි. අද එය ලොව පුරා පැතිර යන්නේද බුදු දහමේ ඇති විශ්වීය යථාර්තය දිනෙන් දින අවබෝධවන හෙයිනි.

කෙසේ වුවද වත්මන් ශ්‍රී ලංකාවේ ආගමික පසුබිම විග්‍රහ කළ විට අපට ඇතිවන්නේ බලවත් කණගාටුවකි.

ඉතා මෑත දිනවල ජනමාධ්‍ය වාර්තාකළ පුවත් කීපයකින්ම හෙළිවූයේ මෙරට බෞද්ධයින් හා බෞද්ධාගම විෂයෙහි මහා ගැටළු රැසක් පැණනැගී ඇති බවය.

හුදු ලාභ අපේක්ෂාව මිස සමාජ දැක්මකින් තොර මාධ්‍ය සංස්කෘතියක් මෙරට බලහත්කාරයෙන් ගොඩනන්වා තිබේ. ඔවුහූ මෙරට සමාජය සුඛිත මුදිත හා කිසිදු සමාජ ගැටළුවකින් තොර සාමකාමී විනෝදයම මුල් කොට ගත්තක් බව පෙන්නුම් කරති. බොහෝ විද්‍යුත් මාධ්‍ය අළුයම් කාලයේ සිට රාත්‍රිය දක්වා පෙන්වන වැඩසටහන් සියල්ල විමසිල්ලෙන් බැලීමේදී ඒ බව පසක් වෙයි. නමුත් ඒ සියල්ල කණපිට හැරවෙන්නේ විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රවෘත්ති විකාශනයන්ගෙනි. ඒවා පිරී ඇත්තේ ප්‍රචණ්ඩත්වය, ඝාතන, මංකොල්ල, කාම අපරාධ, රිය අනතුරු, උද්ඝෝෂණ, පිකටින්, වැඩවර්ජන, පරිසර දූෂණ අදී සියළු මානව විරෝධී ක්‍රියාවන්ගෙන්ය.

සසුන හැර යන භික්ෂූන් පිළිබඳව හා බෞද්ධයින්ගේ උපත් ප්‍රතිශතය අඩුවීම මෑත මතුවුණු විශේෂිත වාර්තාවන්ය.

මම සෝවාන් වීමි, මම සකෘද්ධාගාමී වීමි, මම බුදු වීමි'යි කියාගත් නානාවිධ පුද්ගලයන් මෙකල බහුලය. සෝවාන් බවට සකෘද්ධාගාමී බවට සහතික හා ඩිප්ලෝමා දෙන ආයතනද තිබෙලු. මේවාට එරෙහිව පැන නගිමින් ඇති ප්‍රතිවිරෝධයද සුළුපටු නැත.


භාවනා වැඩමුළු හා ධර්ම දේශනා, විවිධ පෙරහැර හා පුද පූජා ආදී ලෙසින්ද රට පුරා විවිධාකාරයේ ආගමික කටයුතු රැසක් සිදු වෙයි. ඒ සියල්ලට බුදු දහම මුල් කොට ගත්තද ඒවායේ ක්‍රියාව හා ප්‍රතිඵලය බුදු දහමට අනුකූල නොවන බවට චෝදනා රැසකි.

ඒ අතරම ඉර, හඳ, ගස් ගල් තාරකාවෝද සෙනසුරු රාහු කුජ ඇතුළු දියලු ග්‍රහයෝද, චීන අරාබි බටහිර වාස්තු හා අභිචාර ක්‍රමයන්ද සීග්‍රයෙන් රට තුළ පැතිර යමින් පවතී. ඉන් බොහෝමයක් බුදු දහම දෙවනි තැනට දැමීමට තරම් සමත්ය.

මේ සියල්ල සිදුවන අතරතුර පවා ජනී ජනයා වැල නොකැඩී කපිල වස්තුපුර ශ්‍රී සර්වඥධාතූන් වහන්සේලා වැඳ පුදා ගැනීමටත් විශ්ව ශාන්ති ජේඩ් බුදු පිළිම වහන්සේ වන්දනාමාන කිරිමටත් පෙළගැසීමෙන් පෙනී යන්නේ බුදු සරණ හැර අන් මඟක් නැති බව විදහාපාන ආශ්චර්යවත් බෞද්ධ ප්‍රබෝධයක් ඇතිවන බවයි.

ලොව සැබෑ ආශ්චර්ය පෙන්වා දුන්නේද ඒ යන මඟ කියා දුන්නේද අප බුදුරජාණන් වහන්සේමය.

මේ සියල්ල අනුව මෙරට බෞද්ධයා මනා සිහියෙන් හා සැබෑ අවබෝධයෙන් යුතුව කටයුතු කළ යුතු සමයක් උදාවී ඇති බව ඉතා පැහැදිළිය. රජය ඊට මැදිහත් විය යුතුය. සියලු මාධ්‍ය සැබෑ මඟ පෙන්වා දීමට කැපවිය යුතුය. භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකාවන්ද යථාර්ථයම දැක ඒ අනුව කටයුතු කරන්නට තදින් අදිටන් කරගත යුතුව ඇත.



# සුන්දර සුරූපී සෞභාග්‍යමත් දිවියකට බුදු දහමින් අමා ඔසු

අප සියල්ලෝම කරන්නාවූ සියළු පින්, පව් කරත්තය බැඳි ගොනුන්ගේ පා අනුව යන්නාවූ කරත්ත රෝද මෙන්ද, අප යන එන සියළු තැන්හී අප නොහැර යන සෙවනැල්ල මෙන්ද අප පසුපසින්ම එන්නේය.

කිසිවෙකුත් සසරෙහි දුක් විඳින්නට කැමති නැත. අපාදුක් විඳින්නටනම් කොහෙත්ම අකමැතිය. අපා දුක් විදිනු තබා අපාය ගැන ඇසීමටද අකමැතිය. එහෙත් එයින් මිදීම සඳහා නොකළයුතු දේ ද අප නොදනිමු. දෙව් මිනිස් සැප ලැබීමට කළයුතු කම් ද අප හරියට නොදනිමු. අප මරණින් මතු යන්නේ කොතැනකටද කියා සිතීමට තබා මේ අප ගෙවන ජීවිතය ගෙන යන්නේ කොතැනකටද? මා යනු කවරෙක්ද? මා කළ යුත්තේ නොකළයුත්තේ මොනවාදැයි කියා හෝ ඔබ දන්නේ නැත. සමාජයේ කාලයෙන් කාලයට එන විලාසිතා අනුගමනය කරමින් එන සමාජ රැල්ල දිගේ ගසාගෙන යයි. එබැවින් ඔබට යායුතු තැනට යාමට ශක්තියක් නැත.

බුදු දහම වනාහී යන රැල්ලට යන්නාක් නොව 'පටිසෝතගාමී' ප්‍රතිපදාවකි. එනම් පසුපසින් හඹාඑන පීඩනයට හසුව ගඟ දිය ගලන්නාක් මෙන් ඉදිරියට තල්ලුවෙමින් අනන්ත සසරේ දුක් විදිමින් නොඇවිද ප්‍රඥාව යොදා ගනිමින් අපාදුකට පත්නොවන සසර නිමා කරන අරි අටගි මඟ හෙවත් මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ යුතුය.

මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන්නට මත්තෙන් ඔබ ඔබගේ ජීවිතය සතර අපායෙන් තිරිසන්, ප්‍රේත, අසුර නිකායෙන් වලකාගෙන මේ මනුෂ්‍යත්වය ආරක්ෂා කරගත යුතුය. ඒ සඳහා අකුසලයෙන් පාපයෙන් තොර කුසලයෙන් පිනින් පිරිපුන් ජීවිතයක් ගත කළ යුතුය.

එම ජීවිතය සකසා බුද්ධ කාලීන උපාසිකා චරිතයක් උපයෝගී කරගනිමු. සම්බුදු පියාණෝ දිවමන් අවධියේ භද්‍රවතී නුවරට අභිවාහතක නම් බෝවන රෝගයක් විය. මෙම රෝගය යම්කිසි නිවසකට පැමිණිය හොත් ගස්කොළ සතා සිවුපාවගේ පටන් සියළු දෙනා විනාශයට මරණයට පත්වෙති. රෝගය හඳුනාගත් යමෙක් ගෙයි බිත්ති සිදුරු කොට පලාගියහොත් මරණයෙන් බේරිය හැකිය. භද්‍රවතී මැඳුරටද මෙම රෝගය පැතිරුණි. සිටුතුමා සිය බිරිඳ හා දියණියද කැටුව ගෙයි බිත්ති සිද නුවරින් නික්ම කොසඹෑනුවර විසූ ඝෝෂක නම් සිය මිතුරු සිටුතුමන් වෙත යෑමට පිටත් විය. දින කීපයක් පුරා පාගමනින් ගමන්කළ මොවුහු කොසඹෑ නුවරට පැමිණියහ. ගමන් විඩාවෙන් පසුවුණ ඔවුහු අපවිත්‍ර ඇඳුම් සේදා නා පිරිසිදුව මිතුරා හමුවීම සුදුසු බැවින් අම්බලමක නැවතී නා පිරිසිදුවී මිතුරා හමුවීම සුදුසු බැවින් අම්බලමක නැවතී ඝෝෂක සිටුතුමන් අසරණයන් උදෙසා ආහාර දෙනු ලබන දන්හලකින් ආහාර ගෙන අනුභවකිරීමට සිතීය. එසේ සිතා සිය දියණියන් දන්හලට යැවීය. ලැජ්ජාවෙන් මිරිකෙමින් දන්හලවෙත ගිය භද්‍රවතී සිටු කුමරිය තුන්දෙනෙකු සඳහා ආහාර ගෙනවිත් මව් පියන්ට දුනි. බොහෝ දිනකින් කුස පුරා ආහාර ගත් බැවින් පළමු දින සිටුතුමාද, දෙවන දින සිටුදේවියද කළුරිය කළහ. තෙවන දින එක් අයෙකුට පමණක් ආහාර ගනු දුටු මේ යෞවණිය කවරෙක්දැයි දන්හල් හිමියාට විමසන්නට සිතුනි. ඇගෙන් තතු විමසීමෙන් අනතුරුව දන්හල් හිමියා කුමරිය සිය නිවසට ගෙන ගොස් දියණියක සේ ඇති දැඩි කළේය.

මේ කුමරියට සසර යම් අකුසලයක් තිබූ බැවින් මෙසේ මව්පියන් අහිමි වුවද, කරතිබූ පුණ්‍ය මහිමයෙන් කාරුණික පියෙක් වහා ලැබගති. ඇය සසර කර තිබූ පින්මහිමයෙන් රූප සම්පත්තිය, කුල සම්පත්තිය පමණක් නොව ප්‍රඥා සම්පත්තියද නොඅඩුවම ලබා තිබුණි. පියා සමඟ දන් හලට පැමිණි ඇය දන්හලේ දිනපතා ඇති කෝලහාලය දක්නට ලැබුණි. එනම් දන් ලබන්නට එන අසරණයින්ට ඇතුල්විමටත්, පිටවීමටත් තිබුණේ එකම දොරටුවක් බැවින් නිතර ඔවුහු කෝලාහල කරගනිති. එබැවින් ප්‍රඥාවෙන් යුතු මෙම කුමරිය මේ කෝලහාලය නතර කිරීම පිණිස පියතුමාට උපදෙස් ලබාදුණි. එනම් මේ මහා දොරටුව එක් අයෙකුට පමණක් ඇතුල් වීමට සලස්වා පිටවිමට අනෙක් පසකින් දොරටුවක් තබන ලෙසය. මෙම උපදේශය පිළිපැදීමෙන් දන්හලේ වසර ගණනාවක් තිබූ කලබලය ඝෝෂාව නිමා විය. සාමය සතුට ඇති විය. එබැවින් මෙම කුමරියට 'සමාවතී' යැයි නම් කළහ.

දන්හලේ නිශ්ශබ්දතාවය නිසා දන්නොදෙන්නේ දැයි ඝෝෂක සිටුතුමාට සැකයක් ඉපිද ඒ පිළිබඳව දන්හල් හිමියාගෙන් අසා සාමාවතී කුමරියගේ ප්‍රඥාවෙන් දන්හලේ සාමය ඇති වූ බවත් මේ කුමරිය මිතුරු භද්‍රාවති සිටුගේ දියණිය බව දැන සිටු මැඳුරට ගෙන්වා ඝෝෂක සිටුතුමාගේ දියණිය ලෙස එතැන්පටන් වාසය කළේය.

තමා කළ පින කිසිවෙකුටත් කිසිම හේතුවකින් නවතාලිය නොහැක. ඝෝෂක සිටු මැඳුරේ මහා සම්පත් විදිමින් හැදෙන වැඩෙන මේ රූමත් ප්‍රඥාවන්ත කුමරිය ගැන දැනගන්නට ලැබුණ උදේන රජතුමා ඈ රජමැදුරට ගෙන්වා කුමරියන් පන්සීයක් පිරිවරකොට අගමෙහෙසුන් කළාය.

මෙසේ රාජ අගමහේෂිකාවක් වීමට, රූප සම්පත් ලැබිමට, ප්‍රඥාවෙන් යුක්ත වීමට, නිරෝගි බව ලැබිමට රාජ යස ඉසුරු ලැබීමට ඈ සිදුකළ දේ මොනවාද?

බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා උදෙසා ඉතා ශ්‍රේෂ්ඨ ආකාරයෙන් අග්‍රකොට දානාමානාදිය, සිවුරු පිරිකර, බෙත්හේත් පූජා කිරීමටත් රෝගීන්ට උපස්ථාන කිරීමටත් ගරු කළ යුත්තන්ට ගරු කිරීමටත් මව්පියන්ට සුවච කීකරු වීමත්ය.

එහෙත් වත්මන් යුගයේ රැල්ලට ගසාගෙන යන ඔබ ඔබට නැති රූප සම්පත ලබාගැනීම සඳහා විවිධ උපක්‍රම, ආලේපන, ඖෂධ සෙවීමට වෙහෙසෙති. තමාට ගැලපෙන, නොගැලපෙන විවිධ ඇඳුම්, පැළඳුම් සෙවීමට අධික ලෙස මුදල් සොයති. ඒ සඳහා වෙහෙසෙති. මේ සෙවීම පිළිබඳ ඔබේ සිතට සහනයක් නැත. නැවත නැවත තව තවත් දේවල් සොයති. ඒ සඳහා වෙහෙසෙති. මේ සෙවීම පිළිබඳ ඔබේ සිතට සහනයක් නැත. නැවත නැවත තව තවත් දේවල් සොයති. මෙහි කෙළවර වන්නේ විවිධ රෝග පීඩාවන්ට ගෝචර වී මරණයට පත්වීම පමණි. ඒ හිස් මරණයෙන් පසු නැවත ඔබට යහපත් මනුෂ්‍ය ජීවිතයක් නැත. මනුෂ්‍ය ජීවිතයක් ලැබුණත් රුව,ණැන,ගුණ ලැබීමට ඔබ කළ පුණ්‍ය කර්මයක් නැත. එමනිසා ඔබට අවශ්‍ය කරන ලෞකික ලෝකෝත්තර සම්පත් ලබාගැනීම පිණිස උසස් මනසක් ඇති මිනිසුනි ඔබේ ප්‍රඥාව පුබුදුවා කළ යුතු යහපත් දේ සිදු කිරීමට වහා උත්සුක වන්න. නැතහොත් සිදුවන්නේ කුමක්දැයි සමාවතී චරිතයෙන්ම අවබෝධ කරගන්න.

මෙසේ උදේන රජුගේ අගමෙහෙසුන්ව රජුගේ සිත් දිනාගනිමින් රාජ සම්පත් විදිමින් ගත කළ සාමාවතී ඇතුළු මේ බිසෝවරු පන්සිය එක් දෙනාට සසරෙහි කර තිබූ තවත් පුණ්‍යකර්මයක් විපාකදීමේ කාලය එළඹිණි. එනම් ලොව්තුරු අමා දහම පානය කොට මාර්ගඵල ලැබීමයි.

සමාවතී ඇතුළු පිරිසට මල්ගෙනවිත් දීම ආදී මෙහෙකිරීමට ඛුජ්ජුත්තරා නම් දාසියක් විය. ඈ දිනපතා සුමන මාලාකරුගේ නිවසට ගොස් බිසෝවරුන්ට පැළඳීමට මල් ගෙනෙන්නීය. මෙම දාසිය උපතින්ම කුදුවූ කාන්තාවකි. දාසියකි.

15 පිටුවට...

**ගොකරැල්ල ශ්‍රී ධර්මප්‍රදීපාරාමාධිපතිණී
ශාස්ත්‍රවේදී පූජ්‍ය වත්තේගම කුසලධම්මා මෙහෙණිය**

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.




## නිකිණි පොහෝදා

සම්බුදු පිරිනිවීමෙන් තෙමසක්   ගතවූදා
අනඳ තෙරුන් වැඩුවේ විදසුන්   එමදා
සසර දුක නිවී නිවනට පත්වූ   දා
අර්හත් ඵලය ලැබ නිවනේ හිමි   අනදා

දහම් ගැටළු විසඳන්නට එකතු   වුනේ
තෙවලා බුදුවදන් ගැන තිරණ   ගැණුනේ
පිරිසිදු දහම මේ යැයි සම්මුති   වෙමිනේ
සඟසඟණ සැවොම එක්සත් වි   තුටිනේ

ජනතාවට දහම් දෙසුමට වෙහෙරෙහි   සැමදාම
රැකගත යුතුය වස්ශීලය නිරතුරුවම   බොහොම
පෙර වස් ලබන්නට බැරිවූ   සැමදෙනම
පසුවස් විසිය යුතුවිය එලෙසිනි   සැවොම

ලැබගත් මිනිස් ජීවිතයේ වටින   කම
කියන්නට හැකිද පුහුදුන් ලෙස මෙ   මම
බුදුවදනින් ලැබෙන සැනසුම වෙන   කොහොම
මගඵල ලැබූ සඟසඟණ පවසති   මෙහෙම

සඳහම් අමා පැන් සැමහට   ලැබේවා
අදිටන් බලෙන් ඒ බව අවබෝධය   වේවා
දුක් දොම්නස් සිතෙහි සැම හදවත්   දුරුවේවා
සැම සත් වෙතම මේ බව දන්   වැටහේවා

**අජන්තා ශිරෝමණී දිසානායක - තලවත්තේගෙදර**

## ඉසිපතනය කියයි තොරතුරු අවදිවෙමින්...

කුරවි කෙවිලි හඬ අහෙනවා වනය   තුළින්
දම්සක් හඬ මුමුණනවා උන්ගෙ   බසින්
සඳරැස් වැටී වනපෙත දැන් නවමු   වෙමින්
ඉසිපතනය කියයි තොරතුරු අවදි   වෙමින්

පස්වග සවුවො විසුවේ මෙම අරණ   තුළයි
ඔවුන් සොයා බුදුහිමි මෙහි වැඩි   ගමනයි
ලොවට දුන්නෙ මා හැඟි අම රස   නිවනයි
ඉසිපතනය බොදු ඉතිහාස ඔප   ගන්වයි

ඇසළ පොහොය මතුකර දෙන දහම්   පද
පළමු දෙසුම ලෙස පතළව ලොවට   තෙද
පස්වග තවුසො බණ පද ඇසු මෙවන   මැද
අමරස තිබේයි ඉසිපතනේ තව   නොමද

වනමල් පිපෙයි බුදුහිමිගේ නමට   තවත්
බණපද ගොතයි තුරුලිය කැළලක්ව   තවත්
සුවහස් දෙවි බඹුන් එක්වී මවා   පුවත්
නොලස බෙදයි ඉසිපතනෙන් ලොවට   අදත්

සසරින් එතෙර වීමට පහුරක්   වීලා
ඉසිපතනය බොදු ඉතිහස එකලු   කළා
වනය එළිය කළ මිගදා මුවන්   කැළා
අදටත් ඉදියි ඉසිපතනේ තනි   නොබලා

**ආචාරිනී එස්. සමරසිංහ**

## බොදු හදවත් පිබිදේවා

වෙසගෙත් පොසොන් පෑ පුන් සිසි ඉගිල   ගියා
අපි දැන් බලමු ඇසළෙහි සඳහ නැගෙන   නියා
පවසන්නට තිබේ එම සඳ කළ   කිරියා
තෙරුවන් නමැඳ මම යම් සරසවිය   සොයා

පායා නැගී එනවිට ගුවනේ ඇසළ   සඳ
මායා දේවි කුස පිළිසඳ බෝසත්   සමිඳ
යසෝදරා පුතු බිහිකළෙ දැක ඇසළ   සඳ
සිදුහත් නිරිඳු ගෙන් පිටවුනෙ එළියෙනි ඇසළ   සඳ

සය වසරක්ම දුක් විඳ ලැබූ බුදු   බවද
පළමු දෙසුම දෙසනුයෙ දැන් කා   හටද
සිහිවිනි එකට සිටි පස්වග   තවුසනද
බරණැස ඉසිපතනයට වැඩියා බුදු   සමිඳ

පායා තිබුණි එදිනත් ගුවනෙහි ඇසළ   සඳ
දම්සක් සූතුර දෙසුවා පස්වග තවුසො   මැද
ලැබුවා කොංඩඤ්ඤ එහි මුල් ඵලය   සොද
අද අප දකින්නෙත් ගුවනෙහි ඒ ඇසළ   සඳ

තිලොවට තිලක මගෙ සම්බුදු   පියාණෙනි
ඔබ දෙසූ දහම 'මඟ වන්නට දිරි   ගමිනි
ඇහළ මලින් ඔබෙ පුදසුන   සරසමිනි
පැතුමක් පතමි මතු බුදු හිමි දකින   මෙනි

ඇසළ සඳේ කරණින් බොදු හදවත්   පිබිදේවා
අරි අට මගෙහි යන්නට සිත්   දිරිදේවා
උපදින හැම භවයකම අප සිල්වත්   වේවා
මතුමෙත් බුදුන් දින නිවනින්   සැනසේවා

**මහකනදරාවේ ආර්.ඒ.ලීලාවතී පෙරේරා**

## ඉකිබිඳුම

*පරිසරය ...... පරිසරය......*
*කවුරුත් කතා කරති*
*කවුරුත් අගයති*
*බලන්නට යති*
*නෙත සනසති*
*එහිම කති බොති...*
*කියවති.... බලති...*
*එපමණකි*
*පරිසරය සුරකින්න*
*කවුරුත්ම නැති.....*
*කෑ තැන, හිඳි තැන*
*පොලිතින්ය, බෝතල්ය, කා දැමූ*
*ඉඳුල්ය....*
*දුගඳය පිළිකුල්ය...*
*නැත සුන්දර ..... වි අසුන්දර...*
*අහෝ......*
*ඉකිබිඳී පරිසර මාතාව......*

**පූජ්‍ය මහව සිරිධම්මචාරි මෙහෙණින් වහන්සේ**
**පොල්පිතිගම**

## මට සරණක්....

සම්බුදු මැණිකෙ රැස් කදඹින්   ඕදාත
තෙදියත එකළුවිය දම් සුවදින්   සීත
නැණ පහනින් මඟක් පෙන්වා දුන්   මෑත
අංගී රස මහිම් තිලොවට විය   නාත

පිබිදුන පියුම ගුණ නුවණින් ගයා   හිස
සිව්සස් දහම වටහා දී අමා   රස
සදහම් දිය දහර සිව්දෙස ගලා   බැස
සෝදා හලේ ඔබමය හිමි අපේ   ඇස

නැණැසට හසුනොවන බලවත් දේ   මත්තේ
පුද පූජා දෙමින් බලතල රැක   ගත්තේ
අසරණ සතුන් බිලි වූ ජීවිත   මත්තේ
සමයෙක සමිඳ ඔබ අප ගලවා   ගත්තේ

දුකින් මිදෙන මග අතහැර යාම   කියා
තම ජීවිතය තුළට ඒ බව රැදුණ   නියා
ලොවටම පසක් කර නොමියෙන දහමෙ   ලියා
විශ්වය දිනුවේ සම්බුදු සෑසි   පියා

මිසදුටු අඳුරු දුරුකළ මිණි පහනක්   වී
බැබළුණු පියාණෙනි තෙදියත මැණිකක්   වී
මා සැනසෙන්න අම නිවනින් සරණක්   වී
නිවුනාවේ මගේ හද ගඳ කිළියක්   වී

**විශ්‍රාමලත් පාඨශාලාචාරිනී**
**ජයන්ති මද්දුමාරච්චි - දොම්පේ**

## ඛනීය ගෝපාලයන්ගේ බිරිඳ කී කව

ගෝපාල නෙම කෙනෙහිය
සී සාන්නෙහිය
මම රකිමි උන් දරුවන් - කීකරු වූ
මනා කොට සෙවිලි කළ කුටියේ හිඳ

රැයෙන් දහවලෙන් කම් නැත
දැස් හැර පියා හිඳිමි
තුන් තිස් පැයට සිත ද අවදියෙනි

කවුළු පියන්පත් ද දොරගුළු ද සවිමත්ය
වැට ඉණි නොසෙල්වේ - සිඳුලිය නොහැක
සන්'ඳුරට බියක් නැත - ගිනිහල් ගෙය උණුසුම්ය

මම රකිමි අප දරුවන් - සෙනේබර වූ

චණ්ඩ හස්ති මහිස යකඩ ආදීන් ගෙන් නොව
නානා උපද්‍රව නානා භයින් නොව

නොහික්මුණු නොදමුණු
ළඟ නැයින්ගෙන්මය
දුර නැයින්ගෙන්මය
නොනැයින්ගෙන්මය

තුන් බියක් නැත
ඇත්තේ එකම බියෙකි
(අ) මනුෂ්‍ය බිය පමණක්මය



**දමයන්ති වීරසේකර**
**ප්‍රධාන පුස්තකාලය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

## පෙමින් බැඳි ජීවිතය


නේක තරු වැල් සැඳට පෙම් බැඳි මුත්...
ඉරට පෙම් බඳින්නට සිටින්නේ කවුරුන්ද?
සිසිලස ගෙනෙන මුත් සුළඟ...
දකින්න නැති ද ඇය අපට...
ගඟක් ගලා යන්නා සේ...
ගෙවිගිය මුත් ජීවිතය
අන් සියල්ලට වඩා
සියල්ලෝම පෙම් බඳින්නේ ජීවිතයට නොවෙද?
මා ඔබට පෙම් කළත් ඔබ මට පෙම් කළත්
අප ස්වභාවදහමට පෙම්කලත්...
අවසානයේ වටහෙන්නේ අන් සියල්ලට වඩා
අප පෙම් බැඳ ඇත්තේ ජීවිතයට බව..

**තෂ්මිලා නිෂාදි**

## රංගිරි දඹුලු රජමහා විහාර සංඝ සභාව විසින් නිකුත් කරන නිවේදනයකි.

# ත්‍රිපිටකයට අත නොතබනු






දේශපාලන පක්ෂ ඔවුන්ගේ දේශපාලනයේ පැවැත්ම සඳහා වෙනත් වෘත්තීය සමිති මෙන්ම 'දේශපාලන භික්ෂු වෘත්තීය සමිතිද' මැතිවරණ කොට්ඨාශ මට්ටමෙන් නිර්මාණය කර ගෙන ඇති බව රහසක් නොවේ.මැතිවරණ සමයේ සිය දේශපාලන පක්ෂයේ ජයග්‍රහණයට හා විරුද්ධ පක්ෂවලට එරෙහිව 'චීවරය' අවභාවිතා කරමින් ඔවුන් විසින් හැසිරෙන නිර්ලජ්ජී දසුන් අප රටේ පිළිවෙත් ගරු කරන සියලු බෞද්ධයන්ගේ සංවේගයට හා අප්‍රසාදයට හේතුවී තිබේ.එම දේශපාලන පක්ෂය ජයගෙන ආණ්ඩුව පිහිටුවීමේදී අනෙකුත් අනුග්‍රාහක ගිහි පුද්ගලයන්ට මෙන් ඉහත දර දිය අදිනලද භික්ෂු වෘත්තිකයන්ටද වරප්‍රසාද,දීමනා,උපදේශක ආදි තනතුරු පුද කරති. මේ අයුරින් භික්ෂු වෘත්තීය සමිති සේවකයෝ විශාල සංඛ්‍යාවක් දේශපාලන පත්වීම් ලැබ බුද්ධශාසන අමාත්‍යාංශය ඇතුලු අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු වල එම ආණ්ඩුව ඇති තාක් කල් සේවය කරන්නාහුය. මෙම භික්ෂු පිරිසගේ එක් කාර්යක් වී ඇත්තේ සිය ආණ්ඩුවේ ඇතැම් සැළසුම් වලට මහජන විරෝධතාවක් ඇතිවන අවස්ථාවල එම විරෝධතා මෙහෙයවීම තම අතට ගෙන දියාරු කිරීමය. නො එසේනම් මාධ්‍ය සංදර්ශන පවත්වමින් එම ආණ්ඩුවේ කටයුතු සාධාරණීය කරමින් ආණ්ඩුවේ සුදු හුණු ගෑමේ රාජ්‍යකාර්ය බවද අප සැම මැනවින් දකින සුලභ දසුනකි.ලෞකික ප්‍රශ්න සම්බන්ව එසේ වුවත් ප්‍රස්තුත යෝජිත ත්‍රිපිටක සංරක්ෂණ පනත ගැනත් තමන් ධර්මධර,විනයධර සියල්ල දත් අයවලුන් ලෙස පෙනී සිටිමින් මාධ්‍ය සංදර්ශන පැවැත්වීම අධර්මවාදී අපායගාමී පාපකර්මයක යෙදී සිටීමක් බව නොදැනීම ගැන අපි කණගාටුවෙමු. මෙසේ දේශපාලකයන් විසින් බුද්ධශාසනය ආරක්ෂාකොට සුරක්ෂිත කිරීමේ වගකීම කෙසේ වෙතත් ශ්‍රී ලාංකීය භික්ෂු සමාජය දේශපාලන පක්ෂවලට බෙදාගෙන නන්නත්තාර කර දැනටමත් විනාශ කොට කොට හමාරය. මෑතක සිට පිඹුරුපත් සැකසෙන්නේ ත්‍රිපිටක ධර්මය හෙවත් බුදුදහමත් විනාශ කිරීමටය.

අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වෙනි වගත්තියේ රජයට ඇති රාජ්‍ය වගකීම ඉටු කිරීම පිණිස යනුවෙන් හඳුන්වමින් පසුගිය ආණ්ඩුවේ උපදේශකයන්ගේ හෝ වෙනත් අඥානයනයන්ගේ උපදෙස් පරිදි හිටපු ජනාධිපතිවරයා විසින් ත්‍රිපිටකය ජාතික උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් මහා ඝෝෂාවක් කරන ලදි.වළගම්බා රජ දවස අලුවිහාරයේ ත්‍රිපිටකය ලේඛනගත කළාටත් වඩා තමා ත්‍රිපිකයට ඓතිහාසික ආරක්ෂාවක් ලබා දුන්නේය යන පණිවිඩය එම ත්‍රිපිටකය ජාතික උරුමයක් කිරීමේ උත්සවය අලුවිහාරේදීම පැවත්වීමට කටයුතු යොදාගෙන තිබීමෙන් පැහැදිලි විය.ජාතික උරුමයක් කිරීම යටතේ සිදුවූයේ වූයේ දැනට කෞතුකාගාර පුරාවස්තු ලැයිස්තුවට ත්‍රිපිටක ග්‍රන්ථද තවත් පුරාවස්තු ලෙස එක් කිරීමක් විනා වෙනත් ආශ්චර්යක් නම් නොවීය. එතැනින් නො නැවතී ත්‍රිපිටකය ලෝක උරුමයක් කිරීමටද පිඹුරුපත් සකස් කරමින් සිටියේය. එසේ වූයේනම් බෞද්ධ නොවන සාමාජිකයන්ගෙන් යුත් ප්‍රංශයේ ලෝක උරුම කම්ටුවට ත්‍රිපිටකයේ පූර්ණ අයිතිය හිමිවනු ඇත.එම ලෝක උරුම කම්ටුවේ අවසරයකින් තොරව කිසිවක් කළ නොහැකි වනු ඇත. විශ්වයේ පවත්නා අනන්ත ධර්මශක්ති බලයෙන් එම විනාශය කිරීමට ඉඩ නොතැබීය.

යෝජිත ත්‍රිපිටක සංරක්ෂණ පනතද ඉහත ජාතික උරුම වැඩ සටහනේ දෙවෙනි පියවර බව පනතේ ආරම්භයේදීම සඳහන් කර ඇති ඡේදයෙන් පෙනීයයි. පසුගිය ආණ්ඩුව පමණක් නොව අපිත් බුද්ධශාසනය වෙනුවෙන් ලොකු වැඩක් කොළා යන හීනමානයෙන් එකී පනත සකස්කිරීමේ එක් දේශපාලන ගුප්ත අරමුණක් බව පෙනීයයි. එසේම එම පනත පසුගිය මැතිවරණ කාලයේ ආණ්ඩුව වෙනුවෙන් දර දිය ඇදි ගිහි පැවිදි අයට තනතුරු දී වරදාන දීමට යොදා ගත් තවත් යාන්ත්‍රණයක් විනා ත්‍රිපිටක ධර්මයේ යහපතට නොව විනාශයට මග පාදන්නක් බවත් බුද්ධ දේශනාව නයින් පැහැදිලි කරගත යුතුව ඇත.

ත්‍රිපිටකය ජාතික උරුමයක් කිරීම මෙන්ම මෙම පනත ගෙන ඒමේ අභිමථාර්ය පාලි ත්‍රිපිටකයයේ හා අටුවා ටීකාවල අන්තර්ගත ඇතැම් වචන විකෘති කිරීම,වෙනත් අර්ථ දැක්වීම,විග්‍රහ කිරීම පිටපත් කිරීම, ආදියෙන් ත්‍රිපිටකය ආරක්ෂාකොට තැබීම බව කියැවේ මෙවැනි පනතක් ගෙන ඒමේ පසුබිම වශයෙන් වගකිව යුත්තන් පෙන්වා දෙන්නේ පසුගිය කාලයේ භික්ෂුන් ඇතුළු ඇතමෙකු ධර්මය විකෘති කරමින් දේශනා පවත්වීම,ත්‍රිවිධ රත්නයට අපහාස හා නින්දා කිරීම ,බුදුරජාණන් වහන්සේ උපන්නේ ලංකාවේ බවට කර ඇති සාවද්‍ය දුර්මත පාලනය කිරීමත්,එවැනි වැරදි කරන අයවලුන්ට අධිකරණය මගින් දණ්ඩණයන් පැනවීමටත් අවශ්‍ය නීති කාලීන අවශ්‍යතාවයක් ලෙසයි.සංඝ සමාජයේ හෝ බෞද්ධ සමාජයේ මෙවැනි කරුණු ගැටළු විසඳීමට බුදුරදුන්ගේ දේශනාවන් තිබියදී බාහිර නීති හා අණපනත් මගින් විසඳීමට ගන්නා මේ උත්සාහාහය කෙතෙක් දුරට බුදුරදුන් දේශනාකළ ධර්ම විනයට ගැලපේද යන්න විමසාබැලිය යුතුය.රහතන්වහන්සේලා විසින් බුදුදහම ලේඛනාරූඩ කිරීමෙන් පසු ත්‍රිපිටකය මැනවින් සංරක්ෂණය වී ඇත.එහි තවත් සංරක්ෂණයක් කරන්නට දෙයක් නැත.බුදුරජාණන් වහන්සේ අනුමත කර ඇත්තේ එම යෝජිත පනතින් කරන්න යන "දණ්ඩ කර්ම'' නොව "සංඝ කර්ම" ක්‍රමයයි..

"බුද්ධශාසනය" හා "බුදුදහම" යනු එකක් නොව දෙකකි. ත්‍රිපිටක අර්ථ කෝෂයේ ඇති අර්ථ නිරූපනය පරිදි 'බුද්ධශාසනය' යනු 'තථාගතයන් වහන්සේගේ ධර්මය මුල්කොට ඇති කරන ලද භික්ෂු-භික්ෂුණී, උපාසක උපසිකා යන සිව්පිරිසෙන් සැදි ආයතනය'යි යනුවෙනි. එකී ශාසනය චර්යාත්මක පැවැත්ම අනුව වෙනස් වෙමින් ඉදිරියට දෝලනය වන්නකි.ශාසනයේ ස්වභාවය එයයි. බුද්ධශාසන අමාත්‍යාංශයට අයත් එකම කාර්භාරය වන්නේද එකී සිව්වනක් පිරිසේ අභිවෘද්ධියට අදළ අවශ්‍ය කටයුතුය. අමාත්‍යාංශය මෙතෙක් කර ඇත්තේ බුදුරදුන් වදාළ බෞද්ධ සිව්වනක් පිරිස විකෘති කිරීමකි. භික්ෂු-භික්ෂුණී-උපාසක-උපාසිකා-දසසිල්මාතා යනුවෙන් කෘතිම පස්වනක් පිරිසක් නිර්මාණය කර ශාසන විලෝප කාරනා විනා ශාසන චිරස්ත්ථියට හේතුවන කරුණු කාරණා නොවේ. සංඝ සමාජයේ යහ පැවැත්මට අත්‍යවශ්‍යව ඇති 'ථෙරවාදී සංඝ කතිකාවත්' අප රටේ පිළිගත් සංඝ සභාවලින් සකස්කොට අනුමත කොට බුද්ධශාසන අමාත්‍යාංයට හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට යවා දසක දෙකක් පමණ කාලයක් ගත වෙයි ඒ සඳහා 'ථෙරවාදී කතිකාවත් ලියාපදංචි කිරීමේ පනත් කෙටුම් පතක් සකස් කර ඇතත් එයද හමස් පෙට්ටියට දමා බුද්ධශාසන ඇමතිවරු හා අදාළ නිලධාරීන් දෙවසරක් පමණ කාලයක් සුපුරුදු නිද්‍රාවෙන් පසුවෙයි.ඒ ගැන දේශපාලකයන් උනන්දු නොවන්නේ එම කතිකාවත් පනත සම්මත වුවහොත් තමන්ගේ පැවැත්මට අවශ්‍ය ඉහතින් සඳහන් කළ භික්ෂු වෘත්තිකයන් නැතිවන බැවින් විය හැකිය. පක්ෂ දේශපාලය කිරීම හා එයට ආනුෂංගික

12 පිටුවට

11 පිටුවෙන්

සියලු කටයුතු වල නියැලීම එකී සංඝ කතිකාවත් වලින් භික්ෂුන්ට වාරණය කර තිබේ. භික්ෂූන්ගේ සියලු විෂමාචාර ක්‍රියා ධර්ම විනයානුකූල පාලනය කිරීමට කතිකාවත් මගින් සිදුකළ හැකිය.කතිකාවත්වලට ශාසන ඉතිහාසයේ ඓතිහාසික වටිනාකමක් ඇත.

බුදුදහම යනු ලොව්තුරා බුදුරදුන් සකල සත්වයා කෙරෙහි පතළ මහා කරුණාවෙන් දේශනාකළ නවලෝකොත්තර ශ්‍රී සද්ධර්ම රතනයයි. එය කිසිකලක වෙනස් නොවේ.අතීත බුදුවරුන්ද අනාගත බුදුවරුන්ද දේශනාකරනු ලබන්නේ ගෞතම බුදුරජාණන් වහන්සේ දේශනා කළ එකී චතුආර්ය සත්‍ය ධර්මයම වන්නේය.ත්‍රිපිටකය නමින් වර්තමානයේ හඳුන්වන්නේද එකී ධර්මයයි.

බුද්ධදේශනාවක් බුදු කෙනෙකුට පමණක්ම විෂය වන්නකි.යටත් පිරිසයින් එයට අත තැබිය හැක්කේ සිව්පිළිසිඹියාපත් රහතන්වහන්සේලාටය. ඒ උතුමන්ද බුදුවරු ලෙස සළකන බැවිනි.ධර්ම විනය පිළිබඳ සංගායනා වලදී මුල් වූයේ එවැනි උතුමන්ය. එබැවින් විශ්වවිද්‍යාල ආදි අධ්‍යාපන ආයතනවල ආචාර්ය,කථිකාචාර්ය,මහාචාර්ය ආදි ලෞකික උපාධි තනතුරු හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පමණක් නොව සංඝ සමාජයේ නායක,අනුනායක,මහානායක,ආදි ලෞකික ශාසනික තනතුරුද, බුදුදහමේ ධර්ම-විනය විනිශ්චයට සුදුසුකම් නොවේ.ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන් 1 වෙනි ධර්ම සංගායනාවට සහාභාගි වීමට අනිවාර්ය සුදුසුකමක් වූ රහත් භාවය ලබා ගැනීමට උත්සාහවත්ව එක් රැයක් තුළ රහත්භාවය ලබා ගෙන එයට සහභාගි වූවා මෙන් යොජිත ත්‍රිපිටක රක්ෂණ පනතේ නම් කර ඇති ගිහි පැවිදි දෙපාර්ශ්වයද මෙහිදී කළ යුත්තේ පරියාප්ති,ප්‍රතිපත්ති,ප්‍රතිවේද සපුරා කඩිනමින් පුථුජ්ජන භාවයෙන් මිදී රහත් භාවයට පත්ව සුදුස්සන් වී ධර්ම විනය විභාග කටයුතු ආරම්භ කිරීමය.එතෙක් ත්‍රිපිටකයට අත නොතබන ලෙස කරුණාවෙන් අපි සිහිපත් කරමු. එමෙන්ම බුද්ධශාසන අමාත්‍යාංශය මේ කරන්න යන්නේ තම අමාත්‍යාංශයේ විෂය පථයට කිසිසේත් අදාළ නොවන නීති විරෝධී මෙන්ම ධර්ම විරෝධී භයානක අපායගාමී පාපයක් බවත් තරයේ මතක තබාගත යුතුය.

"මහණෙනි,අනුන් මට දොස් කියතොත්,ධර්මයට හෝ දොස් කියතොත්,සංඝයාට හෝ දොස් කියතොත්,
ඒ තන්හි දී තොප විසින් කෝප නො ඉපැදවිය යුතුය, නොසතුට නොම ඉපැදවිය යුතුය.සිතැ අමනාප බව නො කට යුතුය. මහණෙනි,අනුන් මට දොස් කියතොත්,ධර්මයට හෝ දොස් කියතොත්,සංඝයාට හෝ දොස් කියතොත්,ඒ දොස් කීමෙහි තෙපි කිපෙන්නහු නම් නොසතුටු හෝ වන්නාහු නම් එයින් තොපටම (තොපගේම ධ්‍යානලාභාදියට) අන්තරාය (බාදා) වන්නේය.............

"මහණෙනි, අනුන් මට හෝ ධර්මයට හෝ සංඝයාට හෝ දොස් තියතොත්, එහි තොප විසින් 'මේ කාරණයෙනුත් මෙය අභූතයකි.මේ කාරණයෙනුත් මෙය අසත්‍යයකි.මේ කියන දෝෂය අප කෙරෙහි නැත.මෙය අපකෙරෙහි අවිද්‍යමාන ය'ැයි නැති දොස් නැති සැටියටම ලිහා ඉවත් කළ යුතුය"
( දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රය)



**"මහණෙනි, අනුන් මට හෝ ධර්මයට**
**හෝ සංඝයාට හෝ දොස් තියතොත්,**
**එහි තොප විසින් 'මේ කාරණයෙනුත් මෙය අභූතයකි.**
**මේ කාරණයෙනුත් මෙය අසත්‍යයකි.**
**මේ කියන දෝෂය අප කෙරෙහි නැත.**
**මෙය අපකෙරෙහි අවිද්‍යමාන ය'ැයි**
**නැති දොස් නැති සැටියටම ලිහා ඉවත් කළ යුතුය"**
*( දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රය)*

තථාගතයන් වහන්සේගේ ධර්මය 'එහි පස්සිකො' 'එව, බලව' යන ගුණයෙන් යුක්තය. සියලු බෞද්ධ ප්‍රජාවම එය මැනවින් දනිති.කවරෙකුට වුවද එසේ ධර්මය බැලීමට හෙවත් විමසා බැලීමට අවකාශ තිබිය යුතුය.එය වැළැක්වීමට නීති රීති දැමීම වරදක් මෙන්ම පාපයකි

"තථාගතප්ප වේදිතො භික්ඛවේ ධම්ම විනයො විවටො විරොචති න පටිච්ඡන්නො"
මහණෙනි තථාගතයන් වහන්සේ විසින් දේශනාකළ ධර්මය හා විනය විවෘත වූයේ බබළයි.වැසුනේ නොම බබළයි (අංගුත්තර නිකායේ තික නිපාතයේ භරණ්ඩු වග්ගය)

බුදුදහමේ ඇති සිතීමේ විමසීමේ නිදහස විශිෂ්ට වූවකි.තථාගතයන් වහන්සේ කාලාමයන්ට දේශනා කෙළේ.ත්‍රිපිටක හෙවත් දහම් ග්‍රන්ථවල ලියා තිබූ පමණින්ම කිසිවක් පිළිනොගෙන තම බුද්ධියෙන් විමසා බලා පිළිගන්නා ලෙසය. (අංගුත්තර නිකායේ තික නිපාතය)

උක්ත කරුණට අදාළව වැඩි විස්තර කැමැති අය විසින් ඉහත සූත්‍ර වලට අමතරව කියවා බැලිය යුතු අගනා සූත්‍ර කීපයක් මෙසේය,වීමංසක සූත්‍රය, වංගී සූත්‍රය, චුල්ලහත්ථිපදෝතම සූත්‍රය හා මහාපරිනිර්වාණ සූත්‍රය(එහි සතර මහා අපදේශ,)

බුදුදහමත්, සම්බුද්ධශාසනයත් වසර 5000 කල් පවත්නා බවට කර ඇති දේශනාව සමස්ත බෞද්ධ සාධූන්ම පිළිගත් කරුණකි.දැනට වසර 2564 ගෙවී ඇති අතර ඒසා කාලපරිච්ඡේදය තුළ අපමණවත් පාලි ත්‍රිපිටක ධර්මය බෞද්ධ-අබෞද්ධ බුද්ධිමතුන්ගේ විවිධ නිරීක්ෂණයන්ට යොමුවී ඇත. බුදු දහම විවෘතව පැවති බැවින් ඒ තුළින් දිනෙන් දින ථෙරවාදී බුදුදහම ලෝකයේ බැබලී ඇත.එබැවින් අනාගත කවර අයෙකුටවත් බුදුදහම නැමැති මිල කළ නොහැකි අනර්ඝ මාණික්‍ය රත්නය අණපනත් මගින් වසා තබන්නට අයිතියක් නැත.එය පාපයකි.වරදකි. ත්‍රිපිටකය හෙවත් බුදුදහම සමස්ත මනුෂ්‍ය වර්යාටම දේශනාකළ සර්වාත්‍රික,සාර්වභෞමික ධර්මයක් බව විවෘත මනසින් බලත්වා.

මෙම යෝජිත ත්‍රිපිටක රක්ෂණ පනත ධර්ම විනයට අනුව ප්‍රතික්ෂේප කරන්නේනම් ප්‍රස්තුත ගැටලුවලට විසඳුමක්ද යෝජනා කිරීම කළ යුතුය.විසදුම් රාශියක් ඇතිමුත් ප්‍රමුඛතාවය මත කීපයක් පමණක් මෙසේ දක්වමු.

1. දැනටමත් සකස් කොට ඇති 'කතිකාවත් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත'පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කර ගැනීම කඩිනම් කළ යුතුය.එමගින් උද්ගතව ඇති භික්ෂු විෂමාචාර ඇතුලු ගැටලු විසදීමේ වගකීම අදාළ සංඝ සභා වෙත පැවරෙනු ඇත.සංඝයා අතර ඇති ගැටලු සංඝයා විසින්ම විසදා ගැනීමේ ධර්මානුකූල ක්‍රියා පිළිවෙතද එයයි.

2 පාසල් අධ්‍යාපන රටාවට සමගාමීව සකස්කොට ඇති වත්මන් පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය පනින රිලවුන්ට ඉණිමන් තැබීමක් වැනි තරුණ භික්ෂුන් උපැවිදි කරවීමට දිරිගන්නකි. එබැවින් කඩිනමින් එය වෙනස් කර ග්‍රන්ථධුර-විදර්ශනාධුර ප්‍රගුණ කරවන අධ්‍යාපන ක්‍රමයක් සැකසිය යුතුය.එවිට ධර්ම විනය විරොධී අභියෝග වලට ශක්තිමත්ව මුහුණ දිය හැකි ශ්‍රද්ධා සම්පන්න ධර්මධර, විනයධර භික්ෂු පරපුරක් බිහිවෙනු ඇත.

3. දහම් පාසැල් අධ්‍යාපනයද බුදුදහමේ මූලික කරුණු වන චතුරාර්ය සත්‍ය,ආර්ය අෂ්ඨාංගික මාර්ගය පටිච්ඡසමුත්පාදය ආදි දහම් කරුණු හා පාලි භාෂා අධ්‍යයනයට ප්‍රමුඛතාවය දෙන අයුරින් සකස් කළ යුතුය.එමගින් මැනවින් බුදුදහම හදුනාගත් බෞද්ධ දරු පිරිසක් සමාජගත වනු ඇත.

4. බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ සිංහල පරිවර්තන සාමාන්‍ය ජනයාට කියවා තේරුම් ගැනීමට අපහසු බව අපගේද පිළිගැනීමයි.එබැවින් විද්වත් මණ්ඩලයක් මගින් සරල සිංහල පරිවර්තනයක් සකස් කිරීම කාලීන අවශ්‍යතාවකි.එමගින් ගිහි පැවිදි සියලු දෙනාගේ දහම් දැනුම වර්ධනය කරගැනීමට පහසු වනු ඇත. එමගින් ගැඹුරු දහම් කරුණු මුල්කරගෙන කරනු ලබන ඊනියා අර්ථ නිරූපණ සාමාන්‍ය බෞද්ධ ජනතාව විසින් නිරායාසයෙන්ම බැහැර කරනු ඇත.

5. වර්තමානයේ ධර්ම විනයේ සඳහන් කැරුණු හා වචනාර්ථ විකෘති කරමින් විවිධ මත පළ කරන්නවුන් එසේ කරනුයේ ඇතැම් විට ධර්මයේ ඇති'ධර්මාර්ථ' 'ශබ්දාර්ථ'මැනවින් අවබෝධකර ගැනීමට ප්‍රඥාවක් නොතිබීම හෝ ප්‍රසිද්ධිය හා පටු ලාභ සත්කාර ලැබීමේ කුහක අපේක්ෂාව විය හැකිය.මෙහිදී බුද්ධශාසන අමාත්‍යංශය විසින් කළ යුතුව ඇත්තේ ධර්මධර විනයධර විද්වතුන් මගින් එකී දුර්මත ඛණ්ඩණය කරමින් ධර්ම විනයානුකූලව පිළිතුරු දෙන ප්‍රකාශනයක් නිකුත් කිරීමට කටයුතු කිරීමය.

ආර්. එන්. එච්. එම්. සමන් ජයරත්න

# ආගමික පුදපූජා විධි හා බෞද්ධ ප්‍රතිපදාව

04 පිටුවෙන්....

ජනතාවට ආලෝකය උදාකළ දිනයයි. හින්දු ජනතාව කෝවිලට ගොස් එළගිතෙල් පහන් දල්වා විෂ්ණු දෙවියන්ට උපහාර කොට නිවසට පැමිණ කෑම බීම සකස්කර අසල්වාසීන්ටත් දී උත්සවශ්‍රීයෙන් සමරන මෙය සිංහල බෞද්ධ ජනතාවගේ අලුත් අවුරුදු උත්සවයකට සමානය.

හින්දු විවාහ මංගලෝත්සවයේදී අති පාරිශුද්ධ හෝමාග්නිය දක්වා පූජෝපහාර දක්වයි. අවමංගල කටයුතු වලදී ශිව පූජකයා පුණ්‍ය කලසක් තබා හෝමාග්නිය දල්වා පූජා විධි පවත්වයි. මානික්කවාසගර් තුමා ගීතිකා ගයයි. වේද මන්ත්‍ර ගායනා කොට දෙවියන්ට යාඥා කිරීම ද සිදු කෙරේ.

බුදුරදුන් රතන සූත්‍රයේදී දේශනා කොට ඇත්තේ,
දිවා ච රත්තෝච හරන්ති යෙ බලිං
තස්මාහි නෙ රක්ඛත අප්පමත්තා යනුවෙනි. එනම් දිවාරාත්‍රී බලි පූජා පවත්වන මිනිසුන් අප්‍රමාදව ආරක්‍ෂා කරන්නැයි දෙවියන්ට ප්‍රකාශ කොට තිබීමයි.

කතඤ්ඤූ කතවේදී පුග්ගලෝ
දුල්ලභො ලෝකස්මිං

කළගුණ සළකන පුද්ගලයන් ඉතා දුර්ලභ බව බුදුදහම පිළිගනී. බුදුරදුන් ද ලොවට පෙන්වා දුන් පළමු පාඩම ද එයයි. හින්දු පුද පූජා සියල්ලෙහිම පාහේ දක්නට ලැබෙන්නේ එම කළගුණ සැළකීමේ උතුම් ගුණයයි. එය බෞද්ධ ප්‍රතිපදාවට උචිතය. එනම් එහිදී කිසිදු හිංසාවක් ද සිදු නොවේ. ඒවා අවිහිංසක පුද පූජාවෝය.

ක්‍රිස්තු ආගමික පුද පූජා අතර,
මහා සිකුරාදා දිනය
නත්තල් උත්සවය
ප්‍රධාන තැනක් ගනී. කිතුනු බැතිමත්හු ජේසුස් වහන්සේ ඇණ ගැසූ දිනය සමරමින් තම පල්ලිය තුළ පුද පූජා පවත්වති. එසේම නත්තල් දිනය ජේසු බිළිඳාගේ උපත සමරමින් මහත් උත්සවශ්‍රීයෙන් ආගමික ස්ථානවල තම නිවසේ විවිධ චාරිත්‍ර පුදපූජා පවත්වති.

මීට අමතරව ජුදා ආගම තුළ පූජා කිහිපයක් ක්‍රියාත්මක වේ.
දෛනික පූජාව
දවන යාග පූජාව
ධාන්‍ය පූජාව
පාප පූජාව
වන්දි ගෙවීමේ පූජාව

මෙහිදී ධාන්‍ය පූජාවට හැර අනෙක් සියලු පූජාවන්ට සතෙකු හෝ කිහිපදෙනෙක් බිලිවේ.

සත්ව හිංසනය, ප්‍රාණඝාතය ප්‍රතික්ෂේප කරන බුදුදහමට අනුව මේ සියලු පුද පූජා අකුසල කර්ම ගණයට අයත් වේ. මේ සියල්ල බෞද්ධ ප්‍රතිපදාවට විරුද්ධය.

විශිෂ්ට පුද්ගලයෙකු ලෙස දේව ජන සමාජයට ඇතුළත් කිරීම බෞතිස්ම කිරීමයි. මෙයද විශේෂ ආගමික චාරිත්‍රයකි. මීට අමතරව ආගමික මංගලෝත්සව කිහිපයකි.
සවත් දවත්
අලුත් අවුරුදු මංගල්‍යය
නාඹුල්පල දවස
වන්දි ගෙවීමේ මංගල්‍යය
අස්වැන්න මංගල්‍යය
කුඩාරම් මංගල්‍යය

අස්වැන්නේ පළමු කොටස දෙවියන්ට පිදීම ආහාර පූජාවක් ගින්නෙන් දවා පිදීම පව් කමා කිරීම ආදී චාරිත්‍ර ඉහත මංගලෝත්සව වලදී සිදු කෙරේ. මෙම චාරිත්‍ර බුදුදහම අනුව බොහොමයක් එකඟය.

ඉස්ලාම් දහම අනුව සතිපතා හා වාර්ෂිකව පවත්වන විශේෂ පුදපූජා කිහිපයකි.
සිකුරාදා යාඥාව
රාමසාන් මාසය (රීදුල් පිතර්)
හජ්ජි උත්සවය (රීදුල් අල්හා)
මිලාත් දුන් නබි උත්සවය

සෑම ඉස්ලාම් භක්තිකයෙක්ම අනිවාර්යෙන්ම කළයුතු සිකුරාදා යාඥාව මගින් සාමූහිකත්වය, සහෝදරත්වය, හා ප්‍රේමය එකතු කෙරේ යැයි අපේක්ෂා කරයි. රාමසාන් මාසයේදී ඉස්ලාම් භක්තිකයන් උපවාස සීලයෙහි යෙදේ. තමා උපයන මුදලින් අවම වශයෙන් 2 1/2% ක් වත් දුගියන්ට දිය යුතුය. මෙය සකාත් බද්ද ලෙස හඳුන්වයි. මින් කරුණාවන්ත වීම සහෝදරත්වය ඇති කිරීම බලාපොරොත්තු වේ.

හජ්ජි උත්සවයේදී මුස්ලිම් ආගමිකයෝ (ධනවත් අය) මක්කම ගොස් කාබා දේවස්ථානය වන්දනා කරති. මින් ජාත්‍යන්තර සහෝදරත්වය වර්ධනය කරගැනීම අරමුණ වේ. එසේම නබි නායක තුමාගේ උපන්දිනය සිහිපත් කරමින් මිලාත් දුන් නබි උත්සවය සමරයි. මෙහිදී දේවස්ථානවලට ගොස් යාඥා හා දේව මෙහෙයන් පැවැත්වීම සිරිත වේ.

මීට අමතරව දරුවෙක් උපත ලැබීමෙන් පසු අකීකා පූජාව තබයි. එනම් නිරෝගිමත් ගවයෙකු හෝ එළුවෙකු ගෙන කරන බිලි පූජාවකි. එසේම අවමඟුල් දින ෆාල් කිණියන් යාඥාව සිදු කරයි.

සමස්ථයක් ලෙස ගෙන විමසීමේදී නූතන ආගමික පුද පූජාවන්හි බහුලව ඇත්තේ යාතිකා, ඉල්ලීම් හා ද්‍රව්‍ය පූජා කිරීමයි. බුදුදහම අනුව එය ආමිෂ පූජාවයි. සියලු ආගමික පුද පූජා පිළිබඳව පොදු බෞද්ධ මතය ධම්මපදයේ කතාවේ එන බුදු වදනකින් මැනවින් ප්‍රකට වේ.
න මය්හං මාලා ගන්ධාදිහි පූජං කරොන්තා
මම පූජං කරොන්ති නාම ධම්මං
පටිපජ්ජන්තා පන මං පූජෙන්ති නාම

සුවඳ මලින් පමණක් මා පුදන්නෝ මා නිසි ලෙස පුදන්නෝ නොවෙති. ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි යෙදෙන්නෝම මා නිසි ලෙස පුදන්නාහු නම් වෙති. එසේම බුදුරදුන් තම ධර්මයටවත් අනවශ්‍ය ගරු සැළකිලි පුද පූජා අනුමත නොකළහ.

කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි
නිත්ථරනත්ථාය නො ගහණත්ථාය
මහණෙනි, තොපට මම පහුරක් කොට ධර්මය දේශනා කරමි. එය එතෙර වීම පිණිසය. කරතබාගෙන යාමට නොවේ.

එමෙන්ම ධන ධාන්‍ය සම්පත් හා ජීවින්ට හිංසා කරමින් ඝාතනය කරමින් සිදු කරන කිසිදු පුද පූජාවක් බුදුදහම අනුමත නොකරයි. අනාත්මවාදී දහමක් ලෙස සියලු දේවවාදී ආත්මවාදී විශ්වාස බුදුදහම ප්‍රතික්ෂේප කරයි. පුද්ගලයා කරන සියලු වැරදි ක්‍රියා පව් අකුසල හැටියට සලකා ඒ සියල්ල තමාට විපාක ලැබෙන බව බුදුදහම පැහැදිලිව පෙන්වා දෙයි.

එනම් බුදුදහම ඉහළින්ම පිළිගන්නේ ආමිෂ පූජාව නොව ප්‍රතිපත්ති පූජාවයි. එනම් බුදුරදුන් දේශනා කළ දහම් මාර්ගයේ ප්‍රඥාවෙන් යුතුව ගමන් කිරීමයි. ඒ සඳහා බෞද්ධ අපි පෙළ ගැසිය යුතුය.

# තමා නසන ආයුධය

ලෝකයේ විවිධ ආයුධ ඇත. අද නවීන ලෝකය තුළ මුළු ලෝකයම එක සැණින් විනාශ කළ හැකි ආයුධ බිහි වී ඇත. නවීන විද්‍යාවෙන් මිනිසා ඉහළටම ගොස් ඇත. එය හොඳට වඩා නරකට යොදා ගැනීම තුළ මුළු ලෝකයම අපහසුතාවයන් වලට ලක්වී ඇත. බුදුරජාණන් වහන්සේ නොකළ යුතු වෙළඳාම් පහක් දේශනා කළහ. එයට හේතුව ඒ තුළින් මානව සත්වයාටම කරදරවලට මුහුණ පාන්නට සිදුවන බැවිනි.

1.සත්ත වණිජ්ජා (සතුන් හා මිනිසුන් වෙළඳාම)
2.සත්ථ වණිජ්ජා (අවි ආයුධ වෙළඳාම)
3.විස වණිජ්ජා (විස වෙළඳාම)
4.මංස වණිජ්ජා (මස් වෙළඳාම)
5.මජ්ජ වණිජ්ජා (මත්ද්‍රව්‍ය වෙළඳාම)

එම වෙළඳාම් පහ අතරින් අවි ආයුධ වෙළඳාම වුවද එදිනෙදා ජීවිතය තුළ නුසුදුසු ක්‍රියාවන්ය. නමුදු මිනිස්සු ජීවත්වීම උදෙසා හොඳ නරක ගැන නොසිතා විවිධ වෙළඳාම් සිදු කරනු ඇත. භෞතික වශයෙන් එවැනි අවි ආයුධ තුළින් වුවද සත්වයාට හිරිහැර කරදර නිරන්තරයෙන් සිදුවේ. අද නවීන ලෝකය තුළ ක්‍ෂණයකින් මිනිසුන්, ගහකොළ, සතා සිව්පාවුන් විනාශ කිරීමේ උපක්‍රම බිහි වී ඇත.

නමුදු මෙතනදී දේශනා කරනු ලබන්නේ භෞතික වස්තුවකට වඩා තම මානසික අවියක් පිළිබඳ කතාවකි. එතුළින් තමන් අනිවාර්යෙන්ම විනාශ වේ. අනුනටද අයහපතක්ම සිදුවේ. මෙලොවටද පරලොවටද අයහපත කැඳවනු ඇත. එම ආයුධය ලොව බලවත්ම ආයුධය කීවොත් ඉතා නිවැරදිය. ඒ බව බුදුහිමි පැහැදිලිව දේශනා කළහ. බුදුහිමි සසර පුරාවට තමන් නසන ආයුධය විනාශ කිරීමට විශාල පරිශ්‍රමයක් දැරූහ.එය සඵලවීමේ ප්‍රථිඵලයක් වශයෙන් බුද්ධත්වය පෙන්වාදීමට පුළුවන.

එ ය වෛරය,ක්‍රෝධය,ද්වේශය,තරහව,පළිගැනීම,හිංසාව ආදී විවිධ වචන වලින් විහිදී ගියද එකම මනසින් නැගෙන අකුසල සිතුවිලි ධාරාවක් වශයෙන් විකාශය වේ.ප්‍රධාන අකුසල මූල තුන අතර ද ද්වේශය යනුවෙන් එය ඉතා ප්‍රකටය.දස මාර සේනාව අතර මක්ඛ-ථම්භ යනුවෙන් යන්නෙන් සිතේ තද ගතිය පෙන්වා දී ඇත. පංචනීවරණ ධර්ම තුළ එය ඉතා මැනවින් විස්තර කොට ඇත.

සිතේ ප්‍රභාස්වරභාවය පිටට ඒමට ඉඩ නොදී සිත ආවරණය කරන ප්‍රධාන ආයුධයක් ලෙස ව්‍යාපාදය පංච නීවරණයන් අතර එකක් ලෙස පෙන්වා දී ඇත. ව්‍යාපාදය යනු අන්‍යයෝ නැසෙත්වායි සිත් ද්වේශ සහගතවූ මෝහයෙන් උපදනා අකුශල් චේතනාවයි. මෙය බෙහෙවින් ඊර්ෂ්‍යාව පෙරටු කොට ගෙන පහළ වේ.

තමන් නසන ප්‍රධාන ආයුධය ක්‍රෝධය, වෛරය, ව්‍යාපාදය නම් එය බුදුන් දෙසූ සදාතනික දහමකි. එතුළින් කිසිදා තමනට සැනසීමක් නොලැබේ. එය ධම්ම පදයේ පළමු වග්ගය තුළින්ම දේශනා කොට ඇත.

''නහී වෙරේන වේරානි - සම්මන්තීධ කුදාචනං
අවේරේන ජ සම්මන්ති - එස ධම්මෝ සනන්තනො''

මේ විශ්වයේ කිසිම තැනක, කිසිම විටක, වෛරයෙන් සන්සිඳෙන්නේ නැත. අවෛරයෙන්ම වෛරය සන්සිඳෙති. මෙය සදාකාලිකව පිළිගත් ධම්මතාවයයි.

අවෛරය යනු වෛර නොකිරීමයි.එය මෛත්‍රියට සම්බන්ධ වන්නකි. තමන් නසන ආයුධය විනාශ කළ හැකි මාර්ගය වන්නේ මෛත්‍රිය කිරීමය. එය බුදුන් වහන්සේලා ආදර්ශයෙන් පෙන්වා වදාළහ.උන්වහන්සේලා අගය කළ උතුම් මනුෂ්‍ය ගුණධර්මයකි. තමන් නසන ආයුධය නොහොත් වෛරය, ක්‍රෝධය, ව්‍යාපාදය උපන් කල්හි මෛත්‍රී පැත්තට යොමුවීම තුළින් සැනසීමක් ලබා ගැනීමට පුළුවන.

1.මෛත්‍රී භාවනා නිමිති හැදෑරීම
2.මෛත්‍රී භාවනාවේ යෙදීම
3.කර්මය ස්වකීය කොට සිතීම
4.නුවණින් සළකා බැලීම
5.කල්‍යාණ මිත්‍ර ආශ්‍රය
6.ව්‍යාපාදය දුරුවීමට අදාළ කතා ශ්‍රවණය කිරීම

මේ ආදී වශයෙන් මෛත්‍රී ගුණ ධර්මය පැත්තට යොමුවීම තුළින් තමන් නසන ප්‍රධාන ආයුධය විනාශ කිරීමට පුළුවන. තමන්ටත් - අනුන්ටත්, මොලොවටත් - පරලොවටත් අහිත පිණිස අවැඩ පිණිස පවතින එම අකුසල මූලය විනාශ කිරීමට නොහැකි නම් නිරන්තරයෙන් යටපත් කළ යුතුය. ඒ සඳහා ඉහත පාඩම් ක්‍රියාවට නැංවිය යුතුය. එතුළින් තමන්ගේ ජීවිතත්, අනුන්ගේ ජීවිතත් සුමඟට යොමු වෙනවා සේම සියලු සත්වයින්ටම යහපතක්ම සිදුවනවාට කිසිදු සැකයක් නොමැත.

ශ්‍රී ඉදසුමන මහා පිරිවෙනෙහි ප්‍රධානාචාර්ය,
ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛණ ශාස්ත්‍රී,
ගලගෙදර රතනවංශ ස්ථවිර


ථෙරී ගාථා ඇසුරෙන්
භද්‍රා කුණ්ඩලකේශී
9
කතා සැකසුම හා චිත්‍ර පාලිත සඳරු ආරච්චි
සිටු තුමණී.. මේ අභාගිනී.. භද්‍රාට සැර වැරවී.. මෙය.. ...විසඳන්ට බැහැ...
ඉතිං... කුමක්ද සිටුදේවිය මට කරන්ට කියන්නේ...
අප කුමක් හෝ කළ යුතුයි ස්වාමිණී... මේ අපට සිටින එකම දරුවා.. ඇයගේ ඉල්ලීම අප කෙසේ හෝ ඉටුකර දිය යුතුයි.....
ඔව්.. දේවිය.. මා ඒ බව දන්නවා.. නමුත් මෙය ඉටු කළ හැක්කේද..?
ඇගේ.. අදහස එය නම් අප කුමක් හෝ විසඳුමක් කළ යුතුයි.. නමුත්
රජ තුමාට මේ ගැන.. හෙළි වුවහොත්.. අප සැමටම.. මැරුම් කන්ට සිදුවේවි..
සිටු තුමනි... අප රාජ පුරුෂයින්ට.. රන් කහවුනු ලබාදී සන්නකව සිරගෙයින් නිදහස් කරගනිමු.. රාජ පුරුෂයින් සන්නකව කෙසේ හෝ මුදමයි..
මේ සඳහා යොදාගනිමු.. ඔහු ලවා රාජ පුරුෂයන්ට කතා කරවා.. රන් කහවුනු දී... ඔහුව සිරගෙයින්.. ..නිදහස් කර ගනිමු...
නුඹ අපගේ හිතවත්ම.. සමීපතම සේවකයායි.. ඒ නිසයි මා නුඹවම මේ සඳහා තෝරාගත්තේ.. මේක රහසක් නමු අපවත් දොරා.. නමුත් වෙරී.. මෙම කාර්යය ඉටු කරයි කියා.. මා.. සිතනවා....
එහෙමයි..
ඔව්.. දේවිය.. අපි.. අපිට.. හිතවත්ම.. සේවකයාව....
එහෙමයි සිටුතුමනි.. මම මේ ගැන කිසිවෙකුටවත්... දැන ගන්ට ඉඩ තියන්නේ නෑ
හා.. හොඳයි..
දියණියය භද්‍රා.
දියණියය භද්‍රා
ඕ.. මෑණියෙනි

සුරස අතිරේකය

සුභාවිත ගීයක



# සඳ කිඳුරා මිය ගියා - ගමට එන්න නංගියේ

සඳ කිඳුරා මිය ගියා
ගමට එන්න නංගියේ
පසළොස්වක පෝය දා
අවසන් කටයුතු කළා

ගමේ නාඩගම් පොළේ
කිඳුරිය වී නුඹ එදා
ගැයු ලිය ගී විකුණන්නට
කොළොම් තොටට ඉගිලුණා

කණ කෙකිණිය ගමට ඇවිත්
ඇඬුවා නුඹ ගැන කියා

වෙල් දෙනි ඕවිටි පුරා
තනිව ම සී පද කියා
තනිව සිටිය කින්නරා
ළය දැදුරුව මිය ගියා

කණ කෙකිණිය අඬන්නෙ නෑ
ඇගේ කඳුළු නැති නිසා

ගේය පද - රත්න ශ්‍රී විජේසිංහ
සංගීතය හා තනුව - විශාරද ගුණදාස කපුගේ
ගායනය - ජානක වික්‍රමසිංහ

අතීතයේ ද වර්තමානයේ ද නිර්මාණයන්ට වැඩි වශයෙන් ම පාදක වූ ජාතක කතා අතර චන්ද කින්නර ජාතකය ප්‍රමුඛ ස්ථානයේ පසුවෙයි. රත්න ශ්‍රී විජේසිංහයන් විසින් ම චන්ද කින්නර ජාතකය පසුබිම් කරගෙන ලියන ලද ගීත රැසකි. උක්ත පද ගීතයට ඔහු චන්ද කින්නර ජාතකය යොදා ගන්නේ වර්තමාන සමාජයේ තරුණ තරුණියන්ගේ ගේ ජීවිතය ඇදී යන ඛේදවාචකයක් පිළිබඳව කියන්නට ය. මේ ඛේදනීය ඉරණමට තරුණියන් ගොදුරුවීම ඇරඹෙන්නේ අනූව දශකයේ සිට ය.

ජනයාගේ ආධ්‍යාත්මික ගුණ වගාව උදෙසා අතීතයේ විහාරස්ථානයන්හි ජාතක කතා නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කෙරුණි. මේ නිර්මාණ නාඩගම් හෝ නූර්ති ශෛලියෙන් ඉදිරිපත් කළහ. ගීතයට පසුබිම් වන්නේ චන්ද කින්නර ජාතකයේ සඳ කිඳුරා සහ කිඳුරිය ලෙසින් රඟ පෑ යුවලක් පිලිබඳව ය. ඔවුන් සැබෑ ජීවිතයේ ද පෙම්වතුන් ය.

ඔවුන්ගේ ප්‍රේමයට කණ කොකා අඬලන්නට පටන් ගන්නේ කිඳුරියගේ දක්ෂකම් දැක තම නිර්මාණයන්ට දායකත්වය සපයන්නැයි ආරාධනා කරන නාට්‍ය අධ්‍යක්ෂකවරයෙකු නිසාය. අධ්‍යක්ෂකවරයාගේ වර්ණනාවන්ට ප්‍රිය කරන තරුණිය ගමෙන් නගරයට පිවිසෙන්නීය.
ගමෙන් නගරයට පිවිසි තරුණිය නගරයේ විෂම සමාජයේ ගොදුරක් බවට පත් වෙයි.

එහි දෘෂ්‍ය අලංකාරයට රැවටෙන ඈ එම අලංකාරයන්, සැප පහසු ජීවිතය උරුම කරගන්නට වෙහෙසවෙයි. තම ජීවිතය ඉසුරුමත් කර ගැනීමෙ බලාපොරොත්තුවෙන් සිටින ඇය එහිදී කූට මිනිසුන්ගේ ව්‍යාජ වර්ණනා වලටත් දහසක් පොරොන්දුවලටත් රැවටී තම ආත්මය ම ඒ වෙනුවෙන් පාවා දෙයි. ඇය මේ සියල්ල තම පෙම්වතාට එරෙහි වීමේ අරමුණින් කරන්නක් නොවේ. ඇය මේ කූට වාණිජ සමාජයේ ගොදුරක් බවට පත් වන්නේ ඇයට ත් නොදැනීය. අවසන ඇයට තම පැවැත්ම වෙනුවෙන් සිය ආත්මය පුද කිරීම දිගුකාලීනව කරන්නට සිදුවෙයි.
ඇයගේ වත්මන් හැසිරීම් රටාව පිළිබඳව පුවත් පෙම්වතාට අසන්නට ලැබේ. හුදෙකලාව තම පෙම්වතිය පිළිබඳ විරහවෙන් ගත කළ තරුණයාට මේ පුවත ළය දැදුරු කරවන තරමේ වේදනාවක් බවට පත්වෙයි. මෙහි දී සිදුවන්නේ තරුණයාගේ භෞතික මරණය නොව මානසික මරණය යි. භෞතික මරණයකට වඩා මානසිකව සිදු වන මරණය අතිශය බිහිසුනුය.

එයට හේතුව නම් මානසිකව සිදුවන මරණයේ දී එක් වරක් නොව සිය දහස් වරක් මරණයට පත් වන්නට සිදුවීමයි. " ළය දැදුරුව මිය ගියා" යන්නෙන් ඔහු දැඩි මානසික පීඩනයකට ගොදුරුව සිටීම හෝ ඔහු ඒ ළසොව දරා ගන්නට නොහැකිව මානසික රෝගියෙකු බවට පත් වූ බවට සිතන්නට අපට හැකිය.
කණකෙකිණිය යනු පෙම්වතිය පිළිබඳව අසුබ පණිවුඩය ගෙන ආ තැනැත්තිය විය හැකි ය. ඇය නොහඬන්නේ මන් ද? අඬන්නට තරම් ඇසේ කඳුළු ඉතිරිව නැති නිසාය. "පාලොස්වක පෝය දා.... අවසන් කටයුතු කළා" යන්නෙහි ව්‍යංගාර්ථය මේ තරුණයා සදහටම කලා කටයුතු නවතා දැමූ බව විය හැකිය.ජාතක කතාවේ සඳ කිඳුරාගේ ළය දැදුරු වන්නේ බ්‍රහ්මදත්ත රජුගේ ඊ තලයකිනි. නමුත් වත්මන් සඳ කිඳුරාගේ ළය දැදුරු වන්නේ කිඳුරිය පිළිබඳව වූ අසුබ ආරංචිකි නි. ජාතක කතාවේ කින්නරිය තම පතිනි බලෙන් සත්‍ය ක්‍රියා කොට කිඳුරාට නැවත ප්‍රාණය ලබා දෙයි. නමුත් වත්මන් කිඳුරියට යළිත් තම කිඳුරාට ප්‍රාණය ලබා දෙන්න හැකි වනු ඇති ද?

වෙළඳ සමාජයේ ගොදුරක් ව විනාශ වූ කිඳුරියට යළිත් ගමට එන්නට තරම් දිරියක් තිබේ ද? කෙසේ වුවත් කිඳුරා යළිත් ජීවත් කළ හැක්කේ කිඳුරියට ම පමණි. එනිසායි කිඳුරියට යලිත් එන්නැයි ඉල්ලීමක් කරනුයේ.

මේ ගීතය අද සමාජයට ගලපා ගැනීමේ දී බොහෝ සමාජ විපර්යාසයන් ඔස්සේ සාකච්ඡා කළ හැකිය. අද සුපිරි ගී තරු, නැටුම් තරු තෝරන තරග බොහොම ය. එමෙන් ම අවුරුදු කුමරියන් , රූ රැජිණන් මෙන්ම ටෙලි තරු ද බොහොම ය. මේවා හි බාහිර අලංකාරයන්ට වඩා ඇතුළත සැඟවි ඛේදවාචකයන් බොහොම ය. මේ සියල්ල එළිදරව් නොවෙතත් ඇතැම් අවස්ථා වලදී මාධ්‍ය හරහා මෙහි අභ්‍යන්තර ඛේදවාචකයන් හෙළි වේ.

මෙලෙස වාණිජ සමාජයේ ගොදුරක් බවට පත් වන්නේ බොහෝ විට ගමෙන් නගරයට ආ සුවිශේෂී දක්ෂතා වලින් සපිරුණු තරුණියන් ය.

ඔවුන් සිය දක්ෂතා වලින් සමාජයේ ඉහළට ගමන් කරන්නට සිහින මැව්වත් සිදුවන්නේ ජීවිතය ත් ආත්මයත් කාමාතුර වෙළෙන්දන්ට බිලි දෙන්නට ය. අතීතයේ මව් පියවරුන්ගේ අවවාද උපදෙස් හා බලපෑම් නිසා දරුවෝ මෙවැනි ඛේදයන්ගෙන් බේරා ගැනීමට හැකි විය. නමුත් අද සිය දරුවන් මෙවැනි තරග වලට යොමු කරන්නේ මව් පියන් විසිනි.

ඔවුන්ගේ සිහිනය වන්නේ තම දරුවා තරුවක් කිරීමය. ජන ජීවිතය යහ මග යවන්නට අතීථයේ මූලිකත්වය ගත්තේ පන්සලයි. එදා ගැමියන්ගේ ආධ්‍යාත්මය පෝෂණය කරණු වස් ජාතක කතා රඟ දැක් වූ ඇතැම් පන්සල් අද මිනිසුන් පන්සලට ගෙන්වා ගන්නේ සර්කස් සංදර්ශන ඇතුළු විවිධ මේලාවන් තම පන්සලෙ පැවැත්වීමෙනි. වැටත් නියරත් ගොයම් කා නම් එය කාහට පවසන්න ද?

ගීතයෙන් රත්න ශ්‍රී වත්මන් සමාජයේ එක් ඛේදවාචකයක් මැනවින් පිළිබිඹු කරයි. කපුගේ යෙදූ සරල සංගීතයත් ජානක වික්‍රමසිංහයන්ගේ ගැයුමත් සමාජයට වූ විපත වැලපුමක් සේ හදවතට කිඳා බසියි.

චාමිකා ජනානිද සිල්වා

# විනයගරුක වෙමු



''විනයෙන නාම ශාසනසසුව ආයු'' යන්නෙන් පැහැදිලි වන්නේ සම්බුද්ධ ශාසනයේ පැවැත්ම පවතින්නේ විනය ආරක්ෂා කරනතුරු පමණායි.

බෞද්ධ භික්ෂූන් වහන්සේලා විනය ගරුක,ධර්ම ගරුකව,යුක්ති ගරුකව කටයුතු කරනතාක් බෞද්ධ ශාසනය සුරැකිව පවතින බවයි. හික්මීමෙන් තොරව, විනයකින් තොරව ක්‍රියා කළහොත් එය ශාසනය පිරිහීමට ලක්වන බවයි.

ලෝකවාසී ජනතාවට දැන් එළඹී තිබෙන්නේ විශාල වසංගතයකට මූණ දීමටයි.එයට කළයුතු වන්නේ තම තමන්ගේ වගකීම අවශ්‍යයෙන්ම ඉටුකළ යුතු වූ කාලයයි. එනම්, තම විනය ආරක්ෂා කළ යුතු කාලයයි.මරණය කාටත් පොදු වූ කාරණයක් උපන් හැම කෙනෙක්ම මරණයට මූණදිය යුතුයි. එසේ වුවත්, එය වුවමනාවෙන් ළගා කරගත යුතු එකක් නොවේ.වර්තමානයේ මරණයට ප්‍රධාන කරුණක් වන්නේ කොවිඩ්19 වසංගත රෝගයයි. එම වසංගත රෝගය මුළු ලෝකයේම ව්‍යාප්තව පවතින කාලයයි.

මෙම කොවිඩ් 19 වසංගත රෝගය ප්‍රභේද වශයෙන්ද ව්‍යාප්තව පවතී.ඉන්දියාවෙන් ඩෙල්ටා ප්‍රභේදය,පේරු රාජ්‍යයෙන්,ලැම්ඩා ප්‍රභේදය එසේම ඩෙන්මාර්කයෙන් සහ ඉරාකයෙන් B1, 428 ප්‍රභේදය ආදී වශයෙන් මුළු ලෝකයේම ප්‍රභේද වශයෙන් ව්‍යාප්ත වෙමින් පවතී.

සෞඛ්‍ය විශේෂ උගුරේ විශේෂඥවරු පවසන පරිදි බොහෝ දුරට උගුරේ අපහසුතා ශිසරදය,ඇගපත වේදනවා, පාචනය, සමේ පැල්ලම්, ඇඟිලි දුර්වලවීම, ඇස් රතුවීම, ඇස් කැසීම ආදී රෝග ලක්ෂණ පෙන්නුම් කරන බවයි.

මෙහිදී ඔබ කළයුතු වන්නේ මෙම විෂබීජය ඔබගේ නොසැළකිලිමත් බව හේතුවෙන් ඉවසීම වගකීම විනය නොමැති වීමෙන් රෝග සම්ප්‍රේක්ෂකයකු බවට කිසි විටෙකත් ඔබ පත් නොවන්න වගබලා ගැනීමයි. ඉතාමත්ම ඉවසීමෙන් වගකීමෙන් විනය පාලනයකින් යුක්තව කටයුතු සිදුකළ යුතු කාලයක් බව අවබෝධ කරගත යුතුව ඇත.

මෙලොව උපත ලබන හැම කෙනෙක්ම මරණයට පත්වෙති. ඒ බව අප කවුරුත් දන්නා වූ කරුණකි. ඒ වගේම හැම කෙනෙකුටම ලෙඩ රෝග බෝ වී සමහරු වයසට ගොස් මිය යති. තවත් සමහරෙක් වුවමනාවෙන් ම මරණයට පත්වෙයි.මරණයට කිසිදු භේදයක් නොමැත.දුප්පත්, පෝසත්, ලොකු, කුඩා, වටිනා, නොවටිනා, උගත්, නූගත් ආදී වශයෙන් කිසිම භේදයක් මරණයට නැත.

ඉතිහාසයේදී අප අසා ඇති රජවරු විශාල පිරිසක් පිළිබඳව තොරතුරු අසා ඇත. ඒ රජවරු ගැන සිතන විට ඒ සෑම රජකෙනෙක්ම මිළ කළ නොහැකි සේවාවක් කළ පිරිසක් ඒ සෑම රජකෙනෙක්ම මිය ගෝස ඇත.දේවානම් පියතිස්ස රජු දුටුගැමුණු රජු, වළගම්බා රජු, විජයබා රජු ආදී රජවරු ගැන තොරතුරු විස්තර අප අසා ඇත. ඒ රජවරු විශාල වෙහෙර විහාර ගොඩනගා ඇත.වැව් අමුණ සාදවා කෘෂිකර්මය දියුණු කර ඇත.ඒ සියලු දෙනාම මරණයට පත්වී ඇත.

ලෝක සත්වයා සසර දුකින් එතෙර කල බුදුරජාණන් වහන්සේ, සැරියුත් මුගලන් මහරහතන් වහන්සේලා පුද්ගලයන්ගේත් තමන් වහන්සේගේත් ආධ්‍යාත්මික ගුණවගාවන් දියුණු කරමින් සමාජ යහපත සඳහා කටයුතු සිදුකරමින් සිටි ඒ සියලුදෙනාම අප අතර නැත.ගිහි පැවිදි ශ්‍රේෂ්ඨ නායකයෝද අද නැත.ඉන් පැහැදිලි වන්නේ මරණය කාටත් පොදු බවයි. ලෙඩ රෝග සියල්ල කිසි සේත් ම සුව කළ නොහැකි ඒවා නොවේ.බොහෝ ලෙඩ රෝග ඇති කර ගන්නේ තමාමය.තමාට නොගැලපෙන ආහාරපාන ගැනීමෙන් ද ලෙඩ රෝග හදා ගනිති. බොහෝ ලෙඩ රෝග සුවකරන්නට අවශ්‍ය වු වෛද්‍ය ක්‍රමවේද ලෝකයේ තිබේ. ලෙඩක් නොහැදුණු අයද ලෝකයේ නැත.එකම ලෙඩක් හෝ සුව නොවූ අයද ලෝකයේ නැත.මේ ලෝකයේ උපන්නා වූ සියලුම සත්වයන් ලෙඩවන බව සනාථන ධර්මතාවයකි.මේ ලෝකයේ උපන්නා වූ අප සියලු දෙනාම අති භයානක කාලයකටයි දැන් මූණ පා ඇත.

කෙවිඩ්19 වසංගත රෝගය ඩෙල්ටා,ලැම්ඩා ආදී ප්‍රභේද වලින් පැමිණ මේ වන විට ලෝකයේ අහිංසක මිනිස් ජීවිත වටිනා මිනිස් ජීවිත අහිමි වී ඇත.මුහුදේ ඇතිවන රැළි වගේ කොරෝනා වෛරසය හිස ඔසවමින් පවතී.මේ වෛරස වසංගතයෙන් කොපමණ කාලයක් සීඝ්‍රයෙන් රෝගීන් බිහිකරමින් පවතීද කියා කිව නොහැකිය. අසරණ මිනිසුන්ට දරුවන්ට මෙම පීඩාකාරී ජීවිත කොපමණ කාලයක් ගතකරන්නට වේවිද කිව නොහැකිය.

මේ පවතින වාතාවරණය උඩ තම තමන්ගේ ජීවිත තනි තනි වශයෙන් ගත කරන්නට හික්මීමත් ඇතිව වසන්නට කාලය එළඹී ඇත.විශේෂයෙන් වැඩිහිටි පිරිස, ළමා පිරිස, හෘදරෝගවලින් පෙළෙන පිරිස මෙම වෛරස රෝගයෙන් ආරක්ෂා විය යුතුයි.ගැබිණි මව්වරුද විශේෂයෙන් ආරක්ෂා විය යුතුයි.මෙම වෛරස් රෝගය නිදන්ගත රෝගවලින් පීඩාවිඳින හා වයස්ගත පිරිසට වඩාත් බලපෑමක් එල්ල කරයි. එබැවින් එවැනි පිරිස් තම තමන් සෞඛ්‍ය නීති නිසි ආකාරයෙන් අනුගමනය කරමින් මෙම වසංගත කාලයේ ජීවත් විය යුතුයි.

වැඩිහිටියන් සිටින වැඩිහිටි දෙමාපියන් සිටින පොඩි ළමයින් නිවෙස්වල පිරිස් ඉතාමත් වගකීමකින් විනය ගරුකව ඉවසීමෙන් සියළුදෙනා කෙරෙහි කැපවීමෙන් ක්‍රියා කළ යුතුය.

මේ අනුව සිදුනොකළහොත් හොදින් සිහිකල්පනාවෙන් ක්‍රියානොකළහොත් ඔබගේ ගෙදර සිටින වැඩිහිටි දෙමාපියන්ද, වැඩිහිටියන්ද, දූදරුවන් ඔබ සමීපයේ සිටින සැමගේ ජීවිත විශාල අපහසුතාවයකට විනාශයකය පත්කරන බව ඔබ අමතක නොකළ යුතුයි.

විනය නොහාත් පුද්ගල හික්මීම සම්බුද්ධ ශාසනයේ පැවැත්ම පවතින බවද ශාසනයේ ආයුෂය බවද පැහැදිලි කරයි.පුද්ගලයාගේ මෙම හික්මීම සම්බුද්ධ ශාසනයේ පැවැත්ම සඳහා පමණක්ම නොව තම තමන්ගේ ජීවිත පැවැත්ම සඳහාද බලපාන බව දැනගත යුතුයි. මෙම වසංගත කාලය තුළ හික්මීම තම වගකීමයි. එම හික්මීම විනයයි.

සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන්ගෙන් කළයුතුව තිබෙන මේ වසංගත රෝගය රෝගබිය,ව්‍යාධිබිය,ජීවිතඉන්ද්‍රිය ආරක්ෂා කරන මූලිකාංගය බවට පත් වන්නේ විනයයි. වගකීමයි.ඉහතින් කී මූණ ආවරණය කිරීම,දෑත් සේදීම එකිනෙකා අතර, සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම ආදී සෑම සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයක්ම මල් බැස ගන්නේද එල දරන්නේ ඊට ආවේණික හික්මීම තුළයි.

වර්තමානයේ නොයෙක් හේතු මුල් කරගෙන නොයෙක් ඉල්ලීම් ඉල්ලමින් නොයෙක් මාතෘකා මුල් කරගනිමින් සෙනඟ ඒකරාශි කිරීම ඒකරාශිව කටයුතු කිරීමට යාමෙන් සිදු වන්නේ සමාජ අපගාමී පුද්ගලයන් බිහි කිරීමයි.දාමරිකයන් බිහි කිරීමයි.එබැවින් මෙවැනි කාලයක පිරිස ඒකාරාශි කිරීම ඒකරාශිව කටයුතු කිරීම නතර කළ යුතුය.

රැකියාවල නිරතවන පුද්ගලයන් වෙනත් අවශ්‍යතා වෙනුවෙන් නිවසින් නගරයට පැමිණෙන් තරුණ පිරිස ආරක්ෂා කාරී විය යුතයි. නිසේ සිටින වැඩිහිටි පිරිස ආරක්ෂා කරගත යුතුයි.ඒ සඳහා මේ කාලය ඔබ ඉවසීමෙන්, වගකීමෙන් යුක්තව ක්‍රියාකළ යුතුයි.තම වැඩිහිටියන්ට දෙමාපියන්ට ගෙදරට රෝගබීජ ගෙන යන්නකු නොවිය යුතුයි.

ගෙදර සිටින දෙමාපියන්,වැඩිහිටියන් ආරක්ෂා කරගැනීම ඒ වගකීම ඔබ සතුව ඇත .තමා කොතරම් අපහසුතාවයකට පත් වුවත් සෞඛ්‍ය අංශ වලින් ඔබ දැනුවත් කර ඇති ආකාරයට ක්‍රියා කරන්න.නාසය, මුඛය මැනවින් ආරක්ෂාවීමට මුහුණ ආවරණය පැලදීමට හැකි හැම අවස්ථාවකදී ම සබන් යොදා අත් සේදීමද එයට අවකාශයක්ද නොමැතිනම් සේදුම්කාරක යොදා දෑත් පිරිසිදු කිරීම අනිවාර්යයෙන්ම සිදුකළ යුතුවෙයි.

ගෞරව ශාස්ත්‍රවේදී අධ්‍යාපන ඩිප්ලෝමා
එච්.ඇම්.අයි.හේරත්
ලෙනදෙර

# බුදුදහමින් පෙන්වා දෙන සැහැල්ලු සහනශීලී දිවියකට මග



සමාජගත ජීවිතයක් ගතකරන සෑම පුද්ගලයෙකුගේම ස්කාරම්මණ අරමුණ වනුයේ තමා ගත කරනු ලබන ජීවිතය සතුටින්, සැනසීමෙන්, යුතුව ගත කිරීමයි. සෑම පුද්ගලයෙකුම සැපයට කැමති බවත් සැපය නිතරම අපේක්ෂා කරන බවත් බුදුන්වහන්සේ අනුදැන වදාරා ඇත.

"සුඛ කාමනි භූතානි  යෝ දණ්ඩෙන විහිංසති
අත්තනො සුඛ මෙසානො  පෙච්චසො න ලභතෙ සුඛං"

මේ නිසා අපකරන කියන සෑම ක්‍රියවකම යටි අරමුණ වනුයේ සැප ලබාගැනීමයි.

අංගුත්තර නිකායේ "චතුත්ථත්ත නිපාතයෙහි" 'චක්ක සූත්‍රයට' අනුව සන්තුෂ්ටිය යනු තිබෙන ලැබෙන හැටියෙන් යමක් පිළිගෙන තෘප්තිමත් වීම නොවේ. ස්වකීය කුසලතාවය, ශක්තිය, තත්වය ආදිය හරිහැටි අවබෝධ කරගෙන එය ඉක්මවා අනවශ්‍ය ප්‍රාර්ථනා ඇතිකරගෙන හැමවිටම අසහනයෙන් පෙළෙන තත්වයට පත් නොවී සතුට උපරිම අයුරින් භුක්ති විඳීමයි.

සැප ලැබීමට ඇති කැමැත්ත (සුඛ කාමි) මිනිස් ස්වභාවයයි. සැපය ළඟාකර ගැනීමට මිනිසුන් බොහෝ දේ කරති. ආශාවන් හැකිතාක් දුරට සපුරාගැනීමට උත්සහ දරන්නේ එමඟින් සැප ලැබෙතැයි යන විශ්වාසයෙනි වැඩි වැඩියෙන් පරිභෝජනයෙහි යෙදීම, ආශාවන් සපුරා ගැනීම සඳහා අනුගමනය කරන ක්‍රියා මාර්ගයයි. බුදු දහමේ "සුභර තාවය" ලෙස දක්වන්නේ ලෙහෙසියෙන් පෝෂණය කළ හැකි බවයි. අධි පරිභෝජනය නිසා පෝෂණය කිරීම අපහසු තත්වයට පත්වේ. අධිපරිභෝජනය (Over consumpation) නිසා බොහෝ දෙනා ස්වකීය අදායම ඉක්මවා වියදම් කිරීමට සිදුවේ. එය ණය වීමට මඟ පාදයි. ණයවූ මිනිස්සු සැප විඳීම වෙනුවට නොයෙකුත් දුක්පීඩා මැද අභාග්‍ය සම්පන්න අසහනයකට පත්වෙති.

පුද්ගලයෙකු ඉතාමත් උසස් අධ්‍යාපනයක් හෝ ශිල්පීය නිපුණතාවයක් ලබාගත්තේත්, ධනය වැඩියෙන් උපයාගතහැකි කර්මාන්තවල යෙදෙන්නෙත්, විදේශගත වී රැකියාවක් කරන්නේත් මෙම ඉහත අවශතාවය සපුරාගැනීම සඳහාය. ඒ අනුව සලකා බලන විට පුද්ගලයා විසින් සිදුකරනු ලබන සෑම ක්‍රියාදාමයක්ම සිදු කරනු ලබන්නේත්, ඒවායේ අරමුණු ගොඩනැගී ඇත්තේත් සැපය කේන්ද්‍ර කරගෙනය.

කොතෙක් තිබුණත් ඇති නොවීම, හැම විටම අඩු බවක් යන හැඟීමද (ඌණො අත්ථනො) මිනිස් ස්වාභාවයයි. එය වටහා නොගැනීම නිසා මිනිස්සු අනුකරනයට, තරඟයට හෝ ප්‍රදර්ශනයට පරිභෝජනයෙහි යෙදෙති. එයින් සමාජයේ "සුභරතාවය" ගිලිහී යයි. දකින්නට අසන්නට ලැබෙන අලුත් මෝස්තර වල හෝ ඇසුරු කරන්නන්ගේ චර්යා රටා වල සීමාවක් නැත. ඒ නිසා තමාගේ පරිසරයට ඔරොත්තු දෙන පමණට යැපිමෙහි නිරතවන්නේ නම්, පුද්ගලයාට ඔහු අවට සමාජයෙන් හා පරිසරයෙන්  හිතකර ප්‍රතිචාර ලැබේ.

මිනිසා ජීවිතය සැපවත් කරගැනීමේ අරමුණින් අසීමිත ලෙස ධනය රැස්කිරීමට උත්සහා ගැනිමත්, අවශ්‍යතාවයකින් තොරව භාණ්ඩ පරිහරණය කරන්නට කටයුතු කිරීමත් තුළ ජනිතව ඇත්තේ අසහනයයි. අසම්පූර්ණ වූ රුචිකත්වයයි. මෙසේ ජීවිතය සුඛදායක කර ගැනීමේ ප්‍රයත්නය තුළ සැහැල්ලු බව, සරු බව, ඉක්මවා සංකීර්ණත්වයකරා පුද්ගලයා ගමන්කරන විට එම පුද්ගලයා මානසික පීඩාවෙන් පෙළීමට පටන් ගනී. මෙම අසහනය මානසික මෙන්ම කායික අසහනය දක්වා පරිවර්තනය විය හැකිය. මේ නිසා චාම් සරල, බවකින් යුක්තව ජීවිතය සකස්කරගත හොත් ජීවිතයේ පරම සතුට ඇතිවේ.

"සංතුෂ්ඨී පරමං ධනං" (සතුට පරම ධනය වේ) සැහැල්ලු සරල ජීවිත පැවැත්මක් ඇතිකර ගැනීමට අසීරු පුද්ගලයන් ගේ ගති ලක්ෂණ පිළිබඳ ධර්මයේ සඳහන් කර ඇත. ඒවා මෙලෙස විග්‍රහ කෙරේ.

01. අතිච්ඡතා :-

තමාට කොතරම් තිබුණත් එයින් සෑහීමකට පත්නොවී අනුන්ගේ සම්පත් ප්‍රාර්ථනා කිරීම මේ ලක්ෂණයෙන් යුතු පුද්ගලයන්ගේ ස්භාවයයි. මේ අය සෑම විටම තමාට ලැබෙන දෙය අනුන් සමඟ සංසන්දනය කිරීමටත්, තමාට ලැබෙන්නේ වටිනාකමෙන් අඩු දේ බවත්, අන් අයට ඉතා වටිනා දේ ලැබෙන බවත් සිතමින් සෑම විටම රිණාත්මක (-) ලෙස කල්පනා කරමින් අතෘප්තිකර ජීවිතයක් ගත කරති.

02. පාපිච්ඡතා :-

ලාභ අපේක්ෂාවෙන් තමා කෙරෙහි නැති සුදුසුකම් පෙන්විමත්, එසේම යමක් භාරගැනිමේදී නැත්නම් එකතු කිරීමේ දී (මුදල් හෝ භාණ්ඩ) අකමැත්ත පෙන්වා එම සිතින් බොහෝ බලාපොරොත්තු ඇතිකර ගැනීම මෙබන්දන්ගේ ලක්ෂණයකි.

03. මහිච්ඡතා :-

අධික ලාභ ලබා ගැනීමේ අපේක්ෂාවෙන් තමන් තුළ ඇති ගුණ ප්‍රදර්ශනය කිරීම හා ප්‍රචාරය කිරීමට උත්සහා දරයි. මේ නිසා මහා සාගරයට කොතරම් ජලය ගලා ගියද එය පිරී ඉතිරී නොයන්නාසේ මේ අය තෘප්තිමත් කිරීම ඉතා අසීරු අපහසු කාර්යයක් වේ. එසේම සමාජයේ සිටින ඇතැම් පුද්ගලයින් අනුකරණයට යන පුද්ගලයාද සෑහීමකට පත්නොවන්නෙකි. තමාට ප්‍රමාණවත් තරම් ධනය මිල මුදල් තිබුණද ඊට වඩා වැඩි යමක් ඇති අයෙකු දුටු විට ඒ හා සමානවන්නට උත්සාහ දරයි. ආහාර පාන ඇඳුම් පැළඳුම්, යාන වාහන, නිවාස වතුපිටි, රැකියා යන මේ හැමදෙයක්ම අනෙකුත් අය හා සමාන වීමට හෝ ඊට වඩා ඉහළයාමට උත්සාහ දරයි. ඒ සඳහා අධික ලෙස වෙහෙසෙයි. එහෙත් එම අරමුණ ඉෂ්ඨකර ගැනීමට නොහැකි තත්වයක් උදාවූ විට මානසික අසහනකාරී තත්වයට පත් වෙයි. ඒ අනුව දොම්නස් සහගතව සන්තාපයෙන් අසහනයට හා අතෘප්තිමත්ව ජීවිතය ගත කරයි. මේ නිසාම නොලැබූ දේම ප්‍රාර්ථනා කරනවා මිස ලැබුණු දේ පිළිබඳව සංතෘප්තියක් ගොඩනගාගැනීමට ක්‍රියාකරන්නේ නැත. එබඳු තැනැත්තන් මුළු ජීවිත කාලයම අඬමින් අතෘප්තියෙන් අසහනයෙන් කාලය ගත කරයි. එහෙත් බෞද්ධ දර්ශනයට අනුව පරම සතුට ලඟාකරගත හැක්කක් බව

"පුට්ඨස්ස ලෝක ධම්මෙහි
චිත්තං යස්සන කම්පති
අසෝකං විරජං ඛෙ මං"

එතං මංගල මුත්තමං....... යන්නට අනුව අටලෝ දහමින් (ලාභ-අලාභ, යස-අයස, නින්ද-ප්‍රශංසා, සුඛ-දුක්ඛ) කම්පා නොවී සිටීම තුළින් සිත සැහැල්ලු වී සරල වී මානසික තත්වයක් ගොඩනගා ගැනීමට කළ හැකි බව දක්වා ඇත.

එසේම සතුට ඇතිකරගන්නා ආකාරයන් තුනක් පිළිබඳව බුදුන් වහන්සේ දේශනා කොට ඇත.

ඒ අනුව,

1. යථාලාභ :- ලැබෙනදෙය හොඳ වුවද,නරක වුවද එය භාරගෙන නැවත නැවත ඒ පිළිබඳව නොසෙවීම තුළින් සෑහිමකට පත් වීම.

2.යථාබල :- තමාට ඔරොත්තුදෙන පමණට ගැනීම හා ඔරොත්තු නොදෙන දේ ගැන නොසොයා සෑහිමකට පත් වීම.

3. යථා සාරුප්ප :- තමාට ගැලපෙන දෙය පමණක් ගැනීම හා නොගැලපෙන දේ ගැන නොසෙවීම තුළින් සෑහීමකට පත්වීම.

පුද්ගලයාගේ මානසික සහනය ගොඩනගා ගැනීම සඳහා ඉහත කරුණු තුන මැනවින් පිළිපැදිය යුතු බව දහමේ විග්‍රහකොට ඇත. මෙයින් අපේක්ෂිත වූයේ මානසික සහනයකින් යුතු ගිහි සමාජ සංස්ථාවක් ගොඩනැගීමයි.

එසේම මෙම කරුණු පිළිබඳව අවබෝධයකින් යුතුව කටයුතු කිරීමෙන් තෘෂ්ණාවද පාලනය කරගත හැකිවේ. තෘෂ්ණාව නිසා පුද්ගල සන්තානය තුළ ජනිතවන සංකීර්ණමය සිතුවිලි ඔහුව අසහනයට කරදරයට පත් කරයි. එය වර්ධනය වූ විට ශෝකයෙන් පීඩා විඳීමට, බියෙන් දුක් විඳීමට ඔහුට සිදු වෙයි. මේ නිසා ජීවිතයට සැහැල්ලු බව හුරුකිරීම තුළින් මානසික සහනයකින් යුතු සරල සංයම ජීවිතයක් ගත කිරීමට පුද්ගලයාට හැකි වේ. එසේම රැස්කිරීමෙන් ලබාගන්නා මානසික තෘප්තියට වඩා ඉහළ තෘප්තියක් අත්හැරීමෙන් ලදහැකි බව ප්‍රත්‍යක්ෂ කර ගත යුතු වේ.

"නතං කම්මං කතං සාධු
යංකත්වා අනුතප්පති
යස්ස අස්සුමුඛෝ රෝදං
විපාකං පටිසේවති"    (ධම්ම පදය)

යම් කර්මයක් කිරීමෙන් පසු තැවෙන්නට සිදු වේද, යම් කර්මයක විපාක කඳුළුමුසු මුහුණින් හඬ හඬා විඳින්නට සිදු වේද ඒ කර්ම නොකරනු මැනවි. කළ අයහපත් කටයුතු සිතා පසු තැවීම, "අනුතප්පති" යන්නෙන් පැවසේ. පශ්චත්තාපය පුද්ගලයෙකුගේ සැපය නැති කොට ශරීරයෙහි නොයෙක් වේදනා ඇති කරවයි. සිතා බලා යමක් කළ යුතුය. එවිට සහනශීලි, තෘප්තිමත් ජීවිතයක් ගත කළ හැකි වනු ඇත.

විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ
ඩී.එම්.එච්. කරුණාරත්න මහත්මාගේ අභාවයෙන්
පසු උපහාර පිණිස  පළ කරන ලදි.

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

# කාටත් පොදු දහම බුදු දහමයි



ලොව විවිධ ආගම් දර්ශන දක්නට ඇතත් බොහෝ දුරට ඒවා එක් කොටසකට එක් පාර්ශවයකට සිමා වූ ඒවාය. ඒවා තුළින් කෙනෙකුට යහපතක් වනවිට තව කෙනෙකුට අයහපතක් වේ. එක් පාර්ශවයකට අසාධාරණයක් වනු ඇත. එයට හේතුව බොහෝ ආගම් ශාස්වත (ඇත) ආස්වත (නැත) යන අන්ත දෙකට වැටීමය. එම අන්ත දෙකම සත්වයාට දුක කැඳවනු ඇත. එනිසා බුදුරජාණන් වහන්සේ ඒ අන්ත දෙකම අත් හරින ලදි. එසේම එම අන්ත දෙකෙහි විපාකද පෙන්වා දෙන ලදි.

"ධම්මචක්කප්පවත්වන සූත්‍රයෙහි" පැහැදිළි වන ආකාරයට "ද්වෙ" මේ භික්ඛවේ අන්තා පබබජිතෙන සෙවිතබබා යො චායං කාමෙසු කාම සුඛල්ලි ඛානු යොගො හීනො ගම්මො පෝථුජ්ජනිකො අනරියො, අනත්න පද සංහිතො. යො චායං අත්ථකිලමතානු යොගොක්ඛො අනරියො අනත්ත පද සංහිතො ඒතෙ තෙ උභො අන්තා අනුපගම්ම මජ්ජිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණි ඤාණකරණී උපසමාය. අභිඤ්ඤාය සම්බෝධාය නිබ්බානාය සංවත්තති ආදි වශයෙන් හීන, ග්‍රාම්‍ය, ප්‍රථජ්ජනයින් විසින් පරිහරණය කරන ලද.......

මේ අයුරින් එම අන්ත දෙකම අත්හැර මධ්‍යම ප්‍රතිපදාවක් දේශනාකර ලෝක සත්වයාටම පොදු වූ දර්ශනයක් ඉදිරිපත්කළේ බුදුරජාණන් වහන්සේය. උන්වහන්සේ දේශනාකළ මැදුම් පිළිවෙත කිසිදු ආගමක දර්ශනයක දක්නට නොහැකි ස්ථිරසාර පොදු වූ දහමකි. උන්වහන්සේ අවබෝධ කරගත් එම උතුම් දර්ශනය පළමුව දේශනා කළේ පස්වග මහණුන් උදෙසාය. එම ඓතිහාසික සිදුවීම සිදු වූයේ ඇසළ පොහෝ දිනකදීය. ස්ථානය වශයෙන් සඳහන් වන්නේ බරණැස ඉසිපතනාරාම මිගදායයි. එහිදී දේශනා කළ ධර්මයේ පළමු හඬ තුන්ලෝකයම සිසාරා රැව් දුන් අතර දෙව් මිනිස් බ්‍රහ්ම හා තිරිසන් සත්වයන්ද එම ධර්මයේ අමා මිහිර ලැබූහ.

එම උතුම් ශ්‍රී සද්ධර්මය පොදු වූ දහමක් වන්නේ විශේෂ කරුණු කීපයක් ඔස්සේය. එනම් ධර්ම රත්නය වදින ගාථාව තුළ ඒ කරුණු මනාව පැහැදිලි කොට ඇත. "එනම් ස්වක්ඛාතො භගවතො ධම්මො සන්දිට්ඨිකො, අකාලිකො, එහි පසසිකො, ඕපනයිකො, පච්චත්තං වේදිතබෙබා විඤ්ඤුහීති"

සන්දිට්ඨිකො :- ඒ ධර්මය නිසිසේ පිළිපදින්නා වූ සත්පුරුෂයනට වර්තමාන බවයේදීම ප්‍රත්‍යක්ෂ වන ගුණ වලින් යුක්ත වන්නේය.

අකාලිකො :- ධර්මය පිළිපදින පුද්ගලයින්ට වර්ෂ ගණන් ගතවීමෙන් නොව එදිනෙදාම ලැබිය හැකි ගුණයෙන් යුක්තය.

ඒහිපස්සිකො :- ඇවිත් මේ සසුනෙහි පිළිවෙත් පුරා බලන්නැයි අන්‍යයනට නිර්භීතව කිව හැකි අනුන් ඇදගැනීමට සුදුසු ගුණ ඇත්තේය.

ඕපනයිකො :- මේ ධර්මය අන් හැම වැඩක්ම පසුව කරන්නට තබා හැම වැඩකටම පෙරාතුවම තමන් කෙරෙහි පිහිටුවා ලීමට සුදුසුය.

පච්චත්තං වේදතබ්බො විඤ්ඤුහීති :- ධර්මය අනුව පිළිපදින්නා වූ සත්පුරුෂයනට අන් තැනෙකින් නොව තමන් ගේ සිත් තුළම සැපය යහපත්ය කියා දැනෙන ගුණයෙන් යුක්ත වන්නේය.

ඉහත සඳහන් ධර්මයෙහි ඇති උතුම් ගුණ කාටත් පොදු වූවකි. ජාති, කුල ආගම් වශයෙන් බෙදීමක් නැත. කාටත් මෙම ධර්මය පරීක්ෂාකොට තමාගේ නුවණටම අවබෝධ වූ පසු වැළඳ ගත හැකිය. එහිදී ආඥාවක් හෝ යාඥාවක් නැත. නීති දමා ආගමේ නිදහස සීමා සහිත කර නැති නිදහස් ආගමකි. එනිසා ශ්‍රී සද්ධර්මයෙ වටිනාකම තවත් පැතිරෙනු ඇත. බුදු රජාණන් වහන්සේ තම නුවණින්ම අවබෝධ කරගත් එම උතුම් දහම සදාකාලිකය.

එම උතුම් ශ්‍රී සද්ධර්මය "යො ධම්මං දෙසේති ආදි කල්‍යාණං මජ්ජෙ කල්‍යාණං පරියොසාන කල්‍යාණං සත්‍ථං සබ්බ්‍යඤ්ජනං කෙවල පරිසුද්ධං පරි පුණ්ණං" වශයෙන් මුල මැද අග යහපත් වූවකි. අරුත් බරය. හොඳ තේරුමකින් යුක්තය. එම ධර්මයෙහි කිසිදු කිලුටක් නැත. පද ගැලපීමේ කිසිඳු අවුලක් නැත. නිරවුල් නිර්මල හා ශාන්ත වූ බැවින් උපාලි වැනි ගෘහපතියන්ද, අංගුලිමාල වැනි මිනීමරුවන්ද, සච්ඡක වැනි වාද කරුවන්ද, නන්දෝපනන්ද වැනි නා රජුන්ද, ආලවක වැනි යක්ෂයන්ද, සභිය වැනි පරිබ්‍රාජකයන්ද පහසුවෙන් මෘදු මොලොක් බවට පත් වූහ.

එසේම මෙම දහම කාටත් පොදු වීමට ඉහතින් දැන්වූ එම කරුණුද බලපානු ඇත. එසේම එම උතුම් ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කිරීමේදී බේදයක් නොමැතිව තම හදවතේ වෙනසක් ඇති වේ. එලෙසම ඕනෑම කලබල සිතක් වුවද ඒ කලබලකාරී ස්වභාවයෙන් මිදී පොදුවේ උපදින යහපත් සිතුවිලි කීපයක්ද ඇත එනම්,

සද්ධා ජනනතො (ශ්‍රද්ධාව ඉපදීම)
පඤ්ඤා ජනනතො (ප්‍රඥ්ඥාව ඉපදීම)
සබ්බ්‍යඤ්ජනතො (ව්‍යඤ්ජන සහිත වීම)
කේවල පරිපුණ්ණො (හුදෙක් සර්ව සම්පූර්ණ වීම)

මෙම කරුණු අවබෝධයත් සමඟ තම සිත් තුළ ධර්මය ගැන පහළ වන අතර එතුළින් ධර්මයට සමීප වී ධර්මය වැළඳ ගන්නෙකු බවට තරම් තම සිත ඒ කෙරෙහි ඇදී යාමත් සිදුවනු ඇත. බුදුරජාණන වහන්සේ එම උතුම් ධර්මය සොයා ගත්තද, ශ්‍රාවක ශ්‍රාවිකාවන් දේශනා කිරීමෙන්ද එම ධර්මය අවබෝධ කරගැනීමට පුළුවන. ඒ තරමට එම දහම පොදු වූවකි. ඒ සඳහා ප්‍රඥාව තිබිය යුතුය. ශ්‍රද්ධාව තුළින්ද එයට ළං වීමක් සිදු වේ.

ධර්මය ගත් කළ එය දේශනා කිරීමත් ශ්‍රවණය කිරීමත් පිළිබඳවද කරුණු මනාව අනාවරණය කොට ඇත. දේශනයත් ශ්‍රවණයත් දෙකම ඉතා වැදගත් කරුණු දෙකකි. ධර්මය දේශනා කිරීම ආවාට ගියාට නොකළ යුතු දෙයකි. ඒ සඳහා දේශකයන් වහන්සේ පිළිපැදිය යුතු කරුණු කීපයක් පෙන්වා දී ඇත. එනම්,

1. ආනුපුබ්බී කථං කථෙස්සාමිති (අවුලෙන් තොරව පිළිවෙතක් ඇති කථාවක් කරමියි දහම් දෙසිම)
2. පරියාය කථං කථෙස්සාමිති (ඒ ඒ දෙය එසේ වීමට හේතු දක්වමින් සුදුසු කථාවක් කරමියි දහම් දෙසීම)
3. අනුද්දයතං පටිච්ච කථං කථෙස්සාමිති (දුකට පත් සත්වයින් දුකින් මුදවමියි කුළුණින් තෙත් හදවතින් දහම් දෙසීම)
4. ආමිසන්තරො කථං කථෙස්සාමිති (සිව්පසය හෝ කීර්ති ප්‍රසංසාදී වු වෙනයම් ආමිසයක් ලබමියි යන අපේක්ෂාවෙන් තොරව දහම් දෙසීම)
5. අත්තානං පරං අනු පහච්ච කථං කථෙස්සාමිති (තමා හුවා ගැනීම් හෝ අනුන් හෙලා දැකීම් නැතිව අනුන් ගුණ නොසයන කථාවක් කරමියි දහම් දෙසීම)

මීට අමතරව ධර්මය දේශනා කිරීමේ දී ක්‍රම සතරක් උපයෝගි කරගෙන ධර්මය දේශනා කිරීම වැදගත් බව පැහැදිළි කොට ඇත. ඒ තුළින් ශ්‍රාවකයාට ඉතා පහහසුවෙන් ධර්මාවබෝධය ලැබෙනු ඇත. එම කරුණු හතර නම්,

1. පටිපුච්ඡාව්‍යාකරණීය (ප්‍රශ්ණෝත්තර ක්‍රමයෙන් කරුණු පැහැදිළි කොට දීම)
2. ඒකංස ව්‍යකරණීය (යම් ප්‍රශ්ණයකට කෙලින්ම පිළිතුරු දීම)
3. විභජ්ජ ව්‍යාකරණීය (කොටස් වශයෙන් බෙදා විස්තර කර දීම)
4. ඨපනීය (වැදගැම්මකට නැති ප්‍රශ්න ඉවත් කරලීම)

ධර්මය දේශනා කිරීමේ දී තවත් ක්‍රම හතරක් පිළිබඳ සඳහන් වේ.

1. අත්තජ්ඣාසය (තමන් වහන්සේගේ අදහස අනුව දේශනා කිරීම)
2. පරජ්ඣාසය (අසා සිටින්නාගේ අනුව දේශනා කිරීම)
3. පුච්ජාවසිත (අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් දේශනා කිරීම)
4. අට්ඨුප්පත්තික (යම් කාරණයක් අරමුණු කොට ගෙන දේශනා කිරීම)

මෙම කරුණු ධර්ම දේශකයන් වහන්සේ කෙනෙකු විසින් අනුගමනය කළ යුතු කරුණුය. ඒවා පිළිබඳ අවබෝධයකින් යුතුව කටයුතු කළ යුතු බව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. විවිධ විෂම පුද්ගලයින් ධර්ම ශ්‍රවණයකරන බැවින් ඉහත කරුණු වලට අනුව දේශනා කිරීම සියලු දෙනාටම ධර්මාවබෝධය ලබා ගැනීමේ අවස්ථාව උදාවනු නිසැකය.

ශ්‍රාවකයා වනාහි ධර්මය කෙරෙහි ගෞරවයෙන් යුක්තව එය ඇසිය යුතු අතරම අවබෝධයෙන්ද ඇසිය යුතුය. ඒ සඳහා ඍජුවම බලපාන මනස පළමුව සංවර හා එක්තැන් කරගත යුතුය.

15 පිටුවට...

පූජ්‍ය රතනවංශ හිමි

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER

09 පිටුවෙන්...

## සුන්දර සුරූපී සෞභාග්‍යමත් දිවියකට බුදු දහමින් අමා ඔසු

ඇගේ නම උත්තරාය. කුදුබැවින් ඈ හැඳින්වූයේ ඛුජ්ජුත්තරා නමිනි. මහා පුණ්‍යකර්මයක හේතුවෙන් ඈ මිනිසත් භවයක් ලැබුවද කුදු වීමට හා මෙහෙකාරියක් වීමට තරම් අවාසනාවන්තද විය. කළකම් පලදේමය. සිටුකුමාරියක්ව සිටි ආත්මයක ඈ භික්ෂු භික්ෂුණීන් ලඟින් ඇසුරු කළාය. ධර්මයද ඇසුවාය. දන් පැන් ද පිදුවාය. සීලයද රක්ෂා කළාය. ධර්මයද ඇසුවාය. දිනක් සුවිශේෂී උත්සවයකට යෑමට සූදානම් වෙමින් ඈ සිටින විට කුළුපගව ඇසුරු කළ රහත් මෙහෙණින් වහන්සේ නමක් ඇගේ නිවසට වැඩම කළාය. ගමන යෑමට හදිසියෙන් සිටි ඇයට යම් ආභරණයක් ළඟට ගැනීමට අවශ්‍ය විය. ළඟ කිසිවෙකුත් නැති බැවින් එය ගෙනත් දෙනමෙන් රහත් මෙහෙණින් වහන්සේය දන්විය. එම මොහොතේ එය සිදුනොකළොත් කුමරිය අමනාප සිත් ඇති කරගෙන අපාගත වන බවත් එය කළොත් දාසියක් වන බවත් දත් තෙරණින් වහන්සේ අපාගතවීමට වඩා දාසායක් වීම යහපත් බැවින් එම ආභරණය ගෙනවිත් දුන්හ. මෙහි අකුසල කම් හේතුවෙන් ඈ සාමාවතී ඇතුළු පිරිසට දාසියක් විය.

මේ තැනැත්තියම එක් භවයක රාජ කුමාරිකාවක් වී සිට රජගෙට වැඩමකොට වදාළ පසේබුදුවරුන් වහන්සේලාට දන්පුජා කළ අතර මහළුව කුදුගැසුන පසේබුදුරජාණන් වහන්සේ නමක් දැක උන්වහන්සේ වඩින විලාශය කුදුගැසී පෙන්වීමේ විපාකයෙන් කුදුගැසී උපන්නේය.

මෙසේ කුදුවගිය උත්තරා දාසිය දිනක් මල්ගෙන ඒමට සුමනමාලාකරුගේ නිවසට යන විට එහි බුදුපාමොක් මහසඝනට දනක් පිළියෙල වෙමින් තිබුණි. එය මහත් භාග්‍යවන්ත අවස්ථාවක් බව දූනුන ඛුජ්ජුත්තරාවෝද දානයට සහභාගීවී අවසන දෙසූ ධර්මය මැනවින් ශ්‍රවණය කළාය. 'කසළගොඩේ තිබුණත් මැණික මැණිකක්මය' පෙර අකුසල හේතුවෙන් දාසකම් කළද, ශරීරයේ අඩුපාඩුකම් ඇතද පෙර බුදු, පසේබුදු මහරහතන්වහන්සේලාට සකසා දන්දුන් පිණින්ද වැඩූ භාවනාවේ කුසලයෙන්ද පරිපූර්ණවූ උත්තරාවෝ ප්‍රථමයෙන්ම ඇසූ ධර්මය මැනවින්ම වැටහුණු බැවින් සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සංයෝජනත්‍රය සිඳ බිඳ දමා සෝවන් ඵලයෙහි පිහිටියාය. එපමණක් නොව බුදුරජාණන් වහන්සේ දෙසූ සියළු ධර්මයන් මතකයේ තබාගෙන එලෙසින්ම දේශනා කිරීමේ හැකියාවද එතුමිය ලැබුවාය. බුදුරජාණන් වහන්සේ සිව්වනක් පිරිසට අගතනතුරු දීමේදී,

'එතදග්ගං භික්ඛවෙ මම සාවකානං උපාසාකානං බහුසසුතානං යදිදං ඛුජ්ජුතරා' යනුවෙන් බහුශ්‍රැතිව බණ කියන මාගේ ශ්‍රාවිකා උපාසකාවන් අතුරෙන් ඛුජ්ජුත්තරා උපාසිකාව අග්‍රවන්නේ යැයි දේශනා කොට වදාළ සේක.

මෙලෙස අගතනතුරු ලැබීමට ඈ කළ පුණ්‍යකර්මය කුමක්ද? බ්‍රහ්මදත්ත රජතුමා පසේබුදුන් වහන්සේලාට අග්‍ර සඟා උණු කිරිබතක් පූජාකළ අවස්ථාවේ රත්වූ පාත්‍ර අත තබාගෙන වඩින්නට අපහසුව සිටි මොහොතේ ඉතාමත් ගෞරවයෙන් වටිනා සළුවක් ඉරා දරඬු සකස්කොට පිදීමේ ආනිසංසයත් පසේ බුදුන් වහන්සේලාට අග්‍ර දන්පූජා කිරීමේ ආනිසංශයත් හේතුවෙන් මෙලෙස ධර්මය අවබෝධ කර ගැනීමටත් ධර්මය දේශනා කිරීමටත් හැකි විය.

අංග සම්පූර්ණව බොහෝදේ ලැබීමට, සැප ලැබීමට, ධර්මය අවබෝධකරගැනීමට සිතන ඔබ ඛුජ්ජුත්තරා උපාසාකාව මෙන් සතුටු සිතින් කර්මඵල අවබෝධයෙන් සුදුසු අවස්ථාවට සුදුසු පරිදි තමාගේම උවමනාවෙන් සුදුසු පුද්ගලයන්ට සුදුසු පරිදි යම් යම් දේ පූජා කරගනිත්වා.

සාමාවතී ඇතුළු බිසෝවරුන්ට මල්ගෙන ඒමට සෑම දිනකම ඛුජ්ජුත්තරාට රජතුමාගෙන් කහවණු අටක් ලැබුණි. බිසෝවරු ලැබෙන කහවණු ප්‍රමාණයත් මල්වල මිලත් නොදන්නා බැවින් ඛුජ්ජුත්තරා කහවණු හතරක පමණ මල් ගෙනවිත් දුන්නාය. එදින ශ්‍රී සදහම් අසා අවබෝධ කරගත් හෙයින් නැවත කිසි දිකන පව්මළ සිදුනොකරන බැවින් කහවනු අටේම මල් ගෙන ගොස් දිණි.

මල් ප්‍රමාණය වැඩිවීමේ හේතු අසා අවබෝධකරගත් සාමාවතිය ඛුජ්ජුත්තරාට දඬුවම් දීම වෙනුවට සුවඳ පැනින් නහවා සුදුවත් හන්දවා අසුනක් පනවා ඈ එහි හිඳුවා ලොව්තුරු දහම දෙසන්නට ආරාධනා කළාය. ඈ දෙසූ ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කළ සාමාවතී ඇතුළු පිරිස සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන සතර බැම් සිඳ සෝවාන් ඵලයෙහි පිහිටියාය.

මේ අතර තමන්ගේ රූපයට අවමං කළැයි ලොව්තුරා සම්මා සම්බුදුන්කෙරෙහි වෛර බැඳසිටි මාගන්ධියා නම් බිසවද, වාසවදත්තා නම් බිසවක්ද උදේන රජුහට පිරිවර සහිත අගබිසෝ තනතුරු ගත්හ. සාමාවතී ඇතුළු පිරිස බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාවෙන් සිටිය බැවිනුත්, ඛුජ්ජුත්තරා නම් දාසිය දාසී භාවයෙන් මුදා මව් තනතුරේ තබා ඇයගේ මාර්ගයෙන් ධර්මය අසන බැවිනුත්, රජතුමා පහදවාගෙන සසරුවන මාළිගාවට වඩමවා දන් දෙන බණ අසන බැවිනුත් සාමාවතී ඇතුළු පිරිස කෙරෙහි මාගන්ධියා වෛර බැන්දාය.

කීපවාරයක්ම රජුලවා සාමාවතිය මරන්නට තැත්කළද සිල්ගුනයෙන් අනූනවද, නුවණැතිවූ ද කිසි කලෙකින් කිසිවිටකත් කිසිවෙකුටත් වරදක්, අපරාධයක්, වෛරයක් නොකළාවූද බැවින් එය කරන්නට බැරි විය. නුවණ නැත්තේනම් වෛරය කිසිදා සිඳ දැමිය නොහැකිය. අකුසලයක් තිබේ නම් එයින් බේරීමටද නොහැකිය. සාමාවතිය මෙලොව මාර්ගඵල ලබා ඇතද, පිරූ පින්ඵල ඇතද පෙර තිබූ බලවත් අකුසලයක් ඵලදීමේ කාලයට එළඹ සිටියාය. ඇගේ සපිරිවරද එම අකුසලයම කළා වූවෝ වෙති. එබැවින් මාගන්ධියා බිසවගේ වෛරයේ ඵල දකීමේ කාලය පැමිණියෙන් රජතුමාටත් සඟවාම සාමාවතිය ඇතුළු පිරිස ඔවුන්ගේ මාළිගයේම සිරකොට මරණ ලෙස සුළු පියාට දන්වා රජුකැටිව මාගන්ධියා බිසව උයන්සිරි නැරඹීමට ගියෝය. උයන්සිරි නරඹා ආපසු එන රජුට සාමාවතී ඇතුළු බිසෝවරු විනාශවී ඇති ආකාරය දැක මහත් කම්පනයට පත්විය. එහෙත් එය නොපෙන්වා එය සිදු කළ අය සෙවීමට උපායක් යෙදීය. එම උපායට අනුව නිවැරදිව මෙහි තතු අවබෝධ කරගත්තෙන් මාගන්ධියා බිසව සහ ඇගේ සුළු නෑයන් රජු විසින් විනාශ කළහ.

මේ සිදුවීම සම්බන්ධව මුළු රටපුරාමත් පැතිර සම්බුදු සව්වන් අතරටද ගියේය. සම්බුදු සව්වෝ බුදුහිමියන්ගෙන් අසා සිටියේ මාර්ගඵල ලැබූ මේ උපාසිකාවන්ට මෙසේ සිදුවූයේ කෙසේද යන්නය. එසේම හදිසියේ සිදු වූ මරණය හේතුවෙන් ඔවුන්ගේ පරලොව ජීවිතවල තත්වය කෙසේද යන්නය.

මහණෙනි, මෙම කාන්තාවෝ සෝවාන් මාර්ගඵල ලබා සිටි බැවින් කිසිවෙකුටත් වෛර නොකර භාවනාවකට සමවැද සකෘද්ධාගාමී අනාගාමී ඵල ලබා සුවපත් සිතින් මිය ගියහ. වෛර සිතින්ම නපුරු සිතින්ම ජීවත් වූ මාගන්ධියා ඇතුළු පිරිස වෛරයෙන් වේදනාවෙන්ම මියගොස් අවීචි මහා නිරයේ උපන්නායැයි බුදු හිමි දෙසූ සේක.

මේ වත්මන් සමාජය දෙස බලන කළ බහුතරයක් ජීවත්වන්නේ මාගන්ධියාලා ලෙසිනි. ඔවුහු අනුන්කරන දේ වැරදි ලෙස දකිති. අනුන්ට පීඩා ගෙනදෙන සිතුවිලිම ඇතිකරති. තමාකරන වැරදි තමාගේම මතයෙන් නිවැරදි කරගනිති. සාමාවතීලාවන් නිහඬ නිවැරදි අය තලාපෙලා පීඩාවට පත්කරති. මෙසේ කටයුතුකරන අයට මාගන්ධි ඇතුළු ඥාති පිරිසට සේ මෙලොවද දුක් විඳ පරලොව අපාගාමී වීමට සිදුවේ. සාමාවතීලාවන් නිවැරදි ඔබටද සතුරන් අමනාප පුද්ගලයන් සිටිය හැකිය. එහෙත් ඔබට සමාවතීට මෙන් සතුරාට මෛත්‍රී කරන්නට විපතේදී සමාධිගත සිතක් ඇති වේනම් ඔබටද මාගන්ධියට වූ දේම සිදුවේ. එම නිසා වෛර සහගත සිතිවිලි දුරලා මෛත්‍රී පූර්වාංගයම චේතනාවත්, ඉවසීමත්, ප්‍රඥාවත් ඇතිකර ගැනීමෙන් ඔබට මෙලොව පරලොව දෙලොවම ජයගත හැකිය.

සාමාවතී ඇතුළු පිරිසට ගෙයක් තුළ හිරවී දැවී මරණයට පත්වන්නට හේතුව කුමක්ද? මෙම බිසෝවරු පිරිස එක් ආත්ම භවයක රජකෙනෙකුගේ බිසෝවරු වී සිටියහ. එම රජතුමා පසේ බුදුවරු අටනමකට නිති දන් පූජා කළහ. එක් දිනක් දන් ලැබූ පසේ බුදුරදුන් 7ක් නමක් ගන්ධමාදන පර්වතයට වැඩියහ. එක් නමක් තණ බිමක සමාපත්තියට සම වැදුනහ. රජතුමා හා බිසෝවරු උයනට ගොස් ක්‍රීඩාකොට ගඟට බැස බොහෝවේලා ජල ක්‍රීඩා කොට ශීතල ඇතිවූයෙන් තණ බිස්සට ගිණි තැබීය. තණ ඇවිලී ගොස් අවසන බැලූකළ නිහඬව නිසලව සිටිනා පසේ බුදුරදුන් දුටු කාන්තාවෝ පසේ බුදුරදුන් පිලිස්සී පිරිනිවන් පා ඇතැයි සිතීය. මෙය රජතුමා දුටුවහොත් තමන්වත් පුළුස්සා මරාදමනැයි සිතා පසේ බුදුරදුන්ගේ ලෝමයකටවත් හිංසා කරන්නට ඒ ගින්න හේතු නොවූවත් සිතිමතාම පසේ බුදුන් දවමියි සිතා ගිණි දැල්වීම හේතුවෙන් මේ කාන්තා පිරිස කල්පයක් අපායක් විඳ මේසා විශාල ධර්මාවබෝධයකුත් ලැබ ගිණි වැදී මියැදෙන්නට හේතු වූ බව බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළසේක.

අප විසින් සිදු කරනු ලබන සියලු කුසලාකුසල ධර්මයෝ භවයෙන් භවය අප පසුපස එන ආකාරයත් ඒ ඒ අකුසලයට, ඒ ඒ කුසලයට අනුව අපට දුක් සැප විපාක ලැබෙන ආකාරයත් මේ කතා පුවතින් අපට මනාව පැහැදිලි වේ. ඒ නිසා බෞද්ධ වූ ඔබ කාලයෙන් කාලයට වෙළඳ ලෝකයේ ඔබ මුලාකරන මුලාවකට රැවටී සැප, සුන්දරත්වය, ලෞකික දියුණුව, පුහු අහංකාරය ඉවතලා සත්‍යටම මුහුණ දී වැඩිය හැකි කළ හැකි සියළු පිං කුසල් සිදුකෙට අපගේ ජීවිත දහමින් මෙන්ම සෞභාග්‍යයෙන් ආලෝකමත්

iv පිටුවෙන්...

## කාටත් පොදු වූ දහම බුදු දහමයි

සිත, කය, වචනය, සංවරකොට ගෙන ධර්මය ශ්‍රවණය කිරීමේ ප්‍රතිඵල මහත්ඵල මහානිසංසය, "සුනාථ, ධාරථ, චරාථ, ධම්මේ"යන දේශනයට අනුව ඇසීම, එය සිතේ ධාරනය කර ගැනීම හා එය ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කර ගැනීමත් කළ යුතුය. එවිට තමාගේ මෙලොව ජීවිතය යහපත් වීමත් සාර්ථක වීමත් සිදුවනු ඇත. මෙලොව යහපත් වූ කළ පරලොව ජීවිතය ද සාර්ථක වනු ඇත.


ඉහත කරුණු කාරණාවලට අනුව ධර්මය ඇසුරු කිරීමේ ප්‍රතිඵලය ජාති ආගම් කුල භේදයකින් තොරව ඕනෑම කෙනෙකුට ලැබෙන ආකාරය දේශනාවේ පැහැදිලි කොට ඇත.

නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළහස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙවා තෙලපජ්ජෝතං ධාරෙය්‍ය චක්ඛුමන්තං රූපානි දක්ඛින්ති. (යටිකුරු වූ දෙයක් උඩුකුරු කරන්නේද, වැසුණු දෙයක් විවර කරන්නේද, මං මුළාවූවෙකුට මඟ කියා දෙන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේ වේද? ඒ ආදී වශයෙන් ධර්මය මනාව අවබෝධවනවා පමණක් නොව අබෞද්ධයෙකු වුවද එම ධර්මය ශ්‍රවණය කිරීමෙන් අවසන තුණුරුවන් සරණ ගිය උපාසකයෙකු බවට පත් වන්නේය.

ඒ අනුව ඉහත කරුණු පිළිබඳ අවධානය යොමු කොට තම තමන්ගේ ධර්මඥානය වැඩි දියුණු කර ගැනීමත් එතුළින් මෙලොව ජීවන ගමන් මඟ යහපත් කර ගැනීමත් සිදු කරගත යුතුය. නිර්වානය තම තමන්ගේ ඥාණ ශක්තිය අනුව ලැබීමේ කාලවකවානුව නිර්නය කිරීම වුවද ඊට මෙහා ඇති ලෞකික ජීවිත පාරලෞකික ජීවිත යහපත් කර ගැනීම ධර්මයතුළින් කරගත හැකිය. ඒ සඳහා දේශකයන් වහන්සේලාත් ඉහත කරුණු අනුගමනය කළ යුතු අතර ශ්‍රාවකයනුත් ගෞරවයෙන් හා තම ඥාණයෙන් ධර්මය වැළඳගත යුතුය. එවිට දෙපක්ෂයටම එහි සංදෘෂ්ඨික ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවනු ඇත.



# සිල්වත්කම රකින ගුණවත් උතුමන්ට දානය දෙන්න උපයාගත් දේ දැහැමෙන්



"යම් පුද්ගලයෙකු විසින් මහත්ඵල මහානිසංස ගෙන දෙන දානයක් පිරිනැමීමේදී ඔහුට තිබිය යුතු ත්‍රිවිධ දාන සම්පත්ති අතුරින් චිත්ත සම්පත්තියත් ඒ අතරට පූර්ව චේතනාව, මුඤ්චන චේතනාව සහ අපර චේතනාව ගැනත් අපර චේතනාව කිළිටි කරගත් අපුත්තක සිටුතුමාගේ කතාවෙන් ඒ ගැන අවබෝධ වන්නට ඇති.

යම් පුද්ගලයෙක් විසින් තවත් පුද්ගලයෙකුට යමක් දීමට නම් තමා සතු දෙයක් තිබිය යුතුයි. එහෙම නැතුව ඉතින් තව කෙනෙකුට දෙන්නේ කෙසේද? හැබැයි හොරකම් කරල නම් දාන දෙන්නත් හොඳ නැහැ.

ඇත්තෙන්ම අපි දානයක් සඳහා යොදාගන්නා මිල මුදල්, දානයට ගන්නා හැම දෙයක්ම හැම අතින්ම පිරිසිදු වූ ධාර්මික වස්තුවක් විය යුතුයි. එසේ තිබෙන පුද්ගලයාට ත්‍රිවිධ දාන සම්පත්තියේ වත්ථු සම්පත්තිය තිබෙන බවට සැක නැත.

එසේ නොවී හොරමැරකමින්, නොයෙක් වංචා කරමින්, අල්ලස් ගැනීමෙන්, දුරාචාරයේ හැසිරෙමින් මුදල් සපයා ගැනීමෙන් දෙන දානය කුල වත්ථු සම්පත්තිය හෝ පිරිසිදු ධාර්මික බවක් නැත.

බුදු දහමෙහි සඳහන් අන්දමට සතුන්, ආයුධ, මස්, සුරා, විෂ යහපත් කර්මාන්ත නොවන වෙළදාම් පහෙන් උපයාගනු ලබන ධනයෙන් හෝ නීති විරෝධී මාර්ග වලින් උපයන ධනයෙන් දානයකට නොදිය යුතුය.

එසේ නම් පිරිසිදු දාන ධාර්මික වස්තුවක් වන්නේ කුමකින්ද?

ධාර්මික වස්තුව යනු තමන්ගේ මහන්සියෙන් දැහැමි ආකාරයෙන් උපයාගත් වස්තුවකි. නිවැරදි වෙළදාමෙන්, දැහැමි ගොවිතැනින්, යහපත් කර්මාන්ත වලින් සහ නීති ගරුක අවංක රාජ්‍ය සේවයෙන් උපයාගන්නා ධනයයි. යමෙක් විසින් ගන්නා වැටුපට සරිලන සේවයක් නොකරන්නේ නම් එතන ඇත්තේද සොරකමකි. ඔබ එසේ නොවනු ඇත. පෙර රජ දවසේ පැරණි රජවරු තමා සතු කොපමණ ධනය තිබුණත් දානයක් දීමට චිත්ත සම්පත්තිය ලැබුන කල්හි වත්ථු සම්පත්තියද ධාර්මික කරගැනීම සඳහා තමාගේම ශ්‍රමය, දහදිය වැයකර ධනය උපයාගත් බවට සාක්ෂි ඇත.

කොපමණ ධනය තිබුණත් තමාගේම ශ්‍රමයෙන් උපයාගත් ධනයෙන් දානයක් පිළිගැන්වීමට සිතූ මහාචූළි මහා තිස්ස රජු කිසිවෙක් නොදන්නා නොහඳුන ඈත ප්‍රදේශයකට ගොස් වෙස්වලාගෙන කුලියට ගොයම් කපා එයින් උපයාගත් මුදලින් මහාසුම්ම තෙරුන්ට පිණ්ඩපාතය පූජා කළ බවත් එලෙසම තුන් අවුරුද්දක් උක්සකුරු කම්හලක වැඩ කරමින් එයින් උපයාගත් මුදලින් මහා සංඝයා වහන්සේලාට උක්සකුරු පූජා කළ බවත් මහාවංශයෙහි සඳහන් වෙයි.

ධාර්මික දාන වස්තුව වැඩි වටිනාකමකින් යුක්ත වන්නට අවශ්‍ය නැත. එසේ පිළිගැන්වීමක්ද නැත. අධාර්මිකව උපයාගත් විශාල ධනයක් වැයකර දුන්නත් ඒ දානය මහත්ඵල මහානිසංස නොවී තමාසතුව ඇති වටිනාකම ඉතාම අඩු අල්පමාත්‍ර දෙයක් වුවද එය ධාර්මික වස්තුවක් නම් එය දන්දීමෙන් ලැබෙන විපාකවල කිසි අඩුවක් නොවනු ඇත. මෙය කියවන ඔබට මෙම කරුණු පහසුවෙන්ම අවබෝධවීම සඳහා සද්ධර්මාලංකාරයෙහි දූතිය ජයම්පතිකා වස්තුවේ එන කතාව මෙසේ කියන්නම්,

## දුගී පවුලක් දුන් දානය

එක්තරා දුගී පුරුෂයෙක් තමාගේ භාර්යාව සමඟ කමත්වල බොල්වී පොළමින්, පිදුරු සොලවමින් මහත් වූ දුකින් උත්සහයෙන් ජීවත් විය. තමන්ට මේ දුක ඇතිවූයේ තමන් පෙර සංසාරවල පින් නොකල නිසා බව සිතා සිටිමින්ම තමන් කසගින්නේ හෝ සිට කොහොමහරි භික්ෂුන් වහන්සේට දානයක් දිය යුතු බව සිතා ඒ දුගී පුරුෂයා තම බිරිඳ සමඟ තැන්තැන්වල ඇවිද සහල් සපයාගෙන බත් පිළියෙල කර පලා මාළුවක් සමඟ බත් ටික දානයක් ලෙසට අරගෙන භික්ෂූන් වහන්සේ වැඩවසන ආරාම සමීපයට ගොස් දන් ශාලාව තුළට යාමට ලැජ්ජාවෙන් තමන් විසින් ඉතාමත් මහන්සියෙන් දුකසේ සපයා සකසාගෙන ගිය දානය වැළදීම සඳහා භික්ෂූන් වහන්සේට කොසේ පිළිගන්වමු දැයි කනස්සල්ලෙන් යුතුව භික්ෂූන් වහනසේට පෙනෙන තෙක් මානයේ සිටගත්තේය. එසේ ලැජ්ජාවට පත්වූයේ තමන් ඉතා දුප්පත් බැවින් සම්පූර්ණයෙන් විලිවසා ගැනීමටවත් රෙදි කඩක් නොතිබීමෙන් අඩක් වසාගෙන සිටි බැවිණි.

එම දාන ශාලාවෙහි වැඩහුන් මහ තෙරුන් වහන්සේ රහත්තෙර නමක් විය. උන්වහන්සේ දුර සිටිනා දුප්පත් දෙමාල්ලන් දැක ඔවුන් කෙරෙහි අනුකම්පාවෙන් ඒ දෙදෙනා රැගෙන ආ බත් හා පලා මාළුව පිළිගෙන අනිත් තෙරුන් වහන්සේලාටද පිළිගන්වා තමන් වහන්සේද වැළඳූ සේක. දාන චේතනාව පිරිසිදු නම් එය වැඩි වටිනාකමකින් යුක්ත හෝ අඩු වටිනාකමකින් යුක්ත බව සැළකිල්ලට ගත යුතුද නැත.

## පටිග්ගාහක සම්පත්තිය

පටිග්ගාහක සම්පත්තිය නමින් හඳුන්වනු ලබන්නේ දානය ලබන අයගේ පිරිසිදු බවයි. ප්‍රතිග්‍රාහක ලාභයද එයයි. උසස් ගුණවත්, සිල්වත් පිරිසකට දෙන දානය මහත්ඵල මහානිශංස වන බවත් අදහස් කරයි. අප විසින් කවර පුද්ගලයෙකුට වුවත් දානයක් හැටියට දෙනවානම් එයින් අපට පිනක් අත්වෙනවා හැබැයි අප දානයක් දෙන්නේ සීලයෙන් ගුණයෙන් වැඩි අයටනම් පෙරට වඩා පිනක් අපට අත්වෙනවා.

"තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා එතෙසු දිනනාති මහප්ඵලානි" යනුවෙන් ප්‍රකාශ වන්නේ බුද්ධ ශ්‍රාවකයන්ට දෙන දානය මහත්ඵල ගෙන දෙන බවයි.

දන් දේන්නාවූ සැදැහැවතුන් විසින් ත්‍රිවිධ චේතනාවම සිරිසිදු කරගෙන සිල්වතුන් හැඳිනගෙන දුන් දානයෙත් එසේ හඳුනානොගෙන කාට හෝ දීමට සිතා දුන් දානයෙත් වෙනස එයින් ලැබෙන විපාකයන්ගේ වෙනස දක්වනු පිණිස අංකුර ඉන්දික කථා වස්තුව මෙසේ දක්වමි.

අප සර්වඥයන් වහන්සේ තව්තිසා දෙව් ලොවට වැඩ පාණ්ඩුකම්භල ශෛලාසනයෙහි වැඩ හිඳ දෙවියන්ට අභිදම් දේශනාව අරම්භකිරීමට සූදානම්වන මෙහොතෙහි අංකුර හා ඉන්දික නම් ඇති දිව්‍ය පුත්‍රයන් දෙදෙනා කල් ඇතිවම එහි පැමිණ බුදුරජාණන් වහන්සේගේ වම හා දකුණු දණ මඬල ලඟම වාඩි වූහ. බුදු රඳුන් ධර්ම දේශනාවට වැඩි බව ඇසූ දස දහසක් සක්වල දේවතාවෝ එහි රැස්වන්නට පටන්ගත්හ. මහානුභාව ඇති දෙවිවරු පැමිණෙන්නට පටන්ගත්හ. මහානුභාව ඇති දෙවිවරු ඔවුන්ට ඉඩ දීමෙන් පසු පසට ගියාහුය. අංකුර දිව්‍ය පුත්‍රයා දොළොස් යොදුනක් තැන් පසු බැස ගොස් නතර වූ අතර ඉන්දික දිව්‍ය පුත්‍රයා හුන් තැනින් මඳක් හෝ පසු නොබැස බුදුරඳුන්ගේ දණ මඬල ළඟම හුන්නේය.

එකල්හි බුදුරජාණන් වහනසේ මේ දෙදෙනාගේ පූර්ව චරිත දන්නා නිසා අංකුර දිව්‍ය පුත්‍රයා අමතා "අංකුර ඔබ දසදහසක් අවුරුදු පුරාම මුළු දඹදිවම යාචකයන්ට දන් දුන්නේ නොවේද? දැන් මේ දිව්‍ය සභාවට පැමිණ දොළොස් යෙදුනක් දුර හිඳින්නේ ඇයිද"යි විමසූ සේක. එකල්හී අංකුර තෙම කියනුයේ "ස්වාමීනි මම මුළු දඹසිව යාචකයන්ට දස දහසක් අවුරුදු පුරා දන් දුන්නත් එකම සිල්වතෙකුටවත් ඒ දානය නොලැබුණේය. මා ලද සුළු පිනෙන් මේ දිව්‍ය සම්පත් ලදිමි. එහෙත් මද ආනුභාව ඇති හෙයින් මෙසේ දොළොස් යොදුනක් දුර සිටිමි" කීය. එකල්හි බුදුරජාණන් වහන්සේ තමන් සමීපයෙහි හුන්නා වූ ඉන්දික අමතා "ඔබ කවර නම් පිනක් කොට මෙබඳු මහානුභාව දිව්‍ය සම්පත්තියක් ලැබුයෙහිද"යි විමසූ සේක.

"ස්වාමීනි මම පෙර දුගියෙකුව ඉපිද සිඟාගත් බත් හැන්ද අනුරුද්ධ මහා තෙරුන් වහන්සේට පූජා කළ පිනෙන් මෙබඳු මහානුභාව සම්පන්න දිව්‍ය සම්පත්තිය ලද හෙයින් ඔබ වහන්සේ ළඟම සිටියෙමි"යි පිළිතුරු දුන්නේය. බුදුරජාණන් වහන්සේ එබස් අසා "අංකුර ඔබ ඒ දුන් දානයට වඩා ඉන්දික දන්දුන් එක බත් හැන්ඳ අනුරුද්ධ තෙරුන්ට පූජා කළ හෙයින් මහත්ඵල ලැබූහ" වඳාළ සේක. ලබන කලාපයෙන් "පුද්ගලික දාන" ගැන සහ "සඟසතු දාන" පිළිබඳ සාකච්ඡා කරමු.

ලලිතා හෙට්ටිආරච්චි දේවභූව